වාර්ෂික වාර්තාව

2022



රණවිරු සේවා අධිකාරිය

ආරක්ෂක අමාත්‍යාංශය

රණවිරු සේවා අධිකාරිය

මානුෂීය මෙහෙයුමේ දී ජීවිත පූජා කරන ලද රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හා රණක්ෂිතයට පත් රණවිරුවන් හා පවුල් සාමාජිකයන්ට අවශ්‍ය සුභසාධනය සැලසීම වෙනුවෙන් 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් රණවිරු සේවා අධිකාරිය ස්ථාපිත කර ඇත.

රණවිරු සුභසාධනය වෙනුවෙන් ස්ථාපිත එක ම ව්‍යවස්ථාපිත ආයතනය වන රණවිරු සේවා අධිකාරිය දිවයින පුරා විසිරී සිටින රණවිරු ප්‍රජාව ඒකරාශී කර ඔවුන්ගේ සියලු කටයුතු වෙනුවෙන් මැදිහත් වන ප්‍රධානතම පාර්ශවකරුවෙකු වශයෙන් දශක දෙකකට අධික කාලයක් ස්වකීය මෙහෙවර ඉටු කරමින් පවතී.

දීප ව්‍යාප්ත රණවිරු ප්‍රජාව ඒකරාශී කරමින් ක්‍රියාත්මක වන රණවිරු සංසද ජාලය මගින් රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා සොයා බලා ඔවුන් වෙත අවශ්‍ය උපදේශනය, මූල්‍ය ආධාර, ණය පහසුකම් ලබා දීම රණවිරු සේවා අධිකාරිය මගින් සිදු කරනු ලබයි.

දශක තුනකට අධික කාලයක් පැවති කුරිරු යුද්ධයේ වින්දිතයන් වශයෙන් පශ්චාත් යුදමය ව්‍යසනකාරී තත්ත්වයෙන් පසුව විවිධ මනෝභාවයන්ට මුහුණ දුන් රණවිරු ප්‍රජාව ආර්ථික, සමාජයීය වශයෙන් බලගැන්වීමේ ජාතික මෙහෙවර ගත වූ පසුගිය දශක දෙක තුළ රණවිරු සේවා අධිකාරියට පැවරී තිබිණි. එම වගකීම උදාර සේවයක් බවට පත් කර ගනිමින් රණවිරු සේවා අධිකාරිය 2022 වසර අවසානය වන විට අති සාර්ථක සුභසාධන කාර්යයන් රැසක් ඉටු කිරීමට හැකියාවක් ලබා ඇත.

රට තුළ පැවති අර්බුදකාරී වාතාවරණය හමුවේ වුව ද රණවිරු ප්‍රජාව වෙත හැකි උපරිම ආකාරයේ ඉහළ ගුණාත්මක සේවාවක් සපයමින් රණවිරු නාමයට ලබා දිය යුතු ඉහළ ම ගරුත්වය ලබාදීමට රණවිරු සේවා අධිකාරිය ඉකුත් වසර 21 තුළ සමත් වී ඇති අතර ඉදිරියට ද ස්වකීය මෙහෙවර අඛණ්ඩව ඉටු කිරීමට අපේක්ෂා කෙරේ. එමෙන්ම රාජ්‍ය ආයතනයක් වශයෙන් රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා සොයා බලා ඒවාට කඩිනම් විසඳුම් ලබා දෙන අභිමානවත් ආයතනය වශයෙන් රණවිරු සේවා අධිකාරිය මේ දක්වා තම නාමය රණවිරු හදවත් තුළ සනිටුහන් කර ඇත.

1999 අංක 54 දරන පනත යටතේ රණවිරු සේවා අධිකාරියේ කාර්යභාරය

(අ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ පසු උවටැන සහ, ඔවුන් පුනරුත්ථාපනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම;

(ආ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

නිවාස සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඇ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගෙන් යැපෙන්නන්ට

වෛද්‍ය පහසුකම් සැපයීම සහ එහි ලා සහාය වීම ;

(ඈ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය හෝ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට,

ශිෂ්‍යත්ව සහ වෙනත් ආකාරයේ උපකාර ලබා දීමෙන් ඔවුන්ට අධ්‍යාපනයට හා උසස් අධ්‍යාපනයට ප්‍රවේශය ලබා ගැනීමට අවස්ථාව සලසා දීම;

(ඉ) (i) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට ; සහ

(ii) ක්‍රියාන්විතයේ දී මියගිය සහ සොයාගත නොහැකිව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ගේ යැපෙන්නන්ට;

ඵලදායී සේවානියුක්තියක් සුරක්ෂිත කිරීමෙහි ලා සහාය වීම;

(ඊ) ක්‍රියාන්විතයේ දී ආබාධිත බවට පත්ව සිටින සන්නද්ධ හමුදාවල සහ පොලිස් හමුදාවේ සාමාජිකයන්ට සේවා නියුක්තිය සැලසීමේ අරමුණ ඇතිව කාර්මික, කෘෂිකාර්මික හෝ වාණිජ ව්‍යවසායයන් පිහිටුවීම; සහ

(උ) අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම සඳහා අවශ්‍ය හෝ හිතකර සියලු ක්‍රියා හා දේ කිරීම.

දැක්ම

“රණවිරු නාමයට ජාතියේ කෘතගුණ දැක්වීම”

මෙහෙවර

“ශ්‍රී ලංකාවේ ඒකීයභාවය සුරක්ෂිත කරනු පිණිස ජීවිත පුද කළා වූ අතුරුදහන් වූ හා ආබාධිත වූ රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ගේ මානසික හා සාමාජයීය ස්ථාවරභාවයක් ඇති කිරීම මෙන් ම සේවයේ නියුතු රණවිරුවන් සහ එම පවුල්වල මානසික ප්‍රබෝධයක් ඇති වන අයුරින් ක්‍රියා කිරීම. ”

රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමන්ගේ පණිවුඩය



මාතෘ භූමියේ සුරක්ෂිතභාවය වෙනුවෙන් තම දිවි පරදුවට තබා රණබිමේ සටන් වැද ජීවිත පරිත්‍යාග කළ, වීරෝදාර රණවිරුවන් ඔවුනගේ ළඟම ඥාතීන් හා වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් හා එම පවුල්වල සාමාජිකයින්ගේ අවශ්‍යතාවන් හඳුනාගෙන ඒවා සපුරාලීම සඳහා 1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් රණවිරු සේවා අධිකාරිය පිහිටුවන ලදී.

පසුගිය 2022 වසර තුළ රණවිරු සේවා අධිකාරිය විවිධ බාධක මධ්‍යයේ වුව ද රණවිරු ප්‍රජාව වෙත ගුණාත්මක හා ඉහළ ඵලදායීතාවයකින් යුත් සේවාවක් ලබාදීම වෙනුවෙන් ආයතනයක් ලෙස ඉමහත් වෙහෙසක් දරන ලද වසරක් විය.

රටෙහි ඒ වනවිට පැවති වාතාවරණය මත 2022 වසර සඳහා මහා භාණ්ඩාගාරය මගින් රණවිරු සේවා අධිකාරිය වෙත ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු නොවූව ද ඒ වනවිට රණවිරු සේවා අධිකාරිය සතුව තිබූ මුදල් සංචිත මගින් හා ලොතරැයි පත් අලෙවියෙන් ලද ආදායම් තුළින් රණවිරු ප්‍රජාව රැකබලා ගැනීමට සිදු වූ වසරක් ලෙස 2022 වසර හැඳින්විය හැක. තව ද මෙම හේතුව මත අප ආයතනය මගින් ක්‍රියාත්මක කරගෙන ආ ඇතැම් ව්‍යාපෘතීන් පවා තාවකාලිකව නවතා දැමීමට සිදුවූ අතර අපගේ දෙස් විදෙස් පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මගින් නවතා දැමූ ඇතැම් ව්‍යාපෘතීන් නැවත ක්‍රියාත්මක කිරීමට හැකියාව ලැබිණි.

රණවිරු සුභසාධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම උදෙසා ප්‍රතිපාදන එක්රැස් කරගැනීමේ අරමුණින් රාජ්‍ය හා පුද්ගලික ආයතන දෙපාර්ශවයම එක් කරගත් වඩා විධිමත් වූ සාර්ථක වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කරගනිමින් රණවිරු කොඩි අලෙවිය සිදුකිරීමට මෙම වසරේ දී ක්‍රියාකරන ලදී.

2021 වසර තුළ ලද ප්‍රතිපාදන මගින් ප්‍රසම්පාදන කටයුතු සිදු කළ ද රටෙහි පැවති වාතාවරණයන් හමුවේ භාණ්ඩ ගෙන්වා ගැනීමට තිබූ අපහසුතා මත එතෙක් රණවිරු සේවා අධිකාරිය වෙත ලැබීම ප්‍රමාද වී තිබූ ආබාධිත සහායක උපකරණ, මෙම වසර තුළදී ලබා ගැනීමට අපහට හැකියාව ලද අතර අප විසින් එම උපකරණ රණවිරුවන්ගේ නිවෙස් වෙතටම ගොස් ඔවුන් වෙත ලබාදෙන ලදී.

මාපිය සුරැකුම් දීමනාව, විරු සහන නිවාස ණය යෝජනා ක්‍රමය, මාපිය සුරැකුම්, ස්වයං රැකියා ණය යෝජනා ක්‍රමය යන ආදී ව්‍යාපෘතීන් අවම ප්‍රතිපාදන මධ්‍යයේ වුව ද ඉදිරියට කරගෙන යෑමට අප ආයතනය විසින් පියවර ගන්නා ලදී. රණවිරු ප්‍රජාවේ කෘෂිකාර්මික දැනුම මෙන්ම කාබනික නිෂ්පාදනයේ ඇති වැදගත්කම පිළිබඳ ප්‍රායෝගික දැනුම වර්ධනය කරමින් එම ක්ෂේත්‍රයේ සාර්ථක ලෙස ඉදිරියට ගමන් කිරීමට ඇති හැකියාව පිළිබඳ කරුණු රණවිරු ප්‍රජාව වෙත අවබෝධ කරදීමට 2022 වර්ෂය තුළ දී අපට හැකි විය.

විවිධ අභියෝග හමුවේ වුව ද රණවිරු ප්‍රජාවේ සුභසාධන කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට 2022 වසරේ දී රණවිරු සේවා අධිකාරියට හැකියාව ලැබිණි. මෙම කටයුතු සාර්ථක කරගැනීමට සහය වූ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමන් ඇතුළු කාර්ය මණ්ඩලයටත්, රණවිරු සේවා අධිකාරියේ කාර්ය මණ්ඩලයටත් කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මාගේ කෘතඥතාව පුද කර සිටිමි.

මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වි යූඑස්පි එන්ඩියු
සභාපති
රණවිරු සේවා අධිකාරිය

අධ්‍යක්ෂ මණ්ඩලය

1.මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික)	-	සභාපති, රණවිරු සේවා අධිකාරිය
2. සෝනියා කෝට්ටෙගොඩ මහත්මිය	-	උප සභාපතිනිය - රණවිරු සේවා අධිකාරිය
3. ජයන්ත එදිරිසිංහ මහතා	-	අතිරේක ලේකම් (රාජ්‍ය ආරක්ෂක) රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය
4. එච්.ජී.ඩී.එම්. අලුත්වත්ත මහතා	-	නියෝජ්‍ය අධ්‍යක්ෂ - මුදල් අමාත්‍යාංශය
එච්.එම්.පී.සී කුමාරිහාමි මහත්මිය	-	අධ්‍යක්ෂ කළමණාකරණ විගණන - රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
එම්.ඩී.එන්.එස් ජයරත්න මහත්මිය	-	අධ්‍යක්ෂ රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව මුදල් අමාත්‍යාංශය
5.මේජර් ජෙනරල් එච්.එල්.වී.එම් ලියනගේ	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
මේජර් ජෙනරල් ජගත් කොඩිතුවක්කු	-	මාණ්ඩලික ප්‍රධානී, ශ්‍රී ලංකා යුද හමුදාව
6. රියර් අද්මිරාල් වයි.එන්. ජයරත්න	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
රියර් අද්මිරාල් ඒ. යූ.සී. ද සිල්වා	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
රියර් අද්මිරාල් යූ. වී. එම්. පී. පෙරේරා	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා නාවික හමුදාව
7. එයාර් වයිස් මාර්ෂල් එම්.ඩි.ඒ.පී පායෝ	-	මාණ්ඩලික ප්‍රධානී - ශ්‍රී ලංකා ගුවන් හමුදාව
8. නියෝජ්‍ය පොලිස්පති ඩබ්.ජේ. පත්මිණි	-	පොලිස් සුභසාධක හා වෛද්‍ය සේවා දිසාව ශ්‍රී ලංකා පොලිසිය
9. මේජර් ජෙනරල් ඩීඑම්එස් දිසානායක (විශ්‍රා)	-	පත්කළ සාමාජික
10. කණිෂ්ක ද සිල්වා මහතා	-	පත්කළ සාමාජික
11. ප්‍රජීවා අල්විස් මහත්මිය	-	පත්කළ සාමාජික

පටුන

01. රණක්ෂිතයට පත් රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන

1.1.හැඳින්වීම

1.2. රණක්ෂිතයටපත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන

1.2.1 රෝද පුටු ලබාදීම

1.2.2. අත්වාරු ලබාදීම

1.2.3. කිහිලිකරු ලබාදීම

1.2.4. කොමඩ් පුටු ලබාදීම

1.2.5. බස්තම් ලබාදීම

1.2.6. වායු මෙට්ට ලබාදීම

1.2.7. කෘත්‍රිම පාද ලබාදීම

1.2.8. ශ්‍රවණාධාර ලබාදීම

1.2.9. ඇස් කණ්නාඩි ලබාදීම

1.2.10. රෝහෝ කුෂන් ලබාදීම

1.2.11. සායනික සපත්තු ලබාදීම

1.2.12. කෘත්‍රිම අත් ලබාදීම

1.2.13.ජෙල් මේස් හා ජෙල් ලයිනර් ලබාදීම

1.3. පරිත්‍යාගශීලී ආධාර මගින් විදෘෂ්ත් ආරෝපිත යතුරු පැදියක් ලබාදීම

1.4. ඉන්දු ශ්‍රී ලංකා මිත්‍රත්වයෙන් රණවිරුවන් හට කෘත්‍රිම අත් පාද ලබාදීම

1.5.පළාත් හා දිස්ත්‍රික් වශයෙන් උපකරණ ලබාදීම

02. රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ නිවාසයන්හට සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1. හැඳින්වීම

2.2. සනීපාරක්ෂක ආධාර මුදල් ලබාදීමේ ක්‍රමවේදය

03.ක්‍රීඩා අංශය

3.1. හැඳින්වීම

3.2. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය

3.3. ක්‍රීඩා අංශය මගින් අත් කර ගත් ජයග්‍රහණ

3.3.1.ඉන්දියානු පැරා මළල ක්‍රීඩා තරගාවලියේ TF42 මීටර් 100 කාණ්ඩයෙන් රණවිරු සේවා අධිකාරියට ජාත්‍යන්තර ජයග්‍රහණයක් හිමිවීම

3.3.2. ජාතික පැරා මළල ක්‍රීඩා තරගාවලියේ TF42 මීටර් 100 කාණ්ඩයේ ශූරතාව හිමි කර ගැනීම

3.3.3. රණවිරු සේවා අධිකාරියට මේස පන්දු ජයග්‍රහණයක් හිමිවීම

3.4. ක්‍රීඩා අංශය මගින් සිදු කරන ලද පරිත්‍යාගයන්

3.4.1.ක්‍රීඩක අනිල් ප්‍රසන්න හට ශක්තිජනක පානයන් හා වෙනත් අවශ්‍යතා පිරිනැමීම

3.4.2. ඩී.එස්.අයි සමූහ ව්‍යාපාරය මගින් ක්‍රීඩා අනුග්‍රාහකත්වයක් පිරිනැමීම

3.4.3.රණවිරු සේවා අධිකාරියේ පිහිනුම් කණ්ඩායමේ ක්‍රීඩකයන් දිරි ගැන්වීම
3.4.5.රණවිරු දියණියකට අවශ්‍ය ශක්තිජනක පානයන් ලබාදීම
3.4.6. මෙස පන්දු ක්‍රීඩක ඩී.ටී.ටි අබේසිංහ රණවිරුවාහට ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීම

3.5. 2022 වර්ෂය තුළ ක්‍රීඩා හා ශක්තිජනක පානයන් ලබාදීම සඳහා වැය දැරීම

04. නිවාස, යටිතල පහසුකම් සුභසාධන හා ව්‍යවසාය සංවර්ධන මාපිය සුරැකුම් ණය අංශය

4.1. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය

4.1.1.විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය
4.1.2. 2022 වර්ෂය තුළ ඉදිරිපත් කළ නාම ලේඛන
4.1.3. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ පූර්ණ නිවාස සහ අර්ධ නිවාස සංඛ්‍යාව
4.1.4. 2022 වර්ෂය තුළ නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ප්‍රතිලාභීන් (දිස්ත්‍රික්ක වශයෙන්)
4.1.5. 2022 වර්ෂයේ විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් තෝරාගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව - සේවාවන් අනුව
4.1.5. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නිවාසවල ඡායාරූප

4.2. "විරු සහන" නිවාස ණය වැඩසටහන

4.2.1. සේවාවන් අනුව නිවාස ණය ලබාදීම
4.2.2. නිවාස ණය ලබා දීම 2021 - පළාත් හා දිස්ත්‍රික් අනුව

4.3. "රණවිරු දිරිය" ස්වයං රැකියා ණය ව්‍යාපෘතිය

4.3.1. අරමුණ හා හැඳින්වීම
4.3.2. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය
4.3.3.රණවිරු දිරිය ණය ලබාදීමේ ප්‍රගතිය දිස්ත්‍රික්ක අනුව

4.4. රණවිරු මාපිය සුරැකුම වැඩසටහන

4.4.1. රු.1500 බැගින් ගෙවීම
4.4.2. රු. 2250 බැගින් ගෙවීම
4.4.3. සම්පූර්ණ මුදල් බැර කිරීම

4.5. ඉඩම් අංශය

4.5.1. හැඳින්වීම
4.5.2. ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය
4.5.3. 2022 වසර තුළ කාර්ය සාධනය
4.5.3.1. බලංගොඩ ඉඩම්ලාභී රණවිරුවන් වෙත තෑගි ඔප්පු ප්‍රදානය කිරීම
4.5.3.2. රණවිරු පවුලක් සඳහා මීරිගමින් ඉඩම් ලබා දීම
4.5.3.3. වතුමුල්ල ඉඩම්ලාභී රණවිරු බිරිඳ වෙත තෑගි ඔප්පුව ප්‍රදානය කිරීම
4.5.3.4. මාලඹේ ඉඩම තාවකාලික බලපත්‍රයක් මගින් ආබාධිත රණවිරුවෙකු වෙත පරිත්‍යාග කිරීම

05. වෛද්‍ය ආධාර හා ණය ලබාදීම

5.1. වෛද්‍ය ආධාර ලබාදීම

5.2. වෛද්‍ය ණය ලබාදීම

5.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය

5.4. වෛද්‍ය ආධාර ප්‍රතිලාභ බෙදී යාම

5.4.1.. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

5.5.වෛද්‍ය ණය ප්‍රතිලාභ බෙදීයාම

5.5.1. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ණය ලබාදීම

06. අධ්‍යාපන ශිෂ්‍යත්ව හා තරුණ කටයුතු අංශය

6.1. අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

6.1.1. 6 – 11ශ්‍රේණිය දක්වා ශිෂ්‍යාධාර වැඩසටහන්

6.1.1.1. 2022 වර්ෂය තුළ දිස්ත්‍රික්ක හා පළාත් අනුව 11-6ශ්‍රේණිය දක්වා දක්වා ශිෂ්‍යත්ව බෙදීයාම

6.1.2. අ.පොෂ.ස උසස් පෙළ ශිෂ්‍යාධාර

6.1.2.1. 2022 වර්ෂය තුළ අ.පොෂ.ස උසස් පෙළ ශිෂ්‍යාධාර පිරිනැමීම

6.1.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

6.1.4. තෘතියික හා වෘත්තීය අධ්‍යාපන පාඨමාලා ආධාර වැඩසටහන

6.1.5. කුසලතා ප්‍රවර්ධන ණය ලබාදීම

6.1.6. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම

6.1.7. 2022 වසර තුළ සිදු කරන ලද වැඩසටහන්

6.1.7.1.අමරණීය සොල්දාදුවන් 32 කෘතියේ කතෘ ආදායමෙන් රණවිරු දියණියකට අධ්‍යාපනික අත්වැලක්

6.1.7.2."අමරණීය සොල්දාදුවන් 32" කෘතිය තවත් රණවිරු දරුවන් තිදෙනෙකුට අධ්‍යාපනික අත්වැලක්

6.1.7.3.සභාපතිතුමාගේ පුද්ගලික අනුග්‍රහයෙන් රණවිරු දරුවන් දෙදෙනෙකු ලැප්ටොප් යන්ත්‍ර දෙකක් පරිත්‍යාග කිරීම

6.1.7.4. බස්නාහිර පළාතේ විරු දරුවන් හට මුතුහරෙන් පාසල් උපකරණ පරිත්‍යාගයක්

6.1.8. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

6.1.8.1.හැදින්වීම හා අරමුණ

6.1.8.2. වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

6.1.8.3. දිස්ත්‍රික් අනුව 2022 වසර තුළ ශිෂ්‍යත්ව පිරිනැමීම - 2022

6.1.8.4. 2022 වර්ෂය තුළ එක් එක් මාසවල ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය

6.1.8.5. 2022 වර්ෂය තුළ ශිෂ්‍යාධාර ප්‍රදානය සඳහා මාසිකව දරන ලද පිරිවැය

6.1.8.6. ශිෂ්‍යාධාර ප්‍රදානය සඳහා පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය

6.1.8.7. 2022 වර්ෂය තුළ දී මා පිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද වෙනත් කාර්යයන්

07. පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය

7.1. හැඳින්වීම

7.2. හදිසි ආපදා ආධාර ලබා දීමේ වැඩසටහන

7.2.1. ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය

7.2.2. ස්වභාවික ආපදාවන්ට ලක් වූ රණවිරු පවුල් වෙත ආධාර ලබා දීම

7.2.3. හදිසි අභාවයන්ට ලක් වූ රණවිරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

7.3. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

7.3.1. දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන

7.4. හෙළවිරු සුව ධරණි සුව සායන වැඩමුළුව

7.4.1. ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය

7.4.1.1. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - ගම්පහ

7.4.1.2. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - බදුල්ල

7.4.1.3. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - නුවර එළිය

7.4.1.4. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - අනුරාධපුර

7.4.1.5. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - උඩුපිල

7.4.1.6. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - ගාල්ල

7.4.1.7. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - මාතලේ

7.4.1.8. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - අම්පාර

7.4.1.9. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - මාතර

7.4.1.10. හෙළ විරු සුව ධරණි සුව සායන වැඩමුළුව - පුත්තලම

08. රණවිරු අනුස්මරණ වැඩසටහන

8.1. හැඳින්වීම

8.2. ජාතික රණවිරු සැමරුම් මාසය ප්‍රකාශයට පත් කිරීම

8.3. ජාතික රණවිරු සැමරුම් දිනය

8.4. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

8.4.1.2022 වර්ෂය තුළ මයිලපිටිය උද්‍යානයේ නඩත්තු කටයුතු සිදු කිරීම

09. විශ්‍රාමික රණවිරු සුභසාධන අංශය

9.1. හැඳින්වීම

9.2. 2022 වසර තුළ කාර්ය සාධනය

9.2.1. මී මැසි පෙට්ටි ලබා දීම

9.3. 2022 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන්

9.3.1. මී මැසි පාලන පුහුණු වැඩසටහන - මාතලේ

9.3.2. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - පොළොන්නරුව

9.3.3. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික්කය (දියබෙදුම)

9.3.4. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - ඇඹිලිපිටිය

9.3.5. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - ඇහැලියගොඩ
9.3.6. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කය (කහවත්ත , නිවිතිගල)
9.3.7. 2022.03.11 වන දින කාබනික වී වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කය - ඇඹිලිපිටිය සංසදය
9.3.8. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - අනුරාධපුරය
9.3.9. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය
9.3.10. උහන රණවිරු සංසද සාමාජිකයන් සඳහා කාබනික වී ගොවිතැන පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ
9.3.11. කිරි ගව පාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව - අම්පාර දිස්ත්‍රික්කය
9.3.12. කාබනික ගොවිතැන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - නුවරඑළිය
9.3.13. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කය
9.3.14. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය (රත්නපුර නගරය)
9.3.15. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කය අලව්ව
9.3.16. සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පොල් පැළ 7000ක් රණවිරුවන් වෙත බෙදාදීම

10. මාපිය රැකවරණ ව්‍යාපෘතිය
10.1. හැඳින්වීම
10.2. වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය
10.2.1. දීමනාව සඳහා සුදුසුකම්
10.2.2. මාපිය රැකවරණ දීමනාව සඳහා අවශ්‍ය ලියකියවිලි
10.2.3.අනුමැතිය ලබා ගන්නා ආකාරය
10.3. 2022 වර්ෂය තුළ මුදල් බැර කිරීම
10.4. 2022 වර්ෂය තුළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව

11. විරුසර වරප්‍රසාද කාඩ්පත් අංශය
11.1. අරමුණ හා හැඳින්වීම
11.2. විරුසර කාඩ්පත් පිරිනැමීමේ අදියර
11.3. 2022 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය
11.4. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද පිරිනමන ආයතන
11.5. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද ලබාදෙනු ලබන/ ඉදිරියට පවත්වාගැනීම සඳහා මේ වනවිට ලිපි ඉදිරිපත් කර ඇති ආයතන
11.6. 2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති කාඩ්පත් ප්‍රමාණය

2022 වසර තුළ

ක්‍රියාත්මක කරන ලද

ව්‍යාපෘති

01

රණක්ෂිතයට පත් රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන

1.1. හැඳින්වීම

ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටිය දී රණක්ෂිතයට පත්ව වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගන්වන ලද රණවිරුවන් පුනරුත්ථාපනය සහ පසුඋවටැන් කිරීම හා රැකබලා ගැනීම රණවිරු සේවා අධිකාරිය මගින් ඉටු කරනු ලබන ප්‍රමුඛතම කාර්ය භාරයකි. රණක්ෂිතයට පත් රණවිරුවන් කායික, මානසික සහ සමාජීය වශයෙන් බල ගැන්වීම හා ඔවුන් අභිප්‍රේරණය කොට සමාජගත කරමින් ඔවුන්ගේ ජීවන තත්ත්වය වඩා උසස් මට්ටමකින් පවත්වා ගැනීමට අවැසි කටයුතු ඉටු කිරීම මෙම ව්‍යාපෘතීන් මගින් සිදු කරනු ලබයි.

1.2. රණක්ෂිතයට පත් රණවිරුවන් සඳහා සහායක උපකරණ ලබාදීමේ වැඩසටහන

ක්‍රියාන්විතයේ දී රණක්ෂිතයට පත් රණවිරුන්ගේ දැනට ඉතිරිව ඇති කාර්යම හැකියාව ඉහළ නැංවීම සඳහා සහාය වන සහායක උපකරණ දෛනික කටයුතුවල දී භාවිතා කරනු ලැබේ. රණවිරුවන්ගේ ආබාධිත තත්ත්වය මග හරවා ගැනීමට ඉවහල් වන දැනට භාවිතා කරනු ලබන උපකරණ තාක්ෂණික වශයෙන් ඉහළ ගුණාත්මක තත්ත්වයක පැවතීම රණවිරුවාගේ සෞඛ්‍ය තත්ත්වය යහපත් මට්ටමකින් පවත්වා ගෙන යාමට ඉවහල් වේ.

රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ දැනට ඉතිරිව ඇති කාර්යම හැකියාව ඉහළ නැංවීම සඳහා සහාය වන කෘත්‍රිම පාද, කෘත්‍රිම අත්, රෝද පුටු, අත්වාරු, කිහිළිකරු, උපැස්, සායනික සපත්තු, ශ්‍රවණ උපකරණ, සුදු සැරයටි, බස්තම්, කොමඩ් පුටු, රෝහෝ කුෂන්, වායු මෙට්ට, ජෙල් මේස්, ජෙල් ලයිනර්, විද්‍යුත් ආරෝපිත යතුරු පැදි සහ වෙනත් සහායක උපකරණ ලබාදීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරනු ලබයි.

රණක්ෂිතයට පත් රණවිරුවන් ප්‍රජා පුනරුත්ථාපන ක්‍රමවේදය යටතේ නිවෙස්ගත කර ඇති අතර ඔවුන්ගේ ආබාධිත තත්ත්වය සමග දෛනික කටයුතු සිදු කර ගැනීමේ දී ඇති වන අපහසුතාවන් මග හරවා ගැනීම සඳහා අවශ්‍ය සහයෝගයක් මෙම උපකරණ ලබාදීමෙන් සිදු කෙරේ. සහායක උපකරණ හුදෙක්ම තාක්ෂණික උපකරණයක් ලෙස නොව රණවිරුවාගේ ශරීරයේම කොටසක් ලෙසින් සැලකිය හැකිය. ඒ අනුව රණක්ෂිතයට පත් රණවිරුවාගේ අවශ්‍යතාවය පරිදි සහායක උපකරණ අඛණ්ඩව නොලැබීම සහ රණක්ෂිතයට පත් රණවිරුවන් ප්‍රශස්ත මට්ටමේ නොවන අබලන් වූ සහායක උපකරණ භාවිත කිරීම නිසා අතුරු ආබාධවලට ලක් වීම මග හැරීම උදෙසා අවශ්‍ය සහායක උපකරණ ලබා දීම මෙහි අරමුණයි.

මෙම ව්‍යාපෘතිය මගින් රණක්ෂිතයට පත් රණවිරුවා සෘජුවම කායිකව සහ මානසිකව බල ගැන්වීමක් සිදු කරන අතර මෙය වක්‍රාකාරයෙන් රණවිරු පවුල් සාමාජිකයන් සඳහා ද ධනාත්මක බලපෑමක් සිදු කරනු ලැබේ. මේ හරහා රණක්ෂිතයට පත් රණවිරුවන් හා ප්‍රජාව අතර සබඳතාවන් වර්ධනය කිරීම අරමුණු කෙරේ.

වර්ෂ 2022 සඳහා රණක්ෂිතයට පත් රණවිරුවන් උදෙසා සහායක උපකරණ මිල දී ගැනීම සඳහා මූල්‍යම ප්‍රතිපාදන වෙන් නොකෙරුණු බැවින් 2021 වර්ෂයේ දී මිල දී ගන්නා ලද සහායක උපකරණ රණවිරුවන් වෙත ලබා දීම 2022 වසරේ දී සිදු කරන ලදී.

මෙම සහායක උපකරණ නිෂ්පාදනය කිරීමේ දී රට තුළ පැවති වසංගත තත්ත්වය සෘණාත්මක ලෙස බලපෑම් කරන ලදී. එහි දී උපකරණ සැකසීම සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය හිඟතාවය, ඉන්ධන අර්බුදය හමුවේ ප්‍රවාහන පහසුකම්වල පැවති ගැටලු, ප්‍රවාහන ගාස්තුවල මිල ගණන් ශීඝ්‍රයෙන් ඉහළ යාම සහ සහායක උපකරණ ආනයනය කිරීම සඳහා ඉහළ තීරුබදු ගාස්තු ගෙවීමට සිදුවීම හේතුවෙන් නියමිත කාලයට උපකරණ ආනයන කර ගැනීමට නොහැකි වීම සහ උපකරණවල මිල ගණන් දැඩි ලෙස ඉහළ යාම මෙම ව්‍යාපෘති කටයුතු සිදුකර ගැනීමේ දී මතු වන ලද අභියෝගයන් වේ.


2021 වසරේ දී රණවිරු සේවා අධිකාරිය වෙත මහාභාණ්ඩාගාරය මගින් වෙන් කරන ලද මූල්‍යමය ප්‍රතිපාදන මගින් මිල දී ගන්නා ලද උපකරණ 2022 වසර තුළ දී රණවිරුවන් වෙත ලබා දීම සිදු කරන ලදී.

1.2.1. රෝද පුටු ලබාදීම

ආබාධිත සහායක උපකරණ ලබාදීමේ නිර්ණායක මත පදනම්ව 2021 වසරේ දී මිල දී ගත් රෝදපුටු අතරින් සාමාන්‍ය රෝදපුටු 329ක් සහ කොමඩ් රෝද පුටු 23 ක් රණවිරුවන් වෙත ලබා දෙන ලදී.

දැනට භාවිතා කරන රෝද පුටුව අබලන් (කැඩී බිඳී /ඉරී/තැලී/මල බැඳුණු) තත්ත්වයේ පවතින සහ රෝගාතුරවීමක් මත හදිසි අවශ්‍යතාවයක් (හදිසි සැත්කම්, අනතුරු, කායික දුබලතා) මතු වන ලද රණවිරුවන් වෙත 2021 වසරේ දී මිල දී ගත් සාමාන්‍ය රෝද පුටු 13ක් සහ කොමඩ් රෝදපුටු 2ක් සහ මෝටර්වේෂන් රෝදපුටු 80ක් ලබාදෙන ලදී.

දිස්ත්‍රික්ක වශයෙන් රෝදපුටු ලබාදීම







ක්‍රියාකාරී රෝද පුටුවල ගුණාත්මක භාවය විමසීමේ සහ බෙදා හැරීමේ සැලසුම් සකස් කිරීමේ අවස්ථාව

1.2.2. අත්වාරු ලබාදීම

2021 වසරේ දී මිල දී ගන්නා ලද අත්වාරු 1208ක් 2022 වසරේ දී රණවිරුවන් 604ක් වෙත ලබා දෙන ලදී .


අ. අ.	පළාත	අත්වාරු ප්‍රමාණය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	බස්නාහිර පළාත	**372**	**186**
2	දකුණු පළාත	**342**	**171**
3	මධ්‍යම පළාත	**630**	**315**
4	වයඹ පළාත	**536**	**268**
5	උතුරු මැද පළාත	**582**	**291**
6	ඌව පළාත	**246**	**123**
7	සබරගමුව පළාත	**332**	**166**
8	නැගෙනහිර පළාත	**168**	**84**
එකතුව		**3208**	**1604**



1.2.3. කිහිළිකරු ලබා දීම

2021 වසරේ දී මිල දී ගත් කිහිළිකරු යුගල 7ක් 2022 වසරේ දී රණවිරුවන් වෙත ලබා දෙන ලදී.

අ.අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	1
2	ගම්පහ	2
3	මාතර	1
4	හම්බන්තොට	1
5	මාතලේ	1
6	රත්නපුර	1



1.2.4. කොමඩ් පුටු ලබා දීම

රණක්ෂිතයට පත් රණවිරුවන් වෙනුවෙන් 2021දී මිල දී ගන්නා ලද කොමඩ් පුටු 09ක් 2022 වසරේ දී පිරිනමා ඇත.


අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	ගම්පහ	1
2	කුරුණෑගල	3
3	අනුරාධපුර	2
4	රත්නපුර	2
5	අම්පාර	1



1.2.5. බස්තම් ලබාදීම

2022 වර්ෂය තුළ දී රණවිරුවන් 96 දෙනකු සඳහා බස්තම් ලබා දෙන ලදී.


අ. අ.	පළාත	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	බස්නාහිර පළාත	23
2	දකුණු පළාත	11
3	මධ්‍යම පළාත	27
4	වයඹ පළාත	19
5	උතුරු මැද පළාත	26
6	ඌව පළාත	12
7	සබරගමුව පළාත	14
8	නැගෙනහිර පළාත	1



1.2.6. වායු මෙට්ට ලබා දීම

2022 වසරේ දී රණවිරුවන් සිවි දෙනකු සඳහා වායු මෙට්ට ලබා දෙන ලදී .

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කුරුණෑගල	1
2	අනුරාධපුර	2
3	පොළොන්නරුව	1




1.2.7. කෘත්‍රිම පාද ලබා දීම

2021 වර්ෂය සඳහා වෙන් වූ මූල්‍යමය ප්‍රතිපාදන මගින් කෘත්‍රිම පාද 664ක් මිල දී ගන්නා ලද අතර එම පාද අතරින් කෘත්‍රිම පාද 151 ක් පසුගිය වසරේ දී රණවිරුවන් වෙත ලබාදෙන ලදී. තව ද පරිත්‍යාගශීලී ආධාර මගින් කෘත්‍රිම පාද 03ක් රණවිරුවන් වෙත ලබා දෙන ලදී .

අ. අ.	දිස්ත්‍රික්කය	කෘත්‍රිම පාද ප්‍රමාණය
1	කොළඹ	24
2	ගම්පහ	33
3	කළුතර	29
4	ගාල්ල	19
5	මාතර	20
6	හම්බන්තොට	22
7	මහනුවර	47
8	මාතලේ	29
9	නුවරඑළිය	3

10	කුරුණෑගල	74
11	පුත්තලම	13
12	අනුරාධපුර	51
13	පොළොන්නරුව	19
14	බදුල්ල	11
15	මොණරාගල	19
16	රත්නපුර	35
17	කෑගල්ල	34
18	අම්පාර	29
19	මඩකලපුව	1
20	ත්‍රිකුණාමලය	4







කෘත්‍රිම පාද පරීක්ෂා කිරීම






1.2.8. ශ්‍රවණාධාර ලබා දීම

වර්ෂ 2021 දී මිල දී ගන්නා ලද ශ්‍රවණාධාර උපකරණ 86ක් 2022 වර්ෂය තුළ දී රණවිරුවන් 52කු වෙත ලබා දෙන ලදී.

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	1
2	ගම්පහ	5
3	කළුතර	6
4	ගාල්ල	2
5	මාතර	4
6	හම්බන්තොට	8
7	මහනුවර	4
8	මාතලේ	2
9	නුවරඑළිය	1
10	කුරුණෑගල	7
11	පුත්තලම	1
12	අනුරාධපුර	3
13	පොළොන්නරුව	1
14	බදුල්ල	1
15	කෑගල්ල	2
16	අම්පාර	2
17	ත්‍රිකුණාමලය	2








1.2.9. ඇස් කණ්ණාඩි ලබා දීම

වර්ෂ 2021 ලද මූල්‍ය ප්‍රතිපාදන මගින් රුපියල් මිලියන 1.37 ක මුදලක් වැය කර රණවිරුවන් 300 ක් සඳහා ඇස් කණ්ණාඩි ලබා දෙන ලදී.

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	24
2	ගම්පහ	50
3	කළුතර	17
4	ගාල්ල	8
5	මාතර	16
6	හම්බන්තොට	7
7	මහනුවර	25
8	මාතලේ	29
9	නුවරඑළිය	7
10	කුරුණෑගල	37
11	අනුරාධපුර	42


12	පොළොන්නරුව	14
13	රත්නපුර	9
14	කෑගල්ල	1
15	අම්පාර	10
16	මඩකලපුව	2
17	ත්‍රිකුණාමලය	2



1.2.10. රෝහෝ කුෂන් කවර ලබා දීම

2021 වසරේ දී ලද මූල්‍ය ප්‍රතිපාදන අනුව රුපියල් 720,000.00 ක් වටිනා රෝහෝ කුෂන් කවර 08ක් රණවිරුවන් වෙත ලබා දෙන ලදී. මෙම කුෂන් කවරය පූර්ණ ආබාධිත, රෝද පුටුවට සීමා වූ රණවිරුවන්ගේ සෞඛ්‍ය තත්ත්වයට සරිලන ලෙස සකසන ලද කුෂන් වර්ගයක් වන අතර දිගු කාලීනව හිඳගෙන සිටීම නිසා තුවාල ඇති වීම මග හරවා ගැනීමට ඉවහල් වේ.


අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	2
2	ගම්පහ	1
3	මාතලේ	1
4	කුරුණෑගල	2
5	අනුරාධපුර	1
6	මොණරාගල	1



1.2.11. සායනික සපත්තු ලබා දීම

2021 වසරේ දී ලද මූල්‍ය ප්‍රතිපාදන අනුව රුපියල් 925,000.00 ක් වටිනා සායනික සපත්තු 53ක් රණවිරුවන් වෙත ලබා දෙන ලදී.


අ.අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
1	කොළඹ	4
2	ගම්පහ	6
3	කළුතර	3
4	මාතර	2
5	හම්බන්තොට	2
6	මහනුවර	3
7	මාතලේ	2
8	නුවරඑළිය	6
9	කුරුණෑගල	8
10	අනුරාධපුර	1
11	පොළොන්නරුව	5
12	බදුල්ල	2
13	මොණරාගල	2
14	රත්නපුර	2
15	කෑගල්ල	3
16	අම්පාර	1
17	ත්‍රිකුණාමලය	1



1.2.12. කෘත්‍රිම අත් ලබාදීම

2021 වසරේ දී වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදන මගින් මිල දී ගත් රුපියල් 524,000.00ක් වටිනා වැලමිටින් පහළ විද්‍යුත් ක්‍රියාකාරී කෘත්‍රිම අත් 2022 වර්ෂය තුළ බෙදා දීම සිදුකරන ලදී.

අ. අ.	දිස්ත්‍රික්කය	විද්‍යුත් ක්‍රියාකාරී කෘත්‍රිම අත්	සාමාන්‍ය කෘත්‍රිම අත් වැලමිටින් පහළ	සාමාන්‍ය කෘත්‍රිම අත් වැලමිටින් ඉහළ
1	කොළඹ	1	-	-
2	ගම්පහ	1	1	1
3	ගාල්ල	-	-	2
4	මාතර	2	1	-
5	මහනුවර	4	2	
6	නුවරඑළිය	2	-	-
7	කුරුණෑගල	3	2	2
8	පුත්තලම	-	1	-
9	අනුරාධපුර	3	1	-
10	පොළොන්නරුව	1	-	-
11	රත්නපුර	1	-	-
12	කෑගල්ල	1	-	1


4.5
4
3.5
3
2.5
2
1.5
1
0.5
0
1
1 1 1
2 2
1
4
2
2
3
2 2
1
3
1
1
1
1 1
කොළඹ
ගම්පහ
ගාල්ල
මාතර
මහනුවර
නුවරඑළිය
කුරුණෑගල
පුත්තලම
අනුරාධපුර
පොළොන්නරුව
රත්නපුර
කෑගල්ල
විද්‍යුත් ක්‍රියාකාරී කෘත්‍රිම අත්
සාමාන්‍ය කෘත්‍රිම අත් වැලමිටින් පහළ
සාමාන්‍ය කෘත්‍රිම අත් වැලමිටින් ඉහළ










1.2.13. ජෙල් මේස් සහ ජෙල් ලයිනර් ලබා දීම

අ. අ.	දිස්ත්‍රික්කය	ජෙල් මේස්	ජෙල් ලයිනර්
1	කොළඹ	6	-
2	ගම්පහ	5	-
3	කළුතර	5	-
4	ගාල්ල	1	-
5	මාතර	3	-
6	හම්බන්තොට	8	-
7	මහනුවර	4	-
8	මාතලේ	4	-
9	කුරුණෑගල	15	1
10	අනුරාධපුර	1	1
11	පොළොන්නරුව	1	-
12	බදුල්ල	2	-
13	මොණරාගල	3	-
14	රත්නපුර	3	1
15	කෑගල්ල	8	-



1.3. පරිත්‍යාගශීලී ආධාර මගින් විද්‍යුත් ආරෝපිත යතුරු පැදියක් ලබා දීම

සාම්ප්‍රදායික පුනරුත්ථාපන ක්‍රමවේදයෙන් ඔබ්බට ගොස් රණවිරුවාට විවිධ අවස්ථාවන්හි සමාජ ක්‍රියාකාරකම් සඳහා සහභාගීවීමට ඇති සංචරණ අවස්ථා ඇති කිරීමට සහ සමාජ සහභාගීත්වයට ඇති අවහිරතාවය මග හැරීමට ඉවහල් වන නව පුනරුත්ථාපන ක්‍රමවේදයක් ලෙස ගරු සභාපතිතුමාගේ සංකල්පයක් මත විද්‍යුත් යතුරු පැදි ලබා දීමේ වැඩසටහනක් ආරම්භ කරන ලදී.

එම වැඩසටහනෙහි දිගුවක් වශයෙන් ප්‍රවීණ ලේඛකයෙකු හා බැංකුකරුවකු වන "අමරණීය සොල්දාදුවන් 32" කෘතියේ කර්තෘ ප්‍රසාද් පොල්වත්ත මහතා විසින් රණවිරුවන් උදෙසා සිදු කරන සුබ සාධන ව්‍යාපෘතීන් තවත් ඉදිරියට පියවරක් තබමින් රණක්ෂිතයට පත් රණවිරුවෙකු හට අවශ්‍ය නවීනතම විද්‍යුත් ආරෝපිත යතුරු පැදියක් ලබා දීම සඳහා මූල්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

ඒ අනුව පොළොන්නරුව දිස්ත්‍රික්කයේ හිඟුරක්ගොඩ රණවිරු සංසදයේ ජී.ඒ.එස්.චතුරංග රණවිරුවා වෙත විද්‍යුත් ආරෝපිත යතුරු පැදියක් පරිත්‍යාග කිරීම ප්‍රසාද් පොල්වත්ත මහතා ඇතුලු පවුලේ සාමාජිකයන්ගේ දායකත්වයෙන් සිදු කරන ලදී.





1.4. ඉන්දු ශ්‍රී ලංකා මිත්‍රත්වයෙන් රණවිරුවන් හට කෘත්‍රිම අත් පා ලබාදීමේ ජංගම වැඩසටහන

රණක්ෂිතයට පත් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් වෙනුවෙන් ඉන්දියානු රජයේ අනුග්‍රාහකත්වයෙන් ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලයේ මැදිහත්වීමෙන් ජායිපූර්හි භගවන් මහාවීර් සහායත සමිති විසින් ශ්‍රී ලංකාවේ 74 වන නිදහස් දිනයට සමගාමීව දින 37 ක් පුරා කෘත්‍රිම අත් සහ පාද සැකසීමේ ක්ෂේත්‍ර වැඩපළ ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය චමල් රාජපක්ෂ මැතිතුමන් සහ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් බග්ලේ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් 2022 පෙබරවාරි මස 02 වන දින රාගම රණවිරු සෙවණේ දී ආරම්භ කරන ලදී.

රණක්ෂිතයටපත් රණවිරුවන්ගේ සහ ළඟම ඥාතීන්ගේ සුබ සාධනය උදෙසා ආරක්ෂක අමාත්‍යාංශයේ උපදෙස් හා මග පෙන්වීම මත රණවිරු සේවා අධිකාරියේ පූර්ණ සම්බන්ධීකරණයෙන් ත්‍රිවිධ හමුදාව පොලිසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් දින 37 ක් පුරා රාගම රණවිරු සෙවණ - යුද හමුදා පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ දී මෙම වැඩසටහන පවත්වන ලදී. මෙම කෘත්‍රිම අත් සහ පාද සැකසීමේ ක්ෂේත්‍ර වැඩපළ මගින් රණක්ෂිතයට පත් ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන් 494කු සඳහා කෘත්‍රිම පාද 499 ක් සහ කෘත්‍රිම අත් 10ක් සකසා දෙන ලදී.

අ.අ.	විස්තරය		ප්‍රතිලාභීන් ප්‍රමාණය	කෘත්‍රිම පාද ප්‍රමාණය	කෘත්‍රිම අත් ප්‍රමාණය
1	සේවාව	යුද හමුදා	285	293	2
		නාවික හමුදා	17	17	
		ගුවන් හමුදා	33	32	1
		පොලිස්/ විශේෂ කාර්ය බලකාය	73	72	3
		සිවිල් ආරක්ෂක	7	7	

		දෙපාර්තමේන්තුව			
2	සිවිල්	රණවිරු ළඟම ඥාතියා	43	42	4
		සමාජ සේවා දෙපාර්තමේන්තුව	36	36	
එකතුව			**494**	**499**	**10**

මෙම වැඩපළෙහි කටයුතු සඳහා පැමිණි ජායිපූර්හි භගවන් මහාවීර් සහායත සමිතියට (ජයපූර් පූට්ස්) අයත් ඉන්දීය නියෝජිතයින් හත් දෙනකුගේ සේවය අගය කරමින් විශේෂ තිළිණ ප්‍රදානය කිරීමේ උත්සවයක් ද රාගම රණවිරු සෙවණේ දී පැවැත්වී ය. ඉන්දීය නියෝජිතයන්ගේ සේවය ඇගයීම් කිරීම රණවිරු සේවා අධිකාරියේ සභාපති ජෙනරල් නන්දන සේනාධීරගේ (විශ්‍රාමික) ආරාධනයෙන් ආරක්ෂක ලේකම් ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

මෙමගින් රණවිරු ප්‍රජාව මෙන්ම විශේෂ අවශ්‍යතා ඇති සිවිල් සමාජයේ ජන කොටස් හට ද නොමිලේ අත් පා නිෂ්පාදනය කර දීම සඳහා එක්දින සේවයක් පවත්වන ලදී. මෙම වැඩසටහනේ විශේෂ ආරාධිතයකු වශයෙන් ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා මහතා සහභාගි විය. මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරියේ උප සභාපති සෝනියා කෝට්ටෙගොඩ මහත්මිය, අධ්‍යක්ෂ, විශ්‍රාමික මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක සහ ශ්‍රී ලංකාවේ ඉන්දීය මහකොමසාරිස් කාර්යාලයේ ආරක්ෂක උපදේශක, කපිතාන් විකාශ් සූඩ්, ත්‍රිවිධ හමුදාවේ පොලීසියේ සහ ආරක්ෂක දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ඇතුළු රණවිරු පවුල්වල සාමාජිකයන් සහභාගි වන ලදී.















ජායිපූර් කෘත්‍රිම අත් පා සැකසීමේ වැඩසටහනෙහි විශේෂ අවස්ථාවන්

1.5. පළාත් හා දිස්ත්‍රික්ක වශයෙන් උපකරණ ලබාදීම

බස්නාහිර පළාත





කොළඹ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




ගම්පහ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




කළුතර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

වයඹ පළාත





කුරුණෑගල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





පුත්තලම දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

උතුරු මැද පළාත





අනුරාධපුර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

උව පළාත




බදුල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




මොණරාගල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

සබරගමුව පළාත





රත්නපුර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





කෑගල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

නැගෙනහිර පළාත





ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





අම්පාර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

දකුණු පළාත





මාතර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





හම්බන්තොට දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම




ගාල්ල දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

මධ්‍යම පළාත




මාතලේ දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





මහනුවර දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම





නුවරඑළිය දිස්ත්‍රික්කයේ රණවිරුවන්ට උපකරණ බෙදා දීම

02

රණක්ෂිතයට පත් රණවිරුවන්ගේ නිවාසයන්හි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

2.1. හැඳින්වීම

ක්‍රියාන්විත හේතූන් මත සිය ශරීරාංග කැප කරන ලද රණක්ෂිතයට පත් රණවිරුවන් කායිකව සහ මානසිකව සවිබල ගැන්වීම සඳහා අවශ්‍ය පහසුකම් සැපයීම රණවිරු සේවා අධිකාරියේ ප්‍රමුඛතම කාර්යභාරයකි.

ආබාධිත රණවිරුවාගේ ආබාධිතතාවයට සරිලන හා රණවිරුවන්ගේ භාවිතයට සුදුසු වන පරිදි සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය වී නොමැති බව ක්ෂේත්‍ර නිරීක්ෂණයන්වල දී හඳුනාගෙන ඇත. දෛනිකව සාමාන්‍ය වැසිකිළි පහසුකම් භාවිතා කිරීම හේතුවෙන් රණවිරුවාගේ කායික දුබලතාවයට සෘණාත්මක බලපෑමක් ඇති කරනු ලැබේ. ඒ අනුව ආබාධිත රණවිරුවන්ගේ ගෘහය තුළ පවතින වැසිකිලි පහසුකම් රණවිරුවාගේ වර්තමාන ආබාධිතතාවයට ගැළපෙන පරිදි අත්වැටක් සහිතව, රෝද පුටුවෙන් ප්‍රවේශ විය හැකි ආකාරයට අදාළව සකස් කර ගැනීම සඳහා පවතින අවශ්‍යතාවයන් කඩිනමින් හඳුනා ගනිමින් එම පහසුකම් සහිත නාන කාමරයක් සකස්කර දීම මෙම ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණ වේ.

මෙම අරමුණ ඉටුකර ගැනීම වෙනුවෙන් ආබාධිත රණවිරුවන්ගේ සනීපාරක්ෂක පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා ආබාධිත තත්ත්වයට උචිත පරිදි සෞඛ්‍යාරක්ෂිත නාන කාමරයක් ඉදි කර ගැනීම වෙනුවෙන් මූල්‍ය ආධාර පිරිනැමීම මෙම ව්‍යාපෘතිය යටතේ සිදු කරයි.


ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් වූ රණවිරුවන් සඳහා දැනට පවතින සනීපාරක්ෂක පහසුකම් සිය ආබාධිත තත්ත්වයට සරිලන පරිදි කොමඩ් පහසුකම් සහිතව ආබාධිතතාවයට උචිත ආධාරක උපකරණ සවිකරන ලද නාන කාමරයක් ලෙස ඉදිකිරීම සඳහා රු.100,000.00 ක මූල්‍ය ආධාරයක් ද, වසර 10 කට පෙර රණවිරු සේවා අධිකාරිය මගින් සනීපාරක්ෂක පහසුකම් සංවර්ධනය කරගැනීම සඳහා මූල්‍ය ආධාර ලබාදුන් රණවිරුවන් සඳහා අලුත්වැඩියා කටයුතු කරගැනීමට රු.50,000.00 ක මූල්‍ය ආධාරයක් ලබාදීම මේ යටතේ සිදු වේ.

2022 වර්ෂය සඳහා සනීපාරක්ෂක ආධාර මුදල් ලබාදීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදන වෙන් නොවුණු අතර 2022 වසර සඳහා රණවිරුවන් 195 දෙනකු විසින් ආධාර ඉල්ලීම් කර ඇත. රණක්ෂිතයටපත් රණවිරුවන් වයස්ගත වීම සහ නොයෙකුත් බෝ නොවන රෝගයන් හෝ හදිසි අනතුරුවලට ලක්වීම හේතුවෙන් වර්තමාන ශරීරයේ කාර්යමය හැකියාව විශ්‍රාම ගැන්වීමේ දී තිබූ ආබාධිතතත්ත්වයට වඩා වර්ධනය වී ඇති බව හඳුනාගත හැකිය. මෙම රණවිරුවන් හඳුනාගෙන කඩිනමින් මෙම පහසුකම් සැපයීම සිදු කළ යුතු අතර මෙම මූල්‍යමය ආධාර ලබා දීම සඳහා මූල්‍යමය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් මෙම ව්‍යාපෘති කටයුතු අඩාලවීමක් 2022 වසරේ දී සිදුවන ලදී.

2.2. ප්‍රතිලාභ ලබා දීමේ ක්‍රමවේදය

දිස්ත්‍රික්ක වශයෙන් අයදුම්පත් ලබාදීම → අයදුම්පතට අදාළව අඩුපාඩු ගෙන්වා ගැනීම සහ ගොනුව සම්පූර්ණ කර ගැනීම → නිර්ණායක මත පදනම්ව සම්පූරණ කරන ලද අයදුම්පත් කමිටුව වෙත යොමු කිරීම → කමිටු නිර්දේශය ලද අයදුම්පතට අදාළව රණවිරුවාගේ ගිණුමට මුදල් නිකුත් කිරීම → සනීපාරක්ෂක පහසුකම්හි ප්‍රගතිය පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකිරීම









03

ක්‍රීඩා අංශය

3.1. ව්‍යාපෘතිය හැඳින්වීම

ආබාධිත රණවිරුවන් කායික හා මානසික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ක්‍රීඩා වෙත යොමුකර ඔවුන්ගේ ක්‍රීඩා කෞශල්‍යයන් දියුණු කිරීම මෙන් ම රණවිරු දුවා දරුවන්ගේ ක්‍රීඩා කුසලතා දියුණු කිරීමට උපකාර කිරීම ක්‍රීඩා සංවර්ධන ව්‍යාපෘතියේ මුඛ්‍ය අරමුණ වේ.

තෝරාගත් ක්‍රීඩකයින් සඳහා වැඩමුළු/පුහුණු සැසි පැවැත්වීම, දේශීය හා විදේශීය ක්‍රීඩා තරග සඳහා යොමු කර ජයග්‍රහණ ලබා ගැනීමට දිරිමත් කිරීම හා ක්‍රීඩකයන්ට අවශ්‍ය ශක්තිජනක පාන වර්ග, ඇඳුම්, පාවහන් ආදිය හා ක්‍රීඩා උපකරණ ලබා දෙමින් ක්‍රීඩා කටයුතු දියුණු කිරීම සඳහා අවශ්‍ය සියලු පහසුකම් සලසා දීම ක්‍රීඩා අංශය මගින් සිදු කරනු ලබයි.

3.2. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය

අ.අ.	ක්‍රීඩකයාගේ නම	සහභාගි වන ක්‍රීඩාව	ක්‍රීඩාව වර්ගීකරණය	ආබාධිත තත්ත්වය/වර්ගය
1	වයි.පී. අනිල් ප්‍රසන්න ජයලත්	මලල ක්‍රීඩා	T/42/F42	දකුණු පාදය දණහිසෙන් නැවිය නොහැකි වීම
2	ඕ.ඒ. පුෂ්පකුමාර	මලල ක්‍රීඩා	F/T 44	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම
3	ඒ.එම්.ඒ. අත්තනායක	මලල ක්‍රීඩා	F46/47	දකුණු අත වැලමිටෙන් නැවිය නොහැකි වීම
4	ඩී. ප්‍රනාන්දු	බැඩ්මින්ටන්	SU 5	වම් අත වැලමිටෙන් අප්‍රාණික වීම
5	ජී.ආර්. චන්දිමාල්	බැඩ්මින්ටන්	SL 3	වම් කකුල වළලු කරට ඉදිරියෙන් කපා ඉවත් කර තිබීම
6	ඒම්.කේ.ඒ.ස්. පෙරේරා	බැඩ්මින්ටන්	SL 4	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම
7	එච්.ටී.ජී. ක්‍රිෂාන්ත	බැඩ්මින්ටන්	SU 5	වම් අත මැණික් කටුවට පහළින් අප්‍රාණික වීම
8	යූ.එන්.ඩී. කුමාරසිරි	පිහිනුම්	S 9	දකුණු පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
9	ආර්.ඩී.ඒ.එස්.එල්. දිසානායක	පිහිනුම්	S 8	දකුණු අත වැලමිටට පහළින් අප්‍රාණික වීම
10	ඩබ්.ඩී.ආර්.සී. මෙන්ඩිස්	පිහිනුම්	S 10	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම
11	ටී.එම්.එම්.පී.එම්. බංඩාර	දුනුවිදීම	A 4	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම
12	කේ.ඕ.පී.ඒ. නීල් ප්‍රේමරත්න	දුනු විදීම	A 4	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම
13	කේ.පී. දෙමටගේ	දුනු විදීම	A 4	වම්පාදයේ දණහිසෙන් පහළ ඉවත් කර තිබීම

14	ඩී.ටී.ටී. අබේසිංහ	මේස පන්දු	A 68	දකුණු අත වැලමිටට පහළින් ඉවත් කර තිබීම
15	ඩබ්.ඒ.ඒ. උදය පුෂ්ප කුමාර	Sitting වොලිබෝල්	A 4	දකුණු පාදය වළලුකරට පහළින් ඉවත් කර තිබීම
16	එම්. ජී. වික්‍රමරත්න	Sitting වොලිබෝල්	A 4	වම් පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
17	ඩී.එම්. කුලසුරිය	Sitting වොලිබෝල්	A 4	පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
18	කේ.ආර්.ආර්. චන්දන කුමාර	Sitting වොලිබෝල්	A 4	වම් පාදය අප්‍රාණික වීම
19	ඩී.පී.කේ. සෝමසේකර	Sitting වොලිබෝල්	A 4	වම් පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
20	ජී.එල්.ඒ.එම්. ගුණසේකර	Sitting වොලිබෝල්	A 4	වම් පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
21	ඩබ්.එම්. ජයවීර කුමාරතුංග	Sitting වොලිබෝල්	A 4	වම් පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
22	එස්.පී. අජන්ත බංඩාර	Sitting වොලිබෝල්	A 4	දකුණු පාදය දණහිසට පහළින් ඉවත් කර තිබීම
23	ඩබ්එන්ජේ ප්‍රනාන්දු	වායු රයිෆල්	SH2	ශරීරයේ තුනටියට පහළින් අප්‍රාණික වීම

3.3. ක්‍රීඩා අංශය මගින් අත්පත් කර ගත් ජයග්‍රහණ

3.3.1. ඉන්දියානු පැරා මළල ක්‍රීඩා තරගාවලියේ TF42 මීටර් 100 කාණ්ඩයෙන් රණවිරු සේවා අධිකාරියට ජාත්‍යන්තර ජයග්‍රහණයක් හිමි වීම

2022.08.02 දින ඉන්දියාවේ බැංගලෝර්හිදී පවත්වන ලද හතරවන ඉන්දියානු ජාත්‍යන්තර පැරා (para) මළල ක්‍රීඩා තරගාවලිය සඳහා ශ්‍රී ලංකා ජාතික කණ්ඩායම නියෝජනය කරමින් සහභාගී වූ රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිත සාමාජික රණවිරු අනිල් ප්‍රසන්න ජයලත් විසින් TF42 කාණ්ඩයේ මීටර් 100 ඉසව්ව තත්පර 12.95 ක කාලයකින් නිම කර දෙවන ස්ථානය දිනා රිදී පදක්කම හිමි කර ගන්නා ලදී.







3.3.2. ජාතික පැරා මළල ක්‍රීඩා තරගාවලියේ TF42 මීටර් 100 කාණ්ඩයේ ශූරතාව හිමි කර ගැනීම

කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගනයේදී 2022.06.08 වන දින පවත්වන ලද ජාතික පැරා මළල ක්‍රීඩා තරගාවලිය - 2022 සඳහා රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරමින් තරග වැදුණු රණවිරු අනිල් ප්‍රසන්න ජයලත් විසින් TF42 කාණ්ඩය මීටර් 100 ඉසව්වේ ප්‍රථම ස්ථානය ලබා ගනිමින් එම ඉසව්වේ ශූරතාව හිමි කර ගැනීමට සමත් විය.





3.3.3. රණවිරු සේවා අධිකාරියට මේස පන්දු ජයග්‍රහණයක් හිමි වීම

2022.03.12 වන දින විජයබාහු පාබල රෙජිමේන්තු ගෘහස්ථ ක්‍රීඩාගාරයේ පැවති 2022 ආසියානු පැරා මේස පන්දු තේරීම් තරගාවලිය සඳහා රණවිරු සේවා අධිකාරියේ මේස පන්දු සංචිතය නියෝජනය කරමින් සුදුසුකම් ලැබීමේ තරගයට සහභාගි වූ රණක්ෂිතයට පත් සෙ/483074 කෝප්‍රල් අබේසිංහ ඩීටීටී A6/8 තරග කාණ්ඩයේ ප්‍රථම ස්ථානය හිමිකර ගන්නා ලදි.





3.4. ක්‍රීඩා අංශය මගින් සිදු කරන ලද පරිත්‍යාගයන්

3.4.1. ක්‍රීඩක අනිල් ප්‍රසන්නට ශක්තිජනක පානයන් හා වෙනත් අවශ්‍යතා පිරිනැමීම

රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා කණ්ඩායම නියෝජනය කරමින් T42 /F42 මීටර් 100 කාණ්ඩයෙන් තරග වදින රණවිරු අනිල් ප්‍රසන්න ජයලත්ට ශක්තිජනක පානයන් හා ක්‍රීඩා ඇඳුම් පිරිනැමීම රණවිරු සේවා අධිකාරියේ දී සිදු විය. අනිල් ප්‍රසන්න මහතාගේ ඉදිරි ක්‍රීඩා කටයුතු සඳහා අවැසි මූලික අවශ්‍යතා පිළිබඳ සුහද සාකච්ඡාවක් ද මීට සමගාමීව පැවැත්විණි.

මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතා, රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක(විශ්‍රාමික) මහතා, ක්‍රීඩා අංශභාර නිලධාරී මේජර් හිනිදුමගේ චන්දන මහතා සහ ක්‍රීඩක අනිල් ප්‍රසන්න මහතා සහභාගී විය.




3.4.2. ඩී.එස්.අයි සමූහ ව්‍යාපාරය මගින් ක්‍රීඩා අනුග්‍රාහකත්වයක් පිරිනැමීම

ඕස්ට්‍රේලියාවේ සිඩ්නි නුවරදී ඉදිරියේ දී පැවැත්වීමට නියමිත ජාතික මළල ක්‍රීඩා තරගාවලිය සඳහා සුදුසුකම් ලබා ඇති රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරන විශ්‍රාමික සැරයන් මේජර් අනිල් ප්‍රසන්න ජයලත් රණවිරුවාට අවශ්‍යව පැවති ක්‍රීඩා පාවහන් යුගලයක් පරිත්‍යාග කිරීම 2022.08.05 වන දින රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කෙරිණි.

රණවිරු සේවා අධිකාරියේ මාපිය කැපකරු අංශ ප්‍රධානී ටුලානි දේවමිත්ත මහත්මියගේ සම්බන්ධීකරණයෙන් ඩී.එස්.අයි සමූහ ව්‍යාපාරයේ කළමනාකරණ අධ්‍යක්ෂ තුසිත රාජපක්ෂ මහතා විසින් මෙම පාවහන් යුගලය සඳහා අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.



3.4.3. රණවිරු සේවා අධිකාරියේ පිහිනුම් කණ්ඩායමේ ක්‍රීඩකයන් දිරි ගැන්වීම

2022 ආසියානු පැරා පිහිනුම් තේරීම් ක්‍රීඩා තරගාවලියට රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරමින් සහභාගි වූ ක්‍රීඩා කණ්ඩායමේ ක්‍රීඩකයින්ට අවශ්‍ය පිහිනුම් ක්‍රීඩා උපකරණ බෙදා දීම රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් 2022.06.10 වන දින සිදු කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක (විශ්‍රාමික) මහතා, සභාපතිතුමන්ගේ ලේකම් බ්‍රිගේඩියර් රෝෂන් තිරිමාන්න මහතා, ක්‍රීඩා සංචිතය භාර නිලධාරී මේජර් හිනිදුමගේ චන්දන මහතා සහ පිහිනුම් ක්‍රීඩකයන් මෙම අවස්ථාවට සහභාගි විය.





3.4.5. රණවිරු දියණියකට අවශ්‍ය ශක්තිජනක පානයන් ලබා දීම

1998 වර්ෂයේ සැප්තැම්බර් මස 27 වැනි දින කිලිනොච්චි ප්‍රදේශයේ ත්‍රස්තවාදී ප්‍රහාරයකට ගොදුරු වීමෙන් මිය ගිය යුද හමුදාවේ සෙ/408397 ලා/කෝප්‍රල් එච්.ඒ. පෙරේරා මහතාගේ දියණිය වන එච්. ඒ. තාරකා සඳරේණු පෙරේරා කාය වර්ධන ක්‍රීඩාවේ නිරත වන අතර ඇයගේ ක්‍රීඩා අවශ්‍යතාවයන් සඳහා අනුග්‍රාහකත්වයක් ලබා දෙන ලෙස රණවිරු සේවා අධිකාරියෙන් කරන ලද ඉල්ලීමට අනුව ඇයට අවශ්‍ය ශක්ති ජනක පානයන් 2022.08.16 වන දින පිරිනමන ලදී.

මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතා, රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක(විශ්‍රාමික) මහතා, ක්‍රීඩා අංශභාර නිලධාරී මේජර් හිනිදුමගේ චන්දන මහතා සහ කළුතර දිස්ත්‍රික්කයේ වැඩසටහන් නිලධාරී ගයේෂි ලක්ෂිකා මෙනවිය සහභාගී විය.





3.4.6. මෙස පන්දු ක්‍රීඩක ඩී.ටී.ටි අබේසිංහ රණවිරුවාට ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීම

රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරන මෙස පන්දු ක්‍රීඩක ඩී.ටී.ටි අබේසිංහ රණවිරුවා හට මෙස පන්දු ක්‍රීඩාව සඳහා අවශ්‍ය ක්‍රීඩා භාණ්ඩ පිරිනැමීම රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් 2022.03.09 වන දින රණවිරු සේවා අධිකාරියේ දී පැවැත්විණි. රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් A6/8 කාණ්ඩයෙන් පැරා මෙස පන්දු ක්‍රීඩාවේ නිරතවන රණක්ෂිතයට පත් ඩී.ටී.ටි අබේසිංහ රණවිරුවාගේ කුසලතා වර්ධනය කර ගනිමින් මනා මානසික ශක්තියකින් යුතුව තරඟ වැදීමට අවශ්‍ය පරිසරය නිර්මාණය කිරීමේ අරමුණින් මෙම ක්‍රීඩා භාණ්ඩ බෙදා දීම සිදු කරන ලදී.

මෙම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතා, රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක(විශ්‍රාමික) මහතා, ක්‍රීඩා අංශභාර නිලධාරී මේජර් හිනිදුමගේ චන්දන මහතා සහ ක්‍රීඩක ඩී.ටී.ටි අබේසිංහ මහතා සහභාගී විය.





3.5. 2022 වර්ෂය තුළ ක්‍රීඩා හා ශක්තිජනක පානයන් ලබා දීම සඳහා වැය දැරීම

අ. අ.	ප්‍රතිලාභය	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	වැය දැරීම (රු)
1	ක්‍රීඩා භාණ්ඩ/ ශක්ති ජනක පානයන් මිලදී ගැනීම	අම්පාර	1	18,8000.00
2		කොළඹ	1	5,160.00
3		කළුතර	1	72,000.00
4		ගාල්ල	2	33,000.00
එකතුව			5	298,360.00





04

නිවාස, යටිතල පහසුකම් සුභසාධන ව්‍යවසාය සංවර්ධන මාපිය සුරැකුම් හා ණය අංශය

4.1. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය

ආරක්ෂක අමාත්‍යාංශය යටතේ ඇති රණවිරු සේවා අධිකාරිය හා ජාතික නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය ඒකාබද්ධව ක්‍රියාත්මක කරනු ලබන ‘‘විරු සුමිතුරු’’ ජාතික නිවාස ව්‍යාපෘතිය 2017 වර්ෂයෙන් ආරම්භව 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ව්‍යයාපෘතියකි. ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් සහ ක්‍රියාන්විත රාජකාරියේ දී ත්‍රස්තවාදී ප්‍රහාරවලට ලක්ව ආබාධිත තත්ත්වයට පත්ව, ඒ හේතුවෙන් විශ්‍රාම ගන්වන ලද ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතාවය සම්පූර්ණ කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ඇත.

ත්‍රිවිධ හමුදාව සහ පොලිසිය යන සන්නද්ධ හමුදාවල ක්‍රියාන්විත ප්‍රදේශයන්හි රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව දිවි පිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතියාට සහ ක්‍රියාන්විත ප්‍රදේශවල රාජකාරි කරමින් සිටිය දී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට ලක්ව ආබාධිත තත්ත්වයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්ගේ නිවාස අවශ්‍යතා සම්පූර්ණ කිරීම වෙනුවෙන් සහාය සැලසීම, රණවිරුවන් විසින් සිදු කරන ලද සේවය ඇගයීම හා ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන්ට රජයෙන් හා ජනතාවගෙන් ඉටුවිය යුතු යුතුකම් ඉටු කිරීම හා රණවිරුවන්ගේ නිවාස ඉදිකිරීමේ සහ සම්පූර්ණ කිරීමේ ගැටලුවට රජය මැදිහත් වීම තුළින් තිරසාර ජාතික විසඳුමක් ලබා දීම යන අරමුණු ඉටු කිරීම වෙනුවෙන් විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය නිර්මාණය වී තිබේ.

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා වසර 6 ක කාලයක් තුළ පූර්ණ නිවාස 450ක් හා අර්ධ නිවාස 4000ක් ඉදි කර අවසන් කිරීමට සැලසුම් කර ඇති අතර, ව්‍යාපෘතියේ සමස්ත පිරිවැය රුපියල් මිලියන 3192 කි. පූර්ණ නිවාස සඳහා රුපියල් 1,200,000.00ක මුදලක් සමග ශ්‍රම දායකත්වය ද, අර්ධ නිවාස සඳහා රුපියල් 500,000.00 ක මුදලක් ද ලබා දීම සිදු කෙරේ. නිවාස අවශ්‍යතාව ඇති රණවිරුවන් තෝරාගැනීම රණවිරු සේවා අධිකාරියෙන් සිදුවන අතර ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ප්‍රතිලාභීන්හට මුදල් ලබා දීම සිදු කරනු ලබයි.

4.1.1. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය සඳහා රණවිරු සේවා අධිකාරියෙහි කාර්යභාරය

විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය රණවිරු සේවා අධිකාරිය සහ නිවාස සංවර්ධන අධිකාරිය හා එක්ව ක්‍රියාත්මක කරන ව්‍යාපෘතියකි. රණවිරු සේවා අධිකාරිය සතු ප්‍රධාන වගකීම වන්නේ සුදුසු ප්‍රතිලාභීන් තෝරා නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කිරීමයි.

ප්‍රාදේශීය මට්ටමින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම සිදු කරන අතර ලියකියවිලි සම්පූර්ණ වූ අයදුම්පත් සඳහා රණවිරු සංසද නිලධාරී, ග්‍රාම නිලධාරී නිර්දේශය , ප්‍රාදේශීය ලේකම් නිර්දේශය සහ දිස්ත්‍රික් හා පළාත් නිලධාරීන් නිර්දේශය ලබා දීමෙන් අනතුරුව ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කිරීම සිදු කෙරේ.

සම්පූර්ණ වූ අයදුම්පත් රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂතුමාගේ ප්‍රධානත්වයෙන් පත් කරන ලද කමිටුව වෙත ඉදිරිපත් කර, කමිටු නිර්දේශ ලබා නිෂ්කාශන වාර්තා ලබාගැනීම සඳහා ත්‍රිවිධ හමුදාව හා පොලීසිය වෙත යැවීම සිදු කෙරේ. නිෂ්කාශන ලැබීමෙන් අනතුරුව සභාපතිතුමාගේ අනුමැතියෙන් පසු ආධාර මුදල් ලබා දීම සඳහා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත නාම ලේඛනයක් මගින් ඉදිරිපත් කරයි.


ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් වාරික 4 කින් ප්‍රතිලාභීන්ට ගෙවීම් කටයුතු කරනු ලැබේ. පූර්ණ නිවාස සඳහා ශ්‍රම දායකත්වය ලබා දීම රණවිරු සේවා අධිකාරිය මැදිහත්ව ත්‍රිවිධ හමුදා වෙතින් ලබාදීම සිදු කරන අතර අවශ්‍ය වූ විට සැලැස්ම වෙනස් කිරීමට ද නිර්ණායකයන්ට යටත්ව අවසර ලබා දෙයි.

4.1.2. 2022 වර්ෂය තුළ ඉදිරිපත් කළ නාම ලේඛන

අ.අ.	වර්ෂය	ලේඛනය	පූර්ණ නිවාස	අර්ධ නිවාස	එකතුව
1	2022	14 වන ලේඛනය	12	155	167
2		15 වන ලේඛනය	11	149	160
	මුළු එකතුව		**23**	**304**	**327**

4.1.3. විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් 2017 වර්ෂයේ සිට 2022 වර්ෂය දක්වා ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ඉදිරිපත් කළ පූර්ණ නිවාස සහ අර්ධ නිවාස සංඛ්‍යාව


අ.අ.	වර්ෂය	පූර්ණ නිවාස	අර්ධ නිවාස
1	2017	203	52
2	2018	106	1162
3	2019	25	741
4	2020	12	499
5	2021	29	121
6	2022	23	304
එකතුව		**398**	**2879**



4.1.4. 2022 වර්ෂය තුළ නිවාස සංවර්ධන අධිකාරිය වෙත යොමු කරන ලද ප්‍රතිලාභීන් (දිස්ත්‍රික්ක වශයෙන්)


අ.අ.	දිස්ත්‍රික්කය	පූර්ණ නිවාස	අර්ධ නිවාස	එකතුව
1	කොළඹ	2	3	5
2	කළුතර	3	3	6
3	ගම්පහ	-	1	1
4	මහනුවර	-	10	10
5	මාතලේ	3	37	40
6	නුවරඑළිය	-	4	4
7	පුත්තලම	2	-	2
8	කුරුණෑගල	3	15	18
9	අනුරාධපුරය	1	75	76
10	පොළොන්නරුව	-	2	2
11	රත්නපුර	-	17	17
12	කෑගල්ල	-	14	14
13	මාතර	1	8	9
14	ගාල්ල	-	24	24
15	හම්බන්තොට	1	29	30

16	බදුල්ල	-	4	4
17	මොණරාගල	1	15	16
18	අම්පාර	5	28	33
19	ත්‍රිකුණාමලය	1	14	15
20	වව්නියාව	-	1	1
	මුළු එකතුව	**23**	**304**	**327**



4.1.5. 2022 වර්ෂයේ විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය මගින් තෝරා ගත් ප්‍රතිලාභීන් සංඛ්‍යාව (සේවාවන් අනුව)

අ.අ	සේවාව	පූර්ණ නිවාස	අර්ධ නිවාස	එකතුව
1	යුද	18	266	284
2	නාවික	1	10	11
3	ගුවන්	-	2	2
4	පොලිස්	4	26	30
5	**මුළු එකතුව**	**23**	**304**	**327**



4.1.6. විරු සුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ ඉදි කරන ලද නිවාසවල ඡායාරූප

4.2. "විරු සහන" නිවාස ණය ව්‍යාපෘතිය

රණවිරු සංසදවල සිටින රණවිරු පවුල්වල සාමාජික සාමාජිකාවන්ගේ නිවසක් ගොඩනගා ගැනීමේ සිහිනය සැබෑ කිරීමේ අරමුණින් යුතුව සහනදායී පදනමක් මත සේවා ගාස්තුවක් පමණක් අයකරමින් රණවිරු සේවා අධිකාරිය විසින් "විරු සහන නිවාස ණය ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කර ඇත. ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතාවය මත නව නිවසක් ඉදි කිරීම, නිවාස වැඩි දියුණු කර ගැනීම හා නිවාස අලුත්වැඩියා කර ගැනීම වෙනුවෙන් විරු සහන ණය ව්‍යාපෘතිය මගින් උපරිමය එක් අයෙකුට රුපියල් 1,000,000.00ක ණය මුදල් ලබා දෙන ලදී. 2022 වර්ෂයේ ඇති වූ ප්‍රතිපාදන ඌණතාවය හේතුවෙන් උපරිම ණය මුදල රුපියල් 500,000.00 දක්වා අවම කර ඇත.


මෙම වැඩසටහන මගින් 2022 වසරේ දී ආබාධිත රණවිරුවන් 77දෙනෙකු හා රණවිරු ඥාතීන් 33දෙනෙකු වශයෙන් ප්‍රතිලාභීන් 110 දෙනෙකු සඳහා නිවාස ණය ලබා දෙමින් සාර්ථක ප්‍රගතියක් අත් කර ගෙන ඇත.







4.2.1. සේවාවන් අනුව විරු සහන නිවාස ණය ලබාදීම 2022

අ.අ.	සේවාව	ප්‍රමාණය
1	යුද	100
2	නාවික	03
3	ගුවන්	03
4	පොලිස්	04
එකතුව		110



4.2.2. පළාත් හා දිස්ත්‍රික්ක අනුව විරු සහන නිවාස ණය ලබා දීම - 2022

අ.අ.	පළාත	දිස්ත්‍රිකය	ණය මුදල					දිස්ත්‍රික්කය තුළ ප්‍රතිලාභීන් ගණන	පළාත තුළ සමස්ත ප්‍රතිලාභීන් ගණන
			200,000	300,000	350,000	400,000	500,000		
1	බස්නාහිර	කොළඹ	-	-	-	-	9	9	24
		ගම්පහ	1	-	-	-	9	10	
		කළුතර	-	-	-	-	5	5	
2	මධ්‍යම	මහනුවර	-	1	-	-	2	3	18
		මාතලේ	-	1	-	1	10	12	
		නුවරඑළිය	-	1	-	-	2	3	
3	දකුණ	ගාල්ල	-	-	-	-	5	5	11
		මාතර	-	-	-	-	5	5	
		හම්බන්තොට	-	-	1	-		1	
4	ඌව	මොණරාගල	-	-	-	-	5	5	10
		බදුල්ල	-	-	-	-	5	5	
5	සබරගමුව	රත්නපුර	-	-	-	-	13	13	16
		කෑගල්ල	-	-	-		3	3	
6	නැගෙනහිර	අම්පාර	-		-	-	2	2	2
7	වයඹ	පුත්තලම	1	-	-	-	1	2	15
		කුරුණෑගල	-	2	-	-	11	13	
8	උතුරු මැද	අනුරාධපුර	-	-	-	-	6	6	14
		පොළොන්නරුව	-	-	-	-	8	8	
එකතුව			**2**	**5**	**1**	**1**	**101**	**110**	**110**











4.3. රණවිරු දිරිය ස්වයං රැකියා ණය

4.3.1. අරමුණ

රටේ සම්පත් රට තුළ ම ඉතිරි කරමින් දේශීය ව්‍යවසායකයා ශක්තිමත් කරන ආර්ථික සංකල්පය යටතේ ආබාධිත රණවිරුවන් සහ ක්‍රියාන්විතයේදී මියගිය රණවිරුවන්ගේ ළඟම ඥාතීන් තුළ ආකල්පමය වෙනසක් ඇති කර එමගින් කුසලතාවයෙන් යුතු ව්‍යවසායකයින් පිරිසක් බවට පත් කිරීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ .

රණවිරු පවුල්වල සාමාජිකයින්ගේ සහජ දක්ෂතා පදනම්ව, පුහුණු අවශ්‍යතා හඳුනා ගනිමින් ස්වයං රැකියා සඳහා දිරිමත් කිරීම, කෘෂි අපනයනික බෝග වගාව හා කිරි ගොවිතැන හඳුන්වාදෙමින් රණවිරු

පවුල්වල සාමාජිකයන්ගේ සකසුරුවම් බව වර්ධනය කිරීම, ඉතිරි කිරීම් වර්ධනය කිරීම තුළින් රටේ ආර්ථිකයට සක්‍රිය දායකත්වයක් ලබා දීම වැනි අරමුණු පෙරදැරිව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරයි.

කුඩා භූමි ප්‍රදේශයක වුවද අඩු නිෂ්පාදන පිරිවැයකින් උසස් තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතයෙන් වැඩි ගුණාත්මකභාවයකින් යුතු ඉහළ අස්වැන්නක් හෝ ආදායමක් ලබා ගැනීමේ නව ක්‍රමවේදයන් පිළිබඳ දැනුම ලබා දීම, පුහුණු සඳහා රාජ්‍ය ආයතන හා පුද්ගලයන් හඳුන්වා දීම, අදාළ රාජ්‍ය ආයතන හා පෞද්ගලික ආයතන හඳුන්වා දෙමින් දේශීය වෙළඳ පොළ සඳහා නිෂ්පාදන ඉදිරිපත් කිරීම, අපනයන වෙළඳපොළ හඳුන්වාදෙමින් තම නිෂ්පාදන අපනයනය සඳහා යොමු කිරීම රණවිරු දිරිය ණය ව්‍යාපෘතිය මගින් සිදු කරයි.


4.3.2. ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය

- දිවයින පුරා විහිදී ඇති සංසද තුළින් දිස්ත්‍රික්ක හා පළාත් භාර නිලධාරීන් මගින් ප්‍රතිලාභීන් තෝරා ගැනීම.
- ස්වයං රැකියා ණය ලබා දීමට තෝරා ගන්නා ප්‍රතිලාභීන් සඳහා අවුරුදු 55 සම්පූර්ණ වීමට ප්‍රථම අවම වශයෙන් වසර 03ක ඉදිරි සේවා කාලයක් ඉදිරියට තිබීම .
- එක් අයෙකුට උපරිම ලක්ෂ 10ක් දක්වා ණය මුදල් ලබා දෙන අතර 5% ක වාර්ෂික සහන පොලියක් අය කිරීම මෙන් ම, ණය අයකර ගැනීමේ උපරිම කාල සීමාව අවු 4කි. (ප්‍රතිපාදන ඌණතාවය මත 2022 වර්ෂය තුළ එක් අයෙකුට උපරිම ලක්ෂ 5ක ණය මුදලක් පමණක් පිරිනමන ලදී.)
- ප්‍රතිපත්තියක් ලෙස ණය මුදල වාරික දෙකකින් නිදහස් කරන අතර දෙවන වාරිකය නිදහස් කිරීමට පෙර ප්‍රගතිය පරීක්ෂා කිරීම මෙන්ම වැටුප් හා ලේඛණ අධ්‍යක්ෂ මණ්ඩලයෙන් එක් වාරිකයක් අයකර අප වෙත එවීමෙන් පසු දෙවන වාරික මුදල නිදහස් කිරීම සිදු කරනු ලබයි.

4.3.3. 2022 දිස්ත්‍රික්ක අනුව දිරිය ණය ලබා දීම

අ. අ.	පළාත	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	ලබාදුන් මුදල් (රු.)	සම්පූර්ණ මුදල රු.
1	බස්නාහිර	කළුතර	2	1,000,000.00	4,750,000.00
2		කොළඹ	3	1,500,000.00	
3		ගම්පහ	4	2,250,000.00	
4	මධ්‍යම	නුවර	3	1,500,000.00	4,000,000.00
5		මාතලේ	5	2,500,000.00	
6	දකුණ	ගාල්ල	2	1,000,000.00	3,500,000.00
7		මාතර	2	1,000,000.00	
8		හම්බන්තොට	3	1,500,000.00	
9	ඌව	මොණරාගල	1	500,000.00	1,500,000.00
10		බදුල්ල	2	1,000,000.00	
11	සබරගමුව	රත්නපුර	6	3,000,000.00	4,000,000.00
12		කෑගල්ල	2	1,000,000.00	

13	නැගෙනහිර	අම්පාර	4	2,000,000.00	2,000,000.00
14	වයඹ	පුත්තලම	1	500,000.00	3,750,000.00
15		කුරුණෑගල	6	3,250,000.00	
16	උතුරු මැද	අනුරාධපුර	4	1,800,000.00	4,800,000.00
17		පොළොන්නරුව	6	3,000,000.00	
එකතුව			**56**	**28,300,000.00**	**28,300,000.00**





කහ වගාව ස්වයං රැකියාවක් වශයෙන් සිදු කරන රණවිරුවෙක්



පානීය ජල බෝතල් නිෂ්පාදනය සිදු කරන රණවිරු ව්‍යවසායකයෙක්




රණවිරුවෙකු විසින් පවත්වා ගෙන යන ධාන්‍ය ඇඹරුම්හලක්



රණවිරුවෙකු විසින් පවත්වා ගෙන යන කොන්ක්‍රීට් වැඩබිමක්



ව්‍යාපාරයන්හි නියැලෙන රණවිරුවෙක්



පශු සම්පත් කළමනාකරණය සිදු කරන රණවිරුවෙක්

4.4. රණවිරු මාපිය සුරැකුම වැඩසටහන

ක්‍රියාන්විත රාජකාරියේ දී මියගිය හා අතුරුදහන් විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන් වෙත 2007 වසරේ නොවැම්බර් මස 21 වන දින සිට රණවිරුවාගේ වැටුපෙන් 25% ක මුදලක් ගෙවීම සිදු කරනු ලබයි. එහෙත් ඉහත කාල සීමාවට පෙර මියගිය විවාහක රණවිරුවන්ගේ දෙමව්පියන්ට කිසිදු දීමනාවක් නොලැබෙන අතර, එම දෙමව්පියන්ට කෘතගුණ සැලකීමක් වශයෙන් රජයේ විශ්‍රාම වැටුප් නොලබන රණවිරු දෙමව්පියන් වෙත රණවිරු මාපිය සුරැකුම් වැඩසටහන යටතේ මූල්‍යාධාර පිරිනමනු ලබයි.

මෙම ප්‍රතිලාභයට දායක වන සෑම දෙමාපියෙකුටම රණවිරු සේවා අධිකාරිය මගින් ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ තැපැල් බැංකු ශාඛා ගිණුම් ආරම්භ කරනු ලබයි. මව්පියන් දෙදෙනාගෙන් එක් අයෙකු පමණක් සිටී නම් මාසිකව රුපියල් 2,250.00 බැගින් ද, මව්පියන් දෙදෙනාම සිටී නම් එක් අයෙකු සඳහා මාසිකව රුපියල් 1,500.00 බැගින් රුපියල් 3,000.00 ක මුදලක් ලබා දීම සිදු කරන අතර මුදල් ලබා ගැනීම ජාතික ඉතිරි කිරීමේ බැංකුව හා තැපැල් කාර්යාල මගින් සිදු කර ගැනීමට පහසුකම් සලසා ඇත.

සෑම මසකම අවසානයේ ගිණුම්වලට මුදල් බැර කරන අතර ගිණුමේ මුදල ඉතිරි නොකර අදාළ මස මුදල ලබා ගන්නා ලෙස ප්‍රතිලාභීන් දැනුවත් කර ඇත. ගිණුම් හිමියා මිය ගිය විට මරණ සහතිකය හා ගිණුම් පොත ඉදිරිපත් කළ පසු ගිණුමේ මුදල් රණවිරු සේවා අධිකාරියේ ගිණුමට බැර වේ. ගිණුමෙන් මුදල් ලබා ගත හැකි වන්නේ අදාළ ප්‍රතිලාභියාට පමණක් වන අතර දෙමාපියන් දෙදෙනාම ජීවත්ව සිටින විට එක් අයෙකු මිය ගිය බව දැනුම් දුන් පසු ජීවත්ව සිටින ප්‍රතිලාභියාට මාසිකව ගෙවන මුදල රු.2250 ක් දක්වා වැඩි කරනු ලබයි.

4.4.1. රු.1500.00 බැගින් ගෙවීම

අ.අ	මාසය	ප්‍රතිලාභීන් ප්‍රමාණය	මාසිකව ගෙවන මුදල (රු)	ගෙවූ මුදල (රු)	එක් එක් මාසවලට අදාළ හිඟ මුදල් (රු)	ගෙවන ලද සම්පූර්ණ මුදල (රු)
1	ජනවාරි	375	1500.00	562,500.00	0.00	562,500.00
2	පෙබරවාරි	ප්‍රතිලාභීන් 08 දෙනෙකුට හිඟ වාරික 05 ක් ගෙවීම (වාරික 40)	1500.00	-	60,000.00	60,000.00
		375	1500.00	562,500.00	0.00	562,500.00
3	මාර්තු	289	1500.00	433,500.00	0.00	433,500.00
4	අප්‍රේල්	295	1500.00	442,500.00	9,000.00	451,500.00
5	මැයි	301	1500.00	451,500.00	42,000.00	493,500.00
6	ජුනි	295	1500.00	442,500.00	0.00	442,500.00
7	ජුලි	295	1500.00	442,500.00	0.00	442,500.00
8	අගෝස්තු	301	1500.00	451,500.00	45,000.00	496,500.00
9	සැප්තැම්බර්	306	1500.00	459,000.00	0.00	459,000.00
10	ඔක්තෝබර්	310	1500.00	465,000.00	0.00	465,000.00
11	නොවැම්බර්	312	1500.00	468,000.00	0.00	468,000.00
12	දෙසැම්බර්	305	1500.00	457,500.00	0.00	457,500.00
එකතුව				**5,698,500.00**	**96,000.00**	**5,794,500.00**

4.4.2. රු.2250.00 බැගින් ගෙවීම

අ.අ	මාසය	ප්‍රතිලාභීන් ප්‍රමාණය	මාසිකව ගෙවන මුදල (රු)	ගෙවූ මුදල (රු)	එක් එක් මාසවලට අදාළ නිහ මුදල්	ගෙවන ලද සම්පූර්ණ මුදල (රු)
1	ජනවාරි	422	2250	949,500.00	-	949,500.00
2	පෙබරවාරි	18x5 ප්‍රතිලාභීන් 18 දෙනෙකු සදහා නිහ වාරික 05 බැගින් ගෙවීම (වාරික 90)	2250	-	202,500.00	202,500.00
		2 නව ගිණුම් 02 ක් ආරම්භ කිරීම	2250	4,500.00	-	4,500.00
		426	2250	958,500.00	-	958,500.00
3	මාර්තු	357	2250	803,250.00	-	803,250.00
4	අප්‍රේල්	361	2250	812,250.00	24,750.00	837,000.00
5	මැයි	362	2250	814,500.00	29,250.00	843,750.00
6	ජුනි	370	2250	832,500.00	6,750.00	839,250.00
7	ජුලි	375	2250	843,750.00	45,000.00	888,750.00
8	අගෝස්තු	381	2250	857,250.00	67,500.00	924,750.00
9	සැප්තැම්බර්	378	2250	850,500.00	-	850,500.00
10	ඔක්තෝබර්	384	2250	864,000.00	-	864,000.00
11	නොවැම්බර්	383	2250	861,750.00	-	861,750.00
12	දෙසැම්බර්	390	2250	877,500.00	-	877,500.00
එකතුව				**10,532,250.00**	**10,532,250.00**	**10,705,500.00**

4.4.3. සම්පූර්ණ මුදල් බැර කිරීම - 2022 වර්ෂය

අ.අ.	මාසය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව	රු. 1500 ක් බැගින් ප්‍රතිලාභ ගෙවූ මුදල	රු. 2250 ක් බැගින් ප්‍රතිලාභ ගෙවූ මුදල	මාසිකව ගෙවූ මුලු මුදල (රු)
1	ජනවාරි	797	562,500.00	949,500.00	1,512,000.00
2	පෙබරවාරි	801	60,000.00	202,500.00	262,500.00
			-	4,500.00	4,500.00
			562,500.00	958,500.00	1,521,000.00
3	මාර්තු	646	433,500.00	803,250.00	1,236,750.00
4	අප්‍රේල්	656	451,500.00	837,000.00	1,288,500.00
5	මැයි	663	493,500.00	843,750.00	1,337,250.00
6	ජුනි	665	442,500.00	839,250.00	1,281,750.00

7	ජූලි	670	442,500.00	888,750.00	1,331,250.00
8	අගෝස්තු	682	496,500.00	924,750.00	1,421,250.00
9	සැප්තැම්බර්	684	459,000.00	850,500.00	1,309,500.00
10	ඔක්තෝබර්	694	465,000.00	864,000.00	1,329,000.00
11	නොවැම්බර්	695	468,000.00	861,750.00	1,329,750.00
12	දෙසැම්බර්	695	457,500.00	877,500.00	1,335,000.00
එකතුව			**5,794,500.00**	**10,705,500.00**	**16,500,000.00**

4.5. ඉඩම් අංශය

4.5.1. ව්‍යාපෘතිය හැඳින්වීම

රණවිරු පවුල් සාමාජිකයන් වෙත සුභසාධන කටයුතු ඉටු කිරීමේදී හා ඔවුන් විසින් ලැබෙන ඉල්ලීම් සලකා බැලීමේදී ඉඩමක් නොමැති වීම හේතු කොටගෙන ස්ථිර වාසස්ථාන සපයා ගැනීමේ යම් දුෂ්කරතාවන්ට මුහුණදෙන බව හඳුනාගත හැකිය. නිවාස ඉදි කර ගැනීමට ණය හා ආධාර ලබා දීමට විවිධ ව්‍යාපෘතීන් ක්‍රියාත්මක වුව ද නිවාස ඉදි කර ගැනීම සඳහා ඉඩම් නොමැති වීම මත මෙම ගැටලුව උද්ගත වේ. බොහෝ දෙනෙකු හවුල් ඉඩම්වල තාවකාලික වාසස්ථාන ඉදි කරගෙන සිටීම, අනවසර ඉඩම්වල පදිංචි වී සිටීම, බලපත්‍ර හෝ ඔප්පු රහිතව ඉඩම් අත්පත් කරගෙන සිටීම වැනි කරුණු මත රණවිරු ප්‍රජාව වෙත නිවාස සැපයීමේ දී ඉඩම් පිළිබඳව ගැටලුකාරී තත්ත්වයන් මතුව ඇත.

එයට විසඳුමක් වශයෙන් රණවිරු සේවා අධිකාරියේ ඉඩම් ව්‍යාපෘතිය මගින් රණවිරුවන් වෙත ඉඩම් හිමි කර දී ස්ථිර වාසස්ථානයක අවශ්‍යතාවය සපුරාලීම සඳහා මැදිහත්කරුවෙකු ලෙස කටයුතු කරයි. පදිංචි වීමට නීත්‍යානුකූල ඉඩමක් නොමැති රණවිරු පවුල් සාමාජික සාමාජිකාවන්ට ඉඩමක අයිතිය තහවුරු කරලීම, රජයේ ඉඩම්වල පදිංචි රණවිරු පවුල් සමාජික සාමාජිකාවන්ට ඔවුන් පදිංචි ඉඩමේ නීත්‍යානුකූල අයිතිය ඔප්පු මගින් ලබාගැනීමට අවශ්‍ය සහාය ලබාදීම හා පදිංචි ඉඩම්වල මතුව ඇති ගැටලු අදාළ ආයතන සම්බන්ධීකරණයෙන් විසඳාලීමට සහාය වීම ඉඩම් ව්‍යාපෘතිය මගින් සිදුවේ.

4.5.2. වැඩසටහනේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

I. ඉඩම් ලබා දීම

- **i.** සංසද මාර්ගයෙන් ලැබෙන ඉල්ලීම් මගින් ඉඩම් නොමැති රණවිරුවන් හා එම පවුල් හඳුනාගැනීම, ඔවුන් වෙතින් අයදුම්පත් කැඳවීම හා සම්පූර්ණ කර ලැබෙන අයදුම්පත් දිස්ත්‍රික්ක වශයෙන් දත්ත පද්ධතිය වෙත ඇතුළත් කිරීම
- **ii.** ග්‍රාම නිලධාරීන් හා ප්‍රාදේශීය ලේකම්වරුන් මාර්ගයෙන් එම රණවිරුවන් වෙත වෙනත් ඉඩම් සඳහා හිමිකම් ඇති ද යන්න සොයා බැලීම
- iii. සුදුසුකම්ලත් අයදුම්කරුවන් ඉඩම් කැබලි ඇති ප්‍රමාණයට ඒ ඒ ප්‍රදේශවලින් තෝරා ගැනීම සඳහා ඉඩම් කව්චේරිවලට යොමු කිරීම.
- iv. ඉන් සුදුසුකම් ලබාගන්නා රණවිරුවන්ගේ නාම ලේඛන නිර්දේශ කර අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, ඉඩම් කොමසාරිස් කාර්යාලය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිය වැනි ආයතන වෙත යැවීම.
- v. ඒ සබැඳිව ඉල්ලුම්කරුවන් හා අදාළ සේවාව දැනුවත් කිරීම හා ඉඩම් ලබාදීම සම්බන්ධීකරණය කිරීම.

II. ඔප්පු/බලපත්‍ර ලබා දීමට අදාළ නිර්දේශ ලබා දීම

රජයේ ඉඩම් කොටස්වල පදිංචි වී ඇති රණවිරුවන් සඳහා එම ඉඩමට අදාළ ඔප්පු/බලපත්‍ර ඉඩම් කොමසාරිස් ජනරාල්ගේ 2021/01 චක්‍රලේඛයට අනුව ‘‘රණවිරු සහන පදනම’’ මත ලබා ගැනීම සඳහා නිර්දේශ ලිපි ඉදිරිපත් කිරීම

III. ආයතන සම්බන්ධීකරණය

රණවිරුවන් විසින් පදිංචිය සඳහා මිලදී ගන්නා ලද ඉඩම්, රජයේ ඉඩම් වීම හේතුකොට ගෙන මතුවන ගැටලු විසඳාලීම සඳහා අදාළ ආයතන සමඟ සම්බන්ධීකරණය සිදු කිරීම.

4.5.3. 2022 වසර තුළ කාර්ය සාධනය

4.5.3.1. බලංගොඩ ඉඩම්ලාභී රණවිරුවන් වෙත තෑගි ඔප්පු ප්‍රදානය කිරීම

ඉඩම් නොමැති රණවිරුවන් වෙත ලබාදීම සඳහා ගල්කිස්ස ප්‍රදේශයේ පදිංචි පරිත්‍යාගශීලියකු වන L.K කුසුමාවතී මහත්මිය විසින් තම මියගිය ස්වාමිපුරුෂයාට පිං පිණිස තෑගි ඔප්පුවකින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද රූඩ් දෙකයි පර්චස් 38 ක ඉඩමෙන් පර්චස් 10 බැගින් වූ ඉඩම් කැබලි නමයක් ආබාධිත රණවිරුවන් 8 දෙනෙකුට සහ මියගිය රණවිරුවෙකුගේ මවකට ලබා දීමේ වැඩසටහනක් රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් 2022.02.23 වන දින බලංගොඩ රණවිරු ගම්මානයේ දී පවත්වන ලදී.

මෙහිදී සබරගමු පළාතට අයත් රත්නපුර දිස්ත්‍රික්කයේ, බලන්ගොඩ ප්‍රදේශයේ, මැදකොරලේ හෙල උඩපත්තුවේ, අංක 254, පහල මස්සැන්න බලංගොඩ ග්‍රාම සේවා වසම තුළ පිහිටි අබේසිංහ හේන හෙවත් විලේගොඩ කැල්ල ඉඩම (රූඩ් දෙකයි පර්චස් 38 ක) තාවකාලික බලපත්‍ර මගින් පදිංචිය සඳහා රණවිරු පවුල් නමයක් සඳහා ලබාදී තිබිණි. මෙම ඉඩම්වල පදිංචිකරුවන් සඳහා සින්නක්කර ඔප්පු ලබා දීම මෙහිදී සිදු කරන ලදී.

මෙම ඉඩම් කැබලි සඳහා වන නීත්‍යානුකූල අයිතිය පැවරීම සඳහා රණවිරු සේවා අධිකාරියේ ඉඩම් අංශයේ මැදිහත්වීම මත ශ්‍රී ලංකා යුද හමුදාවේ නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ සහාය ඇතිව පහත සඳහන් රණවිරු පවුල් 09 සඳහා සින්නක්කර ඔප්පු අත්සන් කර පවරා දීමේ කටයුතු මෙහිදී සිදු කෙරිණි.

i. අසමානලාගේ නිමල් විජේරත්න
ii. මාරත්තොට ගමඇතිරාළගේ තිලක් විජේනායක
iii. විජේතුංග මුදියන්සේලාගේ චන්ද්‍ර මාර අබේසිංහ බණ්ඩාර
iv. රත්නායක මුදියන්සේලාගේ ප්‍රියන්ත රත්නායක
v. ඩී.එම්.කුමාරසිරි
vi. කුලතුංග මුදියන්සේලාගේ නිශාන්ත කුමාර බණ්ඩාර
vii. උදුල්ලගේ සුසන්ත මුණසිංහ
viii. පේරකැටිය මාධව නන්දසිරි අතුල
ix. කොඹ්බෑවින්න මනන්නලාගේ වික්‍රමරත්න





4.5.3.2. රණවිරු පවුලක් සඳහා මීරිගමින් ඉඩම් ලබා දීම

ඉඩම් නොමැති රණවිරු පවුල් දෙකක් සඳහා මාලඹේ සහ මීරිගම ප්‍රදේශයන්හි පිහිටි ඉඩම් කැබලි දෙකක් සඳහා ඔප්පු අත්සන් කිරීමේ මූලික වැඩසටහනක් 2022 අගෝස්තු මස 1 වන දින රණවිරු සේවා අධිකාරියේ දී පවත්වන ලදී.

ඉඩම් නොමැති රණවිරුවන් වෙත ලබාදීම සඳහා මීරිගම ප්‍රදේශයේ පදිංචි පරිත්‍යාගශීලියකු වන විනීතා වික්‍රමාරච්චි මහත්මිය විසින් තෑගි ඔප්පුවකින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද පර්චස් 10 ක ඉඩම ගම්පහ දිස්ත්‍රික්කයේ මීරිගම ප්‍රදේශයේ පදිංචි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ආබාධිත රණවිරුවකු වන එච්.ඩබ්ලිව් කුමාරසිරි මහතා වෙත ලබා දීම සිදු කරන ලදී.





4.5.3.3. වතුමුල්ල ඉඩම්ලාභී රණවිරු බිරිඳ වෙත තෑගි ඔප්පුව ප්‍රදානය කිරීම

ඉඩමක් නොමැති රණවිරු පවුලක් සඳහා ගම්පහ ප්‍රදේශයෙන් ඉඩම් කැබැල්ලක් ලබා දීම සඳහා ඔප්පු අත්සන් කිරීම රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් 2022.11.09 දින රණවිරු සේවා අධිකාරියේ දී සිදු කරන ලදී.

ඉඩමක් නොමැති රණවිරුවකු වෙත ලබාදීම සඳහා වතුපිටිවල ප්‍රදේශයේ පදිංචි පරිත්‍යාගශීලීන් වන ධනසීලි කුමාරසිංහ සහ පියසීලි කුමාරසිංහ යන පරිත්‍යාගශීලී දෙපළ විසින් තෑගි ඔප්පුවක් මගින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද පර්චස් 10.20 ක ඉඩම ගම්පහ දිස්ත්‍රික්කයේ මිනුවන්ගොඩ ප්‍රදේශයේ පදිංචි ශ්‍රීලංකා යුද්ධ හමුදාවේ දිවි පිදූ මහේෂ් පද්මකුමාර රණවිරුවාගේ බිරිඳ වන ඩී.ඩී සමන්ති කුමාරි ප්‍රනාන්දු මහත්මිය වෙත ලබා දීම සිදු කරන ලදී.

බස්නාහිර පළාතේ ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ දාසිය පත්තුවේ මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් වතුමුල්ල ගමෙහි පිහිටි පර්චස් 10.20 ක දෙල්ගහවත්ත ඉඩම් කැබල්ල සඳහා වන නිත්‍යානුකූල අයිතිය පැවරීම යුද හමුදාවේ නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ සහාය ඇතිව රණවිරු සේවා අධිකාරියේ මැදිහත්වීම මත ඩී.ඩී සමන්ති කුමාරි ප්‍රනාන්දු මහත්මිය වෙත ඔප්පු අත්සන් කර තාවකාලික බලපත්‍රයක් මගින් පිරිනැමීම රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.





4.5.3.4. මාලඹේ ඉඩම තාවකාලික බලපත්‍රයක් මගින් ආබාධිත රණවිරුවෙකු වෙත පරිත්‍යාග කිරීම

කඩුවෙල ප්‍රාදේශීය සභාව මගින් රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද පර්චස් 6.70 ක ඉඩම් කැබැල්ල තාවකාලික බලපත්‍රයක් මගින් රණක්ෂිතයට පත් යුද්ධ හමුදාවේ රණවිරු ඩී.එම්.එස් කුමාරසිරි මහතා වෙත ලබා දීම 2022.11.09 දින සිදු විය.

මෙම ඉඩම් කැබල්ල සඳහා වන නිත්‍යානුකූල අයිතිය පැවරීම ශ්‍රී ලංකා යුද හමුදාවේ නීති සේවා අධ්‍යක්ෂක මණ්ඩලයේ සහාය ඇතිව රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.





05

වෛද්‍ය ආධාර හා ණය ලබා දීම

5.1. වෛද්‍ය ආධාර ලබා දීම

ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් වූ ආබාධිත විශ්‍රාමික රණවිරුවන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවයේ දිවි පිදූ විවාහක රණවිරුවන්ගේ සම්පූර්ණ වැටුප නොලබන දෙමාපියන්, ත්‍රිවිධ හමුදාව හෝ පොලිස් සේවය මගින් විශ්‍රාම වැටුප/යැපෙන්නන්ගේ දීමනාව පමණක් ලබන දිවි පිදූ රණවිරුවන්ගේ භාර්යාවන් සහ වයස අවුරුදු 26 ට අඩු අවිවාහක, රැකියා විරහිත දූ දරුවන් සඳහා වෛද්‍ය ආධාර ලබා දෙයි.

රණවිරු ප්‍රජාව වෙතින් ලැබෙන ඉල්ලීම් අනුව හදිසි සැත්කම් සඳහා ආධාර කිරීම, වෛද්‍ය පරීක්ෂණ සඳහා සහාය වීම, රෝග තත්ත්වයන් මග හරවා ගැනීමට අත්‍යවශ්‍ය වන වෛද්‍ය උපකරණ ලබා දීම, ආර්ථික අපහසුතා ඇති රෝගයන්ගෙන් පෙළෙන රණක්ෂිතයටපත් රණවිරුවන් සහ රණවිරු ඥාතීන් වෙත ප්‍රතිකාර ගැනීම සඳහා සහාය වීම මෙම වැඩසටහන යටතේ සිදු කරයි.

ඒ අනුව ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා ගත හැකි රෝහලක් වෙතින් අවශ්‍ය ප්‍රතිකාර, පරීක්ෂණ හෝ සැත්කම් සිදුකර ගැනීමට ප්‍රමාණවත් මූල්‍ය සහයෝගයක් ලබාදීම අත්‍යාවශ්‍ය වේ. රෝගයට ප්‍රතිකාර ලබා ගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමු වී කඩිනමින් සේවා ලබාගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු වෙයි. රණවිරුවා සඳහා උපරිමය රු.500,000.00ක් ද, රණවිරු ඥාතීන් සඳහා උපරිමය රු.75,000.00ක් ද වශයෙන් මූල්‍ය ආධාර ලබා දීම මේ යටතේ සිදු වේ.

5.2. වෛද්‍ය ණය ලබාදීම

රණවිරු ප්‍රජාව මුහුණ දෙන විවිධ සෞඛ්‍ය ගැටලු හේතුවෙන් වාර්ෂිකව විශාල පිරිසක් වෛද්‍ය ආධාර අයදුම් කරයි. හදිසි සැත්කම් හා ප්‍රතිකාරයන් සඳහා බහුතරයක් ඉල්ලීම් යොමු කරන අතර මින් වැඩි පිරිසක් වැටුප් හා දීමනා ලබන පුද්ගලයන් වේ. වෛද්‍ය හේතූන් මත විශ්‍රාම ගැන් වූ රණවිරුවන් අදාළ ආබාධිත තත්ත්වයන්ට හේතු වූ කරුණුවල ඍජු හෝ වක්‍ර බලපෑම් මත තවදුරටත් රෝගයන්ට ගොදුරුවීම සිදු වේ. රණවිරුවන් හා රණවිරු ඥාතීන් ද වැරදි පෝෂණ පුරුදු නිසා බෝ නොවන රෝගයන්ට ගොදුරු වීමේ ප්‍රතිශතය ඉහළ අගයක් ගන්නා අතරම හදිසි අනතුරුවලට මුහුණදීම නිසා ද සෞඛ්‍ය ගැටලු ඇතිවීම නොවැළැක්විය හැකිය. එසේම වයෝවෘද්ධ තත්ත්වය මත විවිධ රෝගයන්ට ගොදුරුවීම නිසා සෞඛ්‍ය පිරිහීමට ද ලක් වේ.

මෙවැනි සාධක නිසා රණවිරු ප්‍රජාව ගොදුරුවන රෝගාබාධයන් සඳහා ක්ෂණික ප්‍රතිකාර ලබා ගැනීමට රජයේ රෝහල්වල රෝගීන් දීර්ඝ කාලීනව පොරොත්තු ලේඛනගත කිරීම වැනි කරුණු හේතුවෙන් රෝග තත්ත්වයන් උත්සන්න වීම හා වෙනත් අතුරු ආබාධයන්ට ලක්වීම සිදුවිය හැකි අතර ඒ හේතු කොටගෙන අකල් මරණයන්ට ද ගොදුරුවිය හැකිය.

එසේම රජයේ රෝහල්වල ප්‍රතිකාර කිරීමේ ක්‍රියා පටිපාටියෙන් බැහැරව පුද්ගලික අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මූල්‍ය වැයක් දැරීම අවශ්‍යවන අතර එලෙස පුද්ගලික අංශයේ රෝහල් වෙතින් ප්‍රතිකාරයන් ලබා ගැනීමට ආර්ථික ශක්තියක් නොමැතිකම නිසා රෝගයට නිසි ප්‍රතිකාර කලට වෙලාවට නොලැබීමෙන් රෝගී තත්ත්වය උත්සන්න විය හැකිය.

එවන් අවස්ථාවල දී වෛද්‍ය නිර්දේශය මත හදිසි මූල්‍යාධාර අවශ්‍ය රණවිරු ප්‍රජාව වෙනුවෙන් පොලී රහිත ණය මුදලක් ලබා දීම මෙම වැඩසටහනේ මූලික පරමාර්ථය වේ. රෝගයට ප්‍රතිකාර ලබාගැනීමට අවශ්‍ය පහසුකම් ඇති ආයතනයන් වෙත යොමුවී කඩිනමින් සේවා ලබා ගැනීමට මූල්‍යමය දායකත්වය ලබාදීම මෙම වැඩසටහන මගින් සිදු කරනු ලැබේ.

රු.500,000.00 ක මුදලක් උපරිමය වශයෙන් වෛද්‍ය ණය මුදලක් ලෙස ලබාගත හැකිය. ණය මුදල අය කරන කාලය උපරිමය වාරික 36 කි. මෙම ණය මුදල ලබා දීමේ දී කිසිදු සේවා ගාස්තුවක් අය නොකරයි.

5.3. වෛද්‍ය ණය හා ආධාර ලබාදීමේ ක්‍රමවේදය

01

අයදුම්පත් ලබාදීම

දිස්ත්‍රික්ක වශයෙන් අයදුම්පත් ලබාදීම

02

වෛද්‍ය නිර්දේශය ලබා ගැනීම

සම්පූර්ණ කරන ලද අයදුම්පත් දිස්ත්‍රික් භාර නිලධාරී හා පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ නිර්දේශයෙන් ලබාගෙන වෛද්‍ය නිර්දේශයට ඉදිරිපත් කිරීම

03

වෛද්‍ය ආධාර කමිටුව වෙත යොමු කිරීම

වෛද්‍ය ආධාර/ණය කමිටුව වෙත යොමු කර ගෙවීම් සඳහා අනුමැතිය ලබා ගැනීම.

04

වෛද්‍ය ආධාර හා ණය මුදල් ලබාදීම

වෛද්‍ය ආධාර ප්‍රතිලාභියාගේ පෞද්ගලික ගිණුමටත්, වෛද්‍ය ණය මුදල අදාළ ආයතනය වෙනත් ගෙවීම් කිරීම

5 .4.වෛද්‍ය ආධාර ප්‍රතිලාභ බෙදී යාම

රණවිරුවන් 09



රු .මිලියන 1.87




රණවිරු දෙමාපියන්- 03

රණවිරු බිරින්දෑවරු- 04

රණවිරු දරුවන් - 04

5.4.1. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ආධාර ලබාදීම

අ.අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	අනුරාධපුර	1
2	අම්පාර	5
3	කුරුණෑගල	1
4	කොළඹ	1
5	ගාල්ල	1
6	පොළොන්නරුව	3
7	මහනුවර	3
8	මාතර	1
9	මොනරාගල	1
10	රත්නපුර	1
11	හම්බන්තොට	1



5.5. වෛද්‍ය ණය ප්‍රතිලාභ බෙදී යාම

රණවිරුවෙකු වෙත හදිසි ශල්‍යකර්මයක් සඳහා වැයවන මුදල් අවශ්‍යතාවය වෙනුවෙන් රුපියල් 500,000.00 ක මුදලක් වෛද්‍ය ණය ලෙස පොලී රහිතව ගෙවීම සඳහා ලබා දී ඇත .

5.5.1. දිස්ත්‍රික්ක වශයෙන් වෛද්‍ය ණය ලබාදීම

අ. අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් ප්‍රමාණය
01	අනුරාධපුර	1
එකතුව		4

06

අධ්‍යාපන ශිෂ්‍යත්ව හා තරුණ කටයුතු අංශය

ක්‍රියාන්විතයේදී ජීවිත පූජා කළ හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ අධ්‍යාපනය ලබන දරුවන්ගේ අධ්‍යාපන කටයුතු නිසි පරිදි සිදු කරගෙන යාමට දිරිදෙමින් මූල්‍යමය සහයෝගයක් ලබා දීම පිණිස මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

අධ්‍යාපන කටයුතු සාර්ථකව නිම කිරීමට ආර්ථිකමය සහයෝගය ලබා දෙමින් සමාජයීය හා චෘත්තීමය වශයෙන් සවිබල ගැන්වූ යහපත් දරුවන් පිරිසක් සමාජගත කිරීම අධ්‍යාපන හා තරුණ කටයුතු අංශයේ මූලික පරමාර්ථය යි.

6.1. අංශය යටතේ ක්‍රියාත්මක වැඩසටහන්

6.1.1. 6 – 11 ශ්‍රේණිය දක්වා ශිෂ්‍යාධාර


රණවිරුවන්ගේ 6 -11 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම ශිෂ්‍යත්ව ක්‍රමයේ දී 6 වසරේ සිට අ.පො.ස සා/පෙළ අධ්‍යාපනය අවසන් කරන තෙක් මසකට රුපියල් 500.00 බැගින් පහත සඳහන් ආකාරයට ශිෂ්‍යාධාර ලබාදේ. දරුවන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි එම දරුවන්ගේ නමින් මව/පියාගේ භාරකාරත්වයේ ඇති ජාතික ඉතිරිකිරීම් බැංකු ගිණුම් සඳහා මාසික මුදල් තැන්පත් කෙරේ.

අ.අ	ඉගෙන ගනු ලබන වසර	ගෙවනු ලබන වාරික මුදල (රු)	ගෙවනු ලබන මුලු වාරික ගණන	ශිෂ්‍යාධාරයන්හි වටිනාකම
1	**6 ශ්‍රේණිය**	500.00	72	36,000.00
2	**7 ශ්‍රේණිය**	500.00	60	30,000.00
3	**8 ශ්‍රේණිය**	500.00	48	24,000.00
4	**9 ශ්‍රේණිය**	500.00	36	18,000.00
5	**10 ශ්‍රේණිය**	500.00	24	12,000.00
6	**11 ශ්‍රේණිය**	500.00	12	6,000.00

6.1.1.1. 2022 වර්ෂය තුළ දිස්ත්‍රික්ක මට්ටමින් 6-11 ශ්‍රේණි සඳහා පිරිනමන ලද ශිෂ්‍යත්ව සංඛ්‍යාව

අ.අ.	පළාත	දිස්ත්‍රික්කය	ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය	මුලු ශිෂ්‍යත්ව ප්‍රමාණය (පළාත් වශයෙන්)
1	බස්නාහිර	කොළඹ	46	210
		ගම්පහ	87	
		කළුතර	77	
2	වයඹ	කුරුණෑගල	174	194

		පුත්තලම	20	
3	දකුණ	ගාල්ල	60	168
		මාතර	45	
		හම්බන්තොට	63	
4	සබරගමුව	කෑගල්ල	74	130
		රත්නපුර	56	
5	ඌව	බදුල්ල	71	131
		මොණරාගල	60	
6	උතුරු මැද	අනුරාධපුර	170	221
		පොළොන්නරුව	51	
7	මධ්‍යම	මහනුවර	109	212
		මාතලේ	59	
		නුවර එළිය	44	
8	නැගෙනහිර	ත්‍රිකුණාමළය	11	82
		අම්පාර	71	
එකතුව				1348




6.1.2. අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යාධාර

රණවිරුවන්ගේ අ.පො.ස උසස් පෙළ අධ්‍යාපනය ලබන දරුවන් වෙනුවෙන් ක්‍රියාත්මක මෙම ශිෂ්‍යත්ව ක්‍රමය යටතේ මසකට රු.1500.00 බැගින් උපරිම වාරික 24ක් ඇතුළත් වන පරිදි දරුවන්ගේ නමින් ඇති ගිණුම් වෙත මාසිකව මුදල් බැර කෙරේ.

6.1.2.1. 2022 වර්ෂය තුළ අ.පො.ස උසස් පෙළ ශිෂ්‍යත්ව පිරිනැමීම


අ.අ	පළාත	දිස්ත්‍රික්කය	ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය	මුලු ශිෂ්‍යත්ව ප්‍රමාණය (පළාත් වශයෙන්)
1	බස්නාහිර	කොළඹ	23	105
		ගම්පහ	47	
		කළුතර	35	
2	වයඹ	කුරුණෑගල	87	93
		පුත්තලම	6	
3	දකුණ	ගාල්ල	30	67
		මාතර	12	
		හම්බන්තොට	25	
4	සබරගමුව	කෑගල්ල	44	72
		රත්නපුර	28	
5	ඌව	බදුල්ල	36	58
		මොණරාගල	22	
6	උතුරු මැද	අනුරාධපුර	64	83
		පොළොන්නරුව	19	
7	මධ්‍යම	මහනුවර	47	90
		මාතලේ	27	
		නුවර එළිය	16	
8	නැගෙනහිර	ත්‍රිකුණාමලය	5	43
		අම්පාර	37	
		මඩකලපුව	1	
එකතුව				611



6.1.3. උසස් අධ්‍යාපන ශිෂ්‍යාධාර

රණවිරු පවුල්වල විශ්වවිද්‍යාල, විද්‍යාපීඨ හා රජයේ අනුමත වෙනත් උසස් අධ්‍යාපන පාඨමාලා සඳහා තේරී පත් වූ දරුවන් වෙත ඔවුන්ගේ අධ්‍යයන වසර 04ක් තුළ උපරිම වාරික 48ක් ඇතුළත් වන පරිදි මසකට රුපියල් 3000.00 බැගින් මූල්‍යාධාරයක් ලබා දීම සඳහා මෙම ශිෂ්‍යාධාර ක්‍රමය ක්‍රියාත්මක වේ.

අ.අ.	පළාත	දිස්ත්‍රික්කය	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රමාණය	උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව ප්‍රමාණය
1	බස්නාහිර	කොළඹ	16	76
		ගම්පහ	36	
		කළුතර	24	
2	වයඹ	කුරුණෑගල	40	47
		පුත්තලම	7	
3	දකුණ	ගාල්ල	27	57
		මාතර	20	
		හම්බන්තොට	10	
4	සබරගමුව	කෑගල්ල	21	32
		රත්නපුර	11	
5	ඌව	බදුල්ල	26	38
		මොණරාගල	12	
6	උතුරු මැද	අනුරාධපුර	28	36
		පොළොන්නරුව	8	
7	මධ්‍යම	මහනුවර	26	36
		මාතලේ	7	
		නුවර එළිය	3	
8	නැගෙනහිර	ත්‍රිකුණාමලය	6	17
		අම්පාර	11	
එකතුව				339




6.1.4. තෘතීය හා වෘත්තිය අධ්‍යාපන පාඨමාලා ආධාර

අ.පො.ස සා/පෙළ, උ/පෙළ සමත් හෝ අසමත් සෑම දෙනාට ම වෘත්තීය අධ්‍යාපනය ලබා දීමේ අරමුණ ඇතිව වෘත්තීය පාඨමාලා හදාරන රණවිරු දරුවන් උදෙසා පාඨමාලා ගාස්තුව ඇතුළත් වන සේ උපරිම රුපියල් 50,000.00 ක පාඨමාලා ආධාර ලබාදීම මේ යටතේ සිදු කරනු ලබයි. නමුත් 2022 වර්ෂය තුළ ප්‍රතිපාදන නොමැතිවීම හේතුවෙන් මෙම පාඨමාලා ආධාර ලබා දීම තාවකාලිකව නවතා දමන ලදී.

6.1.5. කුසලතා ප්‍රවර්ධන ණය

අ.පො.ස සා/පෙළ හා උ/පෙළ මට්ටමින් හා උසස් අධ්‍යාපන කටයුතුවලින් අධ්‍යාපනය අවසන් කරන ලද රණවිරු දරුවන් සඳහා විවිධ පාඨමාලා ඔස්සේ තම අධ්‍යාපන කටයුතු ඉදිරියට කරගෙන යාමට අවශ්‍ය මූල්‍යමය දායකත්වයක් ලබා දීම අරමුණු කරගනිමින් පාඨමාලා ගාස්තුවට අදාළව අධ්‍යාපන ණය ලබාදීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කෙරේ. උපරිමය රුපියල් 500,000.00ක ණය මුදලක් මෙමගින් පිරිනමනු ලබයි.

අ.අ.	පළාත	දිස්ත්‍රික්කය	අධ්‍යාපන ණය ප්‍රමාණය	එකතුව
1	බස්නාහිර	කොළඹ	1	4
2		ගම්පහ	1	
3		කළුතර	2	
4	වයඹ	කුරුණෑගල	1	1
5	දකුණ	ගාල්ල	1	1
6	සබරගමුව	කෑගල්ල	1	1
7	උතුරු මැද	අනුරාධපුර	2	2
එකතුව				9



6.1.6. 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම (ආරක්ෂක අමාත්‍යාංශය සමග සම්බන්ධව)

ක්‍රියාන්විතයේදී මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ 5 වසර ශිෂ්‍යත්වය සමත් දරුවන් ඇගයීම සඳහා ආරක්ෂක අමාත්‍යාංශය මගින් ලබාදෙන ශිෂ්‍යාධාර වැඩසටහන සඳහා අවශ්‍ය අයදුම්පත් 31 ක් යොමු කිරීම මේ යටතේ සිදුකරන ලදී.

6.1.7. 2022 වසර තුළ සිදු කරන ලද විශේෂ වැඩසටහන්

6.1.7.1. අමරණීය සොල්දාදුවන් 32 (32 Immortal Soldiers) කෘතියේ කර්තෘ ආදායමෙන් රණවිරු දියණියකට අධ්‍යාපනික අත්වැලක්

ප්‍රවීණ බැංකුකරුවකු සහ වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන ප්‍රසාද් පොල්වත්ත මහතා විසින් රචිත අමරණීය සොල්දාදුවන් 32 (32 Immortal Soldiers) කෘති අලෙවියෙන් ලද කර්තෘ ආදායම උපයෝගී කර ගනිමින් රණක්ෂිතයට පත් රණවිරු දියණියක් සඳහා අධ්‍යාපන අත්වැලක් වෙමින් ලැප්ටොප් පරිගණක යන්ත්‍රයක් පරිත්‍යාග කිරීම 2022 පෙබරවාරි මස 14 වන සඳුදා දින අධිකාරියේ දී සිදු කරන ලදී.

දොම්පේ කැරගල රණවිරු ගම්මානයේ වැඩසටහනකට සහභාගී ව සිටියදී රණවිරු සේවා අධිකාරියේ සභාපතිතුමා වෙත මෙම රණක්ෂිතයට පත් රණවිරුවා සහ දියණිය විසින් සිදුකරන ලද ඉල්ලීමකට ක්ෂණික ප්‍රතිචාර දැක්වීමක් වශයෙන් රුපියල් 120,000.00 වටිනා ලැප්ටොප් පරිගණකය පරිත්‍යාග කිරීම සිදු කරන ලදී.

ප්‍රසාද් පොල්වත්ත මහතා විසින් රචිත කෘතියේ රණවිරු සේවා අධිකාරිය වෙත පරිත්‍යාග කරන ලද කර්තෘ ආදායම උපයෝගී කර ගනිමින් මෙම ලැප්ටොප් යන්ත්‍රය මිලදී ගෙන මෙම රණවිරු දියණියගේ අධ්‍යාපන අවශ්‍යතා සඳහා පහසුකමක් සැලසීමට රණවිරු සේවා අධිකාරියේ ශිෂ්‍යත්ව වැඩසටහන් අංශය විසින් කටයුතු කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරල් නන්දන සේනාධීර විසින් සිදු කරන ලද ආරාධනයෙන් ප්‍රසාද් පොල්වත්ත මහතා විසින් දියණිය වෙත දෙමව්පියන් ඉදිරියේ මෙම පරිගණක යන්ත්‍රය ප්‍රදානය කිරීම සිදුවිය. රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක (විශ්‍රාමික), බස්නාහිර පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ ධම්මිකා ෂෙල්ටන් මහත්මිය, ශිෂ්‍යත්ව අංශ ප්‍රධානී, සුරේඛා ප්‍රනාන්දු මෙනවිය සහ රණවිරු පවුලේ සාමාජිකයින් මෙම අවස්ථාවට සහභාගි විය.





6.7.7.2. "අමරණීය සොල්දාදුවන් 32" කෘතිය තවත් රණවිරු දරුවන් තිදෙනෙකුට අධ්‍යාපනික අත්වැලක් වෙයි

යුද්ධයෙන් මියගිය හා රණක්ෂිතයට පත් යුද හමුදා සහ පොලිසියේ රණවිරු දු දරුවන් තිදෙනකුට උසස් අධ්‍යාපනය සඳහා අවශ්‍ය ලැප්ටොප් පරිගණක යන්ත්‍ර තුනක් පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2022.03.03 වන දින රණවිරු සේවා අධිකාරියේ දී පවත්වනු ලැබීය.

ප්‍රවීණ බැංකුකරුවකු සහ වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන ප්‍රසාද් පොල්වත්ත මහතා විසින් රචිත අමරණීය සොල්දාදුවන් 32 (32 Immortal Soldiers) කෘති අලෙවියෙන් ලද කර්තෘ ආදායම උපයෝගී කර ගනිමින් රණක්ෂිතයට පත් රණවිරු දරුවන් තිදෙනෙකු සඳහා අධ්‍යාපන අත්වැලක් වෙමින් ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 3ක් පරිත්‍යාග කිරීම සිදු කළ අතර මීට පෙර අවස්ථාවක දී ද රණවිරු දියණියක් වෙත ලැප්ටොප් පරිගණකයක් ප්‍රදානය කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරල් නන්දන සේනාධීර මහතා විසින් සිදුකරන ලද ආරාධනයෙන් ප්‍රසාද් පොල්වත්ත මහතා සහ ඔහුගේ බිරිඳ හර්ෂි පොල්වත්ත මහත්මිය විසින් මෙම රණවිරු දරුවන් වෙත පරිගණක යන්ත්‍ර ප්‍රදානය කිරීම සිදු කරන ලදී. රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක (විශ්‍රාමික), සභාපති ලේකම් බ්‍රිගේඩියර් රෝෂන් තිරිමාන්න, ශිෂ්‍යත්ව අංශ ප්‍රධානී, සුරේඛා ප්‍රනාන්දු මෙනවිය සහ රණවිරු පවුල්වල සාමාජිකයින් මෙම අවස්ථාවට සහභාගි විය.





6.1.7.3. සභාපතිතුමාගේ පුද්ගලික අනුග්‍රහයෙන් රණවිරු දරුවන් දෙදෙනෙකු ලැප්ටොප් යන්ත්‍ර දෙකක් පරිත්‍යාග කිරීම

ක්‍රියාන්විතයේ දී මියගිය හා ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ උසස් අධ්‍යාපනය ලබන දරුවන් විසින් සිදු කරන ලද විශේෂ ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමින් ඔවුන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය ලැප්ටොප් පරිගණක යන්ත්‍ර දෙකක් පරිත්‍යාග කිරීම රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ පුද්ගලික අනුග්‍රාහකත්වයෙන් 2022.08.27 දින රණවිරු සේවා අධිකාරියේ දී සිදු කරන ලදී.

ගම්පහ ප්‍රාදේශයේ පදිංචි 3 වන ශ්‍රී ලංකා පාබල හමුදාවට අනුයුක්තව වාවකච්චේරි ප්‍රදේශයේ ක්‍රියාන්විත රාජකාරියේ නිරතව සිටියදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව තුවාල ලබා පූර්ණ ආබාධිත තත්ත්වයට පත් ඒ.එච්. සුසන්ත රණවිරුවාගේ දියණිය වෙත මෙම ලැප්ටොප් පරිගණක යන්ත්‍රය පරිත්‍යාග කරන ලදී. ඇය 2020 වර්ෂයේ පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් ගණිත අංශයෙන් සමත් ව රුහුණු විශ්ව විද්‍යාලයේ මූල්‍ය ගණිතය හා කාර්මාන්ත සංඛ්‍යානය විෂය හැදෑරීමට අපේක්ෂාවෙන් සිටින දියණියකි.

වර්ෂ 2007 වසරේ දී මඩකලපුව ප්‍රදේශයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව රණක්ෂිතයට පත් ශ්‍රීලංකා පොලිස් දෙපාර්තමේන්තුවට අනුයුක්තව රාජකාරි කරන ලද උප පොලිස් පරීක්ෂක කේ.එම්. ගුණරත්න රණවිරුවාගේ වැඩිමහල් පුතණුවන් 2020 වර්ෂයේ පැවති අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයෙන් තොරතුරු තාක්ෂණ අංශයෙන් විශිෂ්ට ලෙස සමත් ව කැගල්ල දිස්ත්‍රික්කයේ ප්‍රථම ස්ථානය හිමිකර ගනිමින් රුහුණු විශ්ව විද්‍යාලයේ තොරතුරු තාක්ෂණ විෂය හැදෑරීමට අපේක්ෂාවෙන් සිටින අතර ඔහු වෙනුවෙන් ද ලැප්ටොප් පරිගණකයක් ප්‍රදානය කිරීම ද එහි දී සිදුවිය.





6.1.7.4. බස්නාහිර පළාතේ වීරු දරුවන් හට මුතුහරෙන් පාසල් උපකරණ පරිත්‍යාගයක්

ජාතික රූපවාහිනියේ ජාත්‍යන්තර මුතුහර ළමා සමාජවලට අනුබද්ධ දෝහා කටාර්, එංගලන්තයේ ලන්ඩන්, ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් සහ සිඩ්නි නුවර පදිංචි ශ්‍රී ලාංකික දරු දැරියන් විසින් පරිත්‍යාග කරන ලද පාසැල් උපකරණ බෙදාදීමේ පළමු අදියර වශයෙන් බස්නාහිර පළාතේ කොළඹ, කළුතර සහ ගම්පහ දිස්ත්‍රික්කයන්හි රණ විරු දරුවන් උදෙසා පරිත්‍යාග කිරීමේ වැඩසටහනක් 2022 අගෝස්තු මස 30 වන අගහරුවාදා රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ ප්‍රධානත්වයෙන් පවත්වන ලදී.

ජාතික රූපවාහිනියේ මුතුහර ළමා වැඩසටහනේ වැඩසටහන් අධ්‍යක්ෂ උදාන්ත කමල් ගුණතිලක මහතාගේ සහභාගිත්වයෙන් පැවති මෙම වැඩසටහනේදී යුද්ධයෙන් මියගිය සහ රණක්ෂිතයට පත් ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියට අනුයුක්තව රාජකාරී කොට යුද්ධයෙන් මියගිය සහ රණක්ෂිතයට පත් වූ රණවිරුවන්ගේ තෝරාගත් රණවිරු දරු දැරියන් 70 දෙනෙකු සඳහා පාසල් උපකරණ පරිත්‍යාගය රණවිරු සේවා අධිකාරියේ සභාපති තුමන්ගේ මගපෙන්වීම යටතේ සිදු කරන ලදි.

රණවිරු සේවා අධිකාරියේ උප සභාපතිනිය සහ සෙනෙහස විශේෂ අධ්‍යාපන කේන්ද්‍රයේ ප්‍රධාන අධීක්ෂණ නිලධාරිනි, සෝනියා කෝට්ටෙගොඩ මහත්මිය, රණවිරු සේවා අධිකාරියේ අධ්‍යක්ෂ, මේජර් ජෙනරල් කිත්සිරි ඒකනායක (විශ්‍රාමික), සභාපති ලේකම්, බ්‍රිගේඩියර් රෝෂන් තිරිමාන්න, රණවිරු සේවා අධිකාරියේ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ මහත්ම මහත්මීන්, අංශ ප්‍රධානීන්, වැඩසටහන් නිලධාරීන්, කාර්ය මණ්ඩලයේ සාමාජික සාමාජිකාවන්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ නිලධාරීන් රණවිරු දෙමව්පියන් සහ දූ දරුවන් මෙම අවස්ථාවට සහභාගි විය.









6.1.8. මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය

6.1.8.1. ව්‍යාපෘතියේ අරමුණ

ත්‍රිවිධ හමුදාවේ සහ පොලිස් සේවයට අනුයුක්තව ක්‍රියාන්විත සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ක්‍රියාන්විත නොවන හේතූන් මත ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු හදාරන දරුවන් වෙත අධ්‍යාපන කටයුතු සාර්ථකව සිදු කර ගැනීමට දිරි දීමක් ලෙසින් ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.


6.1.8.2. ව්‍යාපෘතියේ ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනතින් ස්ථාපිත රණවිරු සේවා අධිකාරියේ ප්‍රතිලාභී කාණ්ඩයට අයත් නොවන ක්‍රියාන්විත නොවන හේතූන් මත මියගිය හා ආබාධිත රණවිරුවන්ගේ දරුවන් වෙත ශිෂ්‍යත්ව පිරිනැමීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරනු ලබයි. ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කිරීමක් සිදු කරනු නොලබන අතර පරිත්‍යාගශීලීන්ගේ මූල්‍යමය දායකත්වය මත ශිෂ්‍යාධාර පිරිනැමීම සිදු කරනු ලබයි. දේශීය හා විදේශීය පරිත්‍යාගශීලීන් විසින් සිදු කරනු ලබන මූල්‍යාධාර ප්‍රදානයන් ආර්ථික අපහසුතා හේතුවෙන් තම අධ්‍යාපන කටයුතු සිදු කර ගැනීමට නොහැකිව සිටින රණවිරු දරුවන් වෙත මාසිකව ගෙවීම මෙම ව්‍යාපෘතිය මගින් ඉටු කරනු ලබන ප්‍රමුඛතම කාර්යයකි.

දිස්ත්‍රික්ක භාර නිලධාරීන් මගින් හෝ රණවිරු පවුල් වෙතින් සෘජුවම යොමු කිරීමෙන් ව්‍යාපෘතිය වෙත ලැබෙන අයදුම්පත් අඩුපාඩු පරීක්ෂාවෙන් අනතුරුව ශිෂ්‍යත්වලාභීන් තෝරා ගැනීමේ කමිටුව වෙත ඉදිරිපත් කරනු ලැබේ. එම කමිටුවේ අනුමැතියෙන් පසුව දරුවන්ගේ තොරතුරු පරිත්‍යාගශීලීන් වෙත යොමු කරනු ලබන අතර ඔවුන් විසින් තෝරා ගන්නා දරුවන් වෙත පරිත්‍යාග කරනු ලබන මුදල් මාසිකව දරුවන්ගේ ගිණුම් වෙත බැර කිරීම සිදු වේ.


6.1.8.3. දිස්ත්‍රික්ක අනුව 2022 වසර තුළ ශිෂ්‍යත්ව පිරිනැමීම - 2022

අ.අ.	පළාත	දිස්ත්‍රික්කය	ලබා දුන් ප්‍රමාණය
1	බස්නාහිර	කොළඹ	7
		කළුතර	20
		ගම්පහ	28
2	දකුණ	ගාල්ල	13
		මාතර	8
		හම්බන්තොට	8
3	මධ්‍යම	මහනුවර	29
		මාතලේ	18
		නුවරඑළිය	12
4	සබරගමුව	රත්නපුර	22
		කෑගල්ල	8
5	වයඹ	කුරුණෑගල	42
		පුත්තලම	8
6	උතුරුමැද	අනුරාධපුර	64
		පොළොන්නරුව	10
7	ඌව	බදුල්ල	21
		මොණරාගල	11
8	නැගෙනහිර	අම්පාර	17
		වවුනියාව	1




6.1.8.4. 2022 වර්ෂය තුළ එක් එක් මාසවල ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය

අ.අ.	මාසය	ලබා දුන් ශිෂ්‍යත්ව ප්‍රමාණය
1	ජනවාරි	78
2	පෙබරවාරි	78
3	මාර්තු	325
4	අප්‍රේල්	78
5	මැයි	78
6	ජුනි	75
7	ජූලි	76
8	අගෝස්තු	76
9	සැප්තැම්බර්	77
10	ඔක්තෝම්බර්	77
11	නොවැම්බර්	77
12	දෙසැම්බර්	77




6.1.8.5. 2022 වර්ෂය තුළ ශිෂ්‍යාධාර ප්‍රදානය සඳහා මාසිකව දරන ලද පිරිවැය

අ.අ.	මාසය	වැය වූ මුදල (රු.)
1	ජනවාරි	104,000.00
2	පෙබරවාරි	104,000.00
3	මාර්තු	220,000.00
4	අප්‍රේල්	104,000.00
5	මැයි	104,000.00
6	ජුනි	95,000.00
7	ජූලි	98,000.00
8	අගෝස්තු	98,000.00
9	සැප්තැම්බර්	100,500.00
10	ඔක්තෝම්බර්	100,500.00
11	නොවැම්බර්	100,500.00
12	දෙසැම්බර්	100,500.00
එකතුව		1,329,000.00



6.1.8.6. ශිෂ්‍යාධාර ප්‍රදානය සඳහා පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය

අ. අ.	පරිත්‍යාග හිමි වූ රටවල්	හිමි වූ ශිෂ්‍යත්ව සංඛ්‍යාව
1	ශ්‍රී ලංකාව	266
2	ඩුබායි	12
3	ඕස්ට්‍රේලියාව	03
4	එංගලන්තය	50



6.1.8.7. 2022 වර්ෂය තුළ දී මාපිය කැපකරු ශිෂ්‍යත්ව ව්‍යාපෘතිය මගින් සිදු කරන ලද වෙනත් කාර්යයන්

i. නිවාස නොමැති සහ නිවාසවල වැඩ අවසන් කර නොමැති රණවිරු පවුල් 04 දෙනෙකුගේ නිවාස පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මගින් සකස් කර දීම.





ii. ශිෂ්‍යාධාර හිමි නොවූ දරුවන් 165 ක් වෙත නිපොන් ශිෂ්‍යත්ව ලබා ගැනීම සඳහා කටයුතු සම්බන්ධීකරණය

රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතාගේ විශේෂ ඉල්ලීමකට අනුව ශ්‍රී ලංකා නිපෝන් අධ්‍යාපනික හා සංස්කෘතික කේන්ද්‍රයේ මහලේකම් ශ්‍රී ජයවර්ධනපුර ප්‍රධාන සංඝනායක ස්ථවිර පූජ්‍ය මීගහතැන්නේ චන්දසිරි නාහිමිපාණන් විසින් රණවිරු දු දරුවන් සඳහා අධ්‍යාපනික ශිෂ්‍යත්ව හිමි ගැන්වීමට එකඟතාවය පළ කර ඇත.

සමාජ සේවා කටයුතු සඳහා විශේෂ උනන්දුවක් දක්වන මෙම විහාරස්ථානයේ විශේෂ දායිකාවක ලෙසින් කටයුතු කරන ප්‍රබෝධනී මාරසිංහ මහත්මියගේ මැදිහත්වීම මත මෙම අධ්‍යාපනික ශිෂ්‍යත්ව රණවිරු දරුවන් හට ලබා ගැනීමේ අවස්ථාව උදා විය.

මෙම වැඩසටහන යටතේ ක්‍රියාන්විත නොවන හේතු මත මියගිය සහ තුවාල ලැබූ ත්‍රිවිධ හමුදාවේ සහ පොලීසියේ රණවිරු දු දරුවන් සඳහා දස වසරක කාලයක් සඳහා හිමිවන පරිදි අධ්‍යාපනික ශිෂ්‍යත්ව හිමි ගැන්වෙන අතර මෙමගින් රණවිරු දු දරුවන්ගේ පාසල් අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය සියලු පාසල් උපකරණ, නිල ඇඳුම් සහ මූල්‍යමය පරිත්‍යාගයන් ද ඇතුලුව වාර්ෂිකව මෙම අධ්‍යාපනික ආධාර හිමි ගැන්වීම අපේක්ෂා කරනු ලබයි.



iii. රණවිරු සේවා අධිකාරියේ ක්‍රීඩා සංචිතය නියෝජනය කරන විශ්‍රාමික සැරයන් මේජර් අනිල් ප්‍රසන්න ජයලත් හට අවශ්‍යව පැවති ක්‍රීඩා පාවහන් යුගලයක් පරිත්‍යාග කිරීම මාපිය කැපකරු අංශ ප්‍රධානී තුලානි දේවමිත්ත මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදුවිය. ඩී.එස්.අයි සමූහ ව්‍යාපාරයේ කළමනාකරණ අධ්‍යක්ෂ තුසිත රාජපක්ෂ මහතා විසින් මෙම පාවහන් යුගලය සඳහා අවශ්‍ය අනුග්‍රාහකත්වය ලබා දෙන ලදී.

iv. තුන් නිවුන් දරුවන් සිටින රණවිරු පවුලක් සඳහා පරිත්‍යාගශීලීන්ගේ දායකත්වය මත එම දරුවන්ට අවශ්‍ය කිරිපිටි ලබා දීම.

v. රත්නපුර දිස්ත්‍රික්කයේ ඇඹිලිපිටිය රණවිරු සංසදය නියෝජනය කරන පූර්ණ ආබාධිත රණවිරු වර්ණ සැරයන් ඒ.කේ. උපුල් රණවිරුවා වෙනුවෙන් අවශ්‍යව තිබූ සායනික මෙට්ටයක් පරිත්‍යාගශීලියකුගේ අනුග්‍රාහය මත පරිත්‍යාග කිරීම.

vi. රණවිරු දරුවෙකුගේ හිසෙහි සිදු වූ ආබාධිත තත්ත්වයක් සඳහා සිදු කළ යුතු ශල්‍යකර්මයක් සඳහා පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් රු.100,000/- ක් ලබා දීම.

vii. දෑස් නොපෙනෙන රණවිරු මවක් පදිංචිව සිටින නිවසට නාන කාමරයක් සහ මුළුතැන්ගෙට අවශ්‍ය උපකරණ මෙන් ම ඇයගේ අසනීප තත්ත්වයන්ට අවශ්‍ය බෙහෙත් ද්‍රව්‍යයන් පරිත්‍යාගශීලීන්ගේ ආධාර මගින් ලබා දීම.

07

පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය

7.1. හැඳින්වීම

රණවිරු සේවා අධිකාරිය මගින් දිවයින පුරා ව්‍යාප්තව සිටින රණවිරු පවුල් ඒකරාශී කරමින් පවත්වාගෙන යන රණවිරු සංසද ජාලය ක්‍රමවත්ව පවත්වා ගෙන යාම මගින් වඩාත් ඵලදායී සේවාවක් රණවිරුවා වෙත ලබා දීම සඳහා පළාත් හා විශේෂ ව්‍යාපෘති අංශය මගින් වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කරනු ලබයි.

රණවිරු ප්‍රජාවෙහි අවශ්‍යතා හඳුනා ගනිමින් අවශ්‍යතා කළමනාකරණය කිරීමේ වගකීම පළාත් අංශය සතු වේ .රණවිරුවන් වෙතින් ලැබෙන ඉල්ලීම් සලකා බලා ඒවාට ක්ෂණික ප්‍රතිචාර දැක්වීම, හදිසි ආපදා අවස්ථා සඳහා ආධාර ලබා දීම, රණවිරු ගම්මාන නඩත්තුව ආදී කාර්යයන් රාශියක් මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

7.2. හදිසි ආපදා ආධාර ලබා දීමේ වැඩසටහන

ක්‍රියාන්විතයේදී දිවිපිදූ රණවිරු පවුල් වල ළඟම ඥාතීන් සහ රණක්ෂිතයටපත් (ආබාධිත විශ්‍රාමික) සහ ආබාධිත සේවයේ නියුතු රණවිරුවන් හට සිදුවන නායයෑම්,සුළිසුළං, ගිනි ගැනීම් වැනි හදිසි ආපදා තත්ත්වයකදී නිවාසවලට සිදුවන අලාභානි සහ රණක්ෂිතයටපත් රණවිරුවා මියයෑම සැලකිල්ලට ගෙන එම රණවිරු පවුල් වෙත අස්වැසිල්ලක්වන අරමුණින් හදිසි ආපදා ආධාර ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ.

7.2.1. ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

ක්‍රියාන්විතයේදී දිවිපිදූ රණවිරු පවුල් වල ළඟම ඥාතීන් සහ රණක්ෂිතයටපත් (ආබාධිත විශ්‍රාමික) සහ ආබාධිත සේවයේ නියුතු රණවිරුවන් හට සිදුවන නායයෑම්, සුළි සුළං, ගිනි ගැනීම් වැනි හදිසි ආපදා තත්ත්වයක දී නිවාසවලට සිදුවන අලාභානි සඳහා රුපියල් 100,000.00 ක මුල්‍යමය ආධාරයක් ද රණක්ෂිතයටපත් රණවිරුවා මියයෑම සැලකිල්ලට ගෙන එම රණවිරු පවුල් වෙත රුපියල් 10,000.00ක මුල්‍යමය ආධාරයක් ද අදාළ දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරීගේ සහ පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂකගේ නිර්දේශය අනුව ගෙවීම් සිදු කරනු ලබයි.

7.2.2. ස්වභාවික හදිසි ආපදාවන්ට ලක් වූ රණවිරු පවුල් වෙත ආධාර ලබා දීම

අ.අ.	නම	විස්තරය	දිස්ත්‍රික්කය	ආධාර මුදල රු.
1	කේ.එච්.එම් කරුණාරත්න සෙ/412467	චතුර මෝටරයක් ලබා ගැනීම සඳහා ආධාර කිරීම	අම්පාර	100,000.00
2	ආර්.ඒ.එම් උදයසිරි සෙ/410601	නිවසට හානි සිදුවීම හේතුවෙන් හදිසි ආපදා ආධාර ගෙවීම	රත්නපුර	100,000.00
3	පී.ටී.එස් දසනායක සෙ/416116	නිවසට හානි සිදුවීම හේතුවෙන් හදිසි ආපදා ආධාර ගෙවීම	රත්නපුර	100,000.00
4	බී.ජී ජයමාන්න සෙ/34896	නිවසේ පැකිබැම්ම නායයාම හේතුවෙන් හදිසි ආපදා ආධාර	මහනුවර	100,000.00

		ගෙවීම		
5	කේ ජිනදාස සෙ/76030	අධික වර්ෂාව හේතුවෙන් නිවස ආපදාවට ලක්වීම හේතුවෙන් ආධාර ගෙවීම	ගාල්ල	100,000.00
6	යු.ජී.සී එන් විජේකුලතුංග සෙ/423321	නිවස පිටුපස පස් කන්ද කඩා වැටීම හේතුවෙන් සාදා ගැනිම වෙනුවෙන් හදිසි ආපදා ආධාර ගෙවීම	මහනුවර	100,000.00
එකතුව				600,000.00




සෙ410601 ආර්.ඒ.එම් උදයසිරි මියගිය රණවිරුවාගේ බිරිඳ ජීවත්වන නිවසට ගසක් කඩා වැටීම




සෙ416416 පී.ටී.එස් දසනායක මියගිය රණවිරුවාගේ බිරිඳ ජීවත් වන නිවසට ගසක් කඩා වැටීම






සෙ/34896 බී.ජී ජයමාන්න රණවිරුවාගේ නිවසේ පැති බැම්ම නායයාම

7.2.3. හදිසි අභාවයන්ට ලක් වූ රණවිරුවන් වෙනුවෙන් ආධාර ලබා දීම

අ.අ.	හදිසි අභාවයටපත් වූ රණවිරුවාගේ නම	සේවා අංකය	දිස්ත්‍රික්කය	ලබා දුන් මුදල
1	පී කුලතුංග	සෙ/7P00675	අනුරාධපුරය	10000.00
2	එන් ධර්මදාස	සෙ/5D00745	අනුරාධපුරය	10000.00
3	එම්පී.එන්. පුන්‍යාසෝම	සෙ/456566	අනුරාධපුරය	10000.00
4	එම්අයි. අබ්දුල්ලා	පො.කො.52064	අම්පාර	10000.00
5	ගාමිණී රණතුංග	සෙ/42836	කළුතර	10000.00
6	අයිපි.එම්. ගුණතිලක	සෙ/11745	කළුතර	10000.00
7	පේකේ. පෙරේරා	සෙ/311345	කෑගල්ල	10000.00
8	එස්කේ. වීරසේකර	සෙ/307292	කුරුණෑගල	10000.00
9	ඩීඑල්.සී. චන්ද්‍රලාල්	එක්ස්එස් 8489	කොළඹ	10000.00
10	අජිත් ප්‍රනාන්දු	සෙ/453100	කොළඹ	10000.00
11	කේඊ සෙනෙවිරත්න.එස්.	සෙ/357158	ගාල්ල	10000.00
12	ටී සමන් ගුණතිලක	සෙ/6Q01276	ගාල්ල	10000.00
13	බීඑම්.එච්.ජී. උපසේන	සෙ/452353	නුවරඑළිය	10000.00
14	එම්ආර්.පී. උදයසිරි	සෙ/402155	පුත්තලම	10000.00
15	පීඑච්.එම්. ගුණරත්න	සෙ/308026	පුත්තලම	10000.00
16	පිකේ.එම්. සුගත්	සෙ/464581	පුත්තලම	10000.00
17	ඩබ්ජී. සෝමසිරි	සෙ/457211	මහනුවර	10000.00
18	ඩබ්එම්. අජිත්	සෙ/312556	මොණරාගල	10000.00

ප්‍රතිලාභීන් සංඛ්‍යාව දිස්ත්‍රික් වශයෙන්

අ.අ.	දිස්ත්‍රික්කය	ප්‍රතිලාභීන් සංඛ්‍යාව
1	අනුරාධපුරය	3
2	අම්පාර	2
3	කළුතර	2
4	කෑගල්ල	1
5	කුරුණෑගල	1
6	රත්නපුර	2
7	කොළඹ	2
8	ගාල්ල	3
9	නුවරඑළිය	1
10	පුත්තලම	3
11	මහනුවර	3
12	මොණරාගල	1



ක්‍රියාන්විත හේතූන් මත රණක්ෂිතයට පත් රණවිරුවන් හදිසි අභාවයන්ට ලක් වන අවස්ථාවන්වල දී මූල්‍ය ආධාර ලබාදීමට අමතරව යුධ හමුදාව හෝ අදාළ සේවාවේ ගෞරව සහිතව අවසන් කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය සම්බන්ධීකරණ කටයුතු ද සිදු කරනු ලැබේ.





රණවිරුවෙකුගේ අවමංගල අවස්ථාවක් සඳහා අවසන් ගෞරව දැක්වීම

7.3. රණවිරු ගම්මානවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන

රණවිරු ගම්මානවල පදිංචිය ආරම්භ කිරීමත් සමඟ රණවිරු පවුල් මුහුණ දෙන ප්‍රධාන ගැටලුවක් වන්නේ යටිතල පහසුකම් සපයා ගැනීමේ දුෂ්කරතාවය යි. ඒ සඳහා මධ්‍යම ආණ්ඩුව සහ ඒ යටතේ වගකිවයුතු ආයතන දැනුවත් කොට අදාළ කටයුතු සිදු කරදීමට මැදිහත්ව ක්‍රියාකරනු ලබයි. එසේ ම ඔවුන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් කණ්ඩායම් හැඟීම වර්ධනය වන පරිදි ප්‍රමුඛතා පදනම මත පළාත් මට්ටමින් ප්‍රජා ශාලා ඉදිකිරීම, සංස්කෘතික මධ්‍යස්ථාන ඇති කිරීම, පුස්තකාල ඇති කිරීම, පාරිසරික මධ්‍යස්ථාන ඇති කිරීම, ප්‍රජා ජල ව්‍යාපෘති, අභ්‍යන්තර මාර්ග නඩත්තුව හා ඉදි කිරීම් ඇතුලු රණවිරු ගම්මානවල අත්‍යවශ්‍ය පහසුකම් සංවර්ධනය කිරීම මෙමගින් සිදු කරයි.

7.3.1.දීප ව්‍යාප්ත රණවිරු ගම්මාන

අ.අ.	ගම්මානයේ නම	ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසය	පදිංචි පවුල් සංඛ්‍යාව
1	සාලාව රණවිරු ගම්මානය	සීතාවක	108
2	පැලෑදගොඩ රණවිරු ගම්මානය	හෝමාගම	50
3	කෑරගල රණවිරු ගම්මානය	දොම්පේ	92
4	වතුපිටිවල රණවිරු ගම්මානය	අත්තනගල්ල	111
5	උඩුපිල රණවිරු ගම්මානය	මහර	57
6	වල්බෝතලේ රණවිරු ගම්මානය	මීරිගම	25
7	හුණුපොළ රණවිරු ගම්මානය	අත්තගල්ල	10
8	නුගේදොලවත්ත රණවිරු ගම්මානය	මීරිගම	38
9	දොඹගොඩ රණවිරු ගම්මානය	හොරණ	101
10	ගල්කැටිය - ක්ලයිඩ් කොටස රණවිරු ගම්මානය	දොඩම්ගොඩ	0
11	කිදෙල්පිටිය මිල්ලැව රණවිරු ගම්මානය	හොරණ	27
12	ගෝවින්න රණවිරු ගම්මානය	බුලත්සිංහල	7
13	කෝපියාවත්ත - දැවිරුගම රණවිරු ගම්මානය	කළුතර	43
14	මිල්ලනිය දාමින්දගමුව රණවිරු ගම්මානය	මිල්ලනිය	9
15	අගලවත්ත රණවිරු ගම්මානය	අගලවත්ත	1
16	යටදොලවත්ත රණවිරු ගම්මානය	මතුගම	1
17	පර්ත් ස්ටේට් රණවිරු ගම්මානය	ඉංගිරිය	19
18	පැපැලියගහලන්ද රණවිරු ගම්මානය	බේරුවල	5
19	කුරුවිට රණවිරු ගම්මානය	කුරුවිට	36
20	කලවාන රණවිරු ගම්මානය	කලවාන	4
21	බලංගොඩ රණවිරු ගම්මානය	බලංගොඩ	10
22	මාබෙල්ටන් වත්ත රණවිරු ගම්මානය	කුලියාපිටිය	8
23	ස්මිලයින් රණවිරු ගම්මානය	පන්නල	10
24	දෙනවරවත්ත රණවිරු ගම්මානය	මාවතගම	10
25	ඩෙන්සිල් කොබ්බෑකඩුව රණවිරු ගම්මානය	අඹන්පොල	10
26	පාන්ගොල්ල රණවිරු ගම්මානය	ඉබ්බාගමුව	99

27	සුන්දරගම රණවිරු ගම්මානය	වාරියපොල	7
28	හලාවත රණවිරු ගම්මානය	හලාවත	11
29	රඹෑව රණවිරු ගම්මානය	රඹෑව	26
30	ගල්නෑව රණවිරු ගම්මානය	ගල්නෑව	44
31	මරදන්කඩවල රණවිරු ගම්මානය	කැකිරාව	34
32	රණජයපුර රණවිරු ගම්මනාය	කැකිරාව	1120
33	පැරකුම්දියබෙදුම-	ඇලහැර	17
34	පල්ලේකැලේ රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	31
35	විරුසහන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	14
36	රණවිරු උයන රණවිරු ගම්මානය	කුණ්ඩසාලේ	30
37	අලුවිහාරය රණවිරු ගම්මානය	මාතලේ	12
38	ජයපුරවිරු- සහන රණවිරු ගම්මානය	නාඋල	10
39	යුධ හමුදා දේශප්‍රේමී (තිලකපුර) ගම්මානය	අම්බලන්ගොඩ	9
40	ලකී විජේරත්න ගම්මානය	අක්මීමණ	24
41	මාපලගම රණවිරු ගම්මානය	නාගොඩ	34
42	වැවහමන්දුව රණවිරු ගම්මානය	මාතර	7
43	ලුණුගම්වෙහෙර රණවිරු ගම්මානය	ලුණුගම්වෙහෙර	36
44	ලුණම රණවිරු ගම්මානය	අම්බලන්තොට	31
45	පෙරහෙට්ටිය රණවිරු ගම්මානය	හාලිඇල	24
46	රණවිරුපුර රණවිරු ගම්මානය	වැල්ලවාය	12
47	හොරොම්බුව රණවිරු ගම්මානය	මොණරාගල	3
48	නවගම්පුර රණවිරු ගම්මානය	අම්පාර	20
49	වෙල්ගම්වෙහෙර රණවිරු ගම්මානය	නගර හා කඩවත් සතර	8

7.4. "හෙළ විරු සුව ධරණී" සුව සායන වැඩසටහන

"හෙළවිරු සුවධරණි සුව සේවා" වැඩසටහන රණක්ෂිතයට පත් රණවිරුවන් හා දිවිපිදූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන්ගේ ශාරීරික හා මානසික සෞඛ්‍ය තත්ත්වය ශක්තිමත් ලෙස ගොඩනැගීම අරමුණු කොට ක්‍රියාත්මක කරනු ලැබේ.

7.4.1. ප්‍රතිලාභ ලබාදීමේ ක්‍රමවේදය

රණවිරු ගම්මාන හා දිවයින පුරා විහිදී ඇති සංසදයන්හි සාමාජිකයන් හට මෙම ආයුර්වේද සායනයන් මගින්

- පෝෂණය හා සෞඛ්‍ය පිළිබඳ දේශන සිදු කිරීම
- දේශීය වෛද්‍ය අමාත්‍යාංශයේ අනුග්‍රහයෙන් ඔසුපැන් ලබාදීම .
- හඳුනාගත් රෝගීන්ගේ නිවෙස් වෙතට වෛද්‍යවරයකු විසින් ත්‍රෛමාසිකව ගොස් ප්‍රතිකාර කිරීමට කටයුතු කිරීම.

මෙම වැඩසටහන මගින් රෝගීන් හඳුනා ගැනීම ඔවුන් සඳහා උපදේශනය හා වෛද්‍ය ප්‍රතිකාර ලබාදීමත් පසුව නිවෙස් වෙතට ගොස් ආබාධිත රණවිරුවන් හට සුවවන තුරු ප්‍රතිකාර කිරීමටත් අපේක්ෂා කෙරේ.

7.4.1.1. හෙළවිරු සුව ධරණී සුව සායන වැඩසටහන - ගම්පහ

ආයුර්වේද දෙපාර්තුමේන්තුව සහ රණවිරු සේවා අධිකාරිය එක්ව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන "හෙළ විරු සුව ධරණී" සුව සායන සුව සේවා වැඩසටහන් මාලාවේ සමාරම්භක උලෙළ නොවැම්බර් මස 10 වැනි දින දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මහතාගේ ප්‍රධානත්වයෙන් කෑරගල රණවිරු ගම්මානයේ දී පවත්වන ලදී. සෞඛ්‍ය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් කුමාරී වීරසේකර මැතිණිය විසින් සභාව අමතමින් මෙම වැඩ සටහනේ වැදගත්කම පැහැදිලි කළ අතර ප්‍රධාන ආරාධිත අමුත්තා වූ දේශීය වෛද්‍ය රාජ්‍ය අමාත්‍ය ගරු සිසිර ජයකොඩි මහතා ද සභාව ඇමතීම සිදු කරන ලදී. මෙම වැඩසටහන සඳහා කෑරගල රණවිරු ගම්මානයේ සහ දොම්පේ රණවිරු සංසදයේ සාමාජිකයන් දෙසීයකට අධික පිරිසක් සහභාගී විය.






7.4.1.2. හෙළවිරු සුව ධරණී සුව සායන වැඩසටහන - බදුල්ල

ආයුර්වේද දෙපාර්තුමේන්තුව සහ රණවිරු සේවා අධිකාරිය එක්ව දීප ව්‍යාප්තව ක්‍රියාත්මක කරනු ලබන "හෙළ විරු සුව ධරණී" සුව සායන සුව සේවා වැඩසටහන් මාලාවේ දෙවන වැඩසටහන ලෙස බදුල්ල දිස්ත්‍රික් වැඩසටහන නොවැම්බර් මස 16 වන දින හාලිඇල සිරි බිම්බාරාම විහාරස්ථානයේදී සාර්ථකව පවත්වන ලදී. දේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී මහත්ම මහත්මීන් විසින් රණවිරු ප්‍රජාව වෙත නීරෝගීමත් ජීවිතයක් ගත කිරීම සඳහා දැනුවත් කිරීමේ දේශනයකින් වැඩසටහන ආරම්භ කරන ලදී. මෙම වැඩසටහන උඹව පළාත් ආයුර්වේද කොමසාරිස් වෛද්‍ය ඩිල්මා ප්‍රේමතිලක මහත්මිය ඇතුලු වෛද්‍ය කාර්ය මණ්ඩලයත් සෙසු නිලධාරීන්ගේත් සම්පත් දායකත්වය මත පවත්වන ලදී.





7.4.1.3. “හෙළවිරු සුව ධරණී” සුව සායන වැඩසටහන - නුවරඑළිය

රණවිරු සේවා අධිකාරිය සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය එක්ව සංවිධානය කරනු ලබන "හෙළවිරු සුව " සුව සායන වැඩසටහනෙහි නුවරඑළිය දිස්ත්‍රික්ක වැඩසටහන 2022.11.17 වන දින හඟුරන්කෙත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී පවත්විණි.

මෙහිදී දේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීතුමිය විසින් බෝ නොවන රෝග නිවාරණය පිළිබඳව රණවිරු ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පවත්වන ලද අතර මෙම වැඩසටහනට සමගාමීව ආබාධිත රණවිරුවන් සඳහා කෘතිම පාද, අත්වාරු, සායනික සපත්තු හා බස්තම් යන සහායක උපකරණ බෙදා දීම ද සිදු කරන ලදී.

මෙම වැඩසටහන සඳහා හඟුරන්කෙත සහකාර ප්‍රාදේශීය ලේකම්තුමා, සහකාර අධ්‍යක්ෂතුමා හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ රණවිරු විෂයභාර නිලධාරීතුමා, හඟුරන්කෙත දේශීය ආයුර්වේද මධ්‍යස්ථානයේ වෛද්‍යතුමිය ඇතුලු වෛද්‍ය කාර්ය මණ්ඩලයත්, රණවිරු සේවා අධිකාරියේ නුවරඑළිය දිස්ත්‍රික් නිලධාරී අජන්තා හේරත් මෙනවිය සහ රණවිරු සංසද සාමාජිකයන් සහභාගි වන ලදී.





"හෙළවිරු සුව ධරණී" සුව සායන නුවරඑළිය දිස්ත්‍රික් වැඩසටහන





7.4.1.4. “හෙළවිරු සුව ධරණී” සුව සායන වැඩසටහන - අනුරාධපුරය

“හෙළවිරු සුව ධරණී” සුව සායන වැඩසටහනෙහි අනුරාධපුර දිස්ත්‍රික්ක ප්‍රථම වැඩසටහන රඹෑව රණවිරු ගම්මානයේ දී 2022.11.18 දින ඉතා සාර්ථකව පවත්වන ලදී. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය අතිරේක ලේකම් චන්දන තිලකරත්න, සංවර්ධන අධ්‍යක්ෂ දයානන්දන්, සහකාර ලේකම් චමල් තේනුවර, අනුරාධපුර ප්‍රජා සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ආනන්ද සමරනායක, ඇතුළු වෛද්‍ය නිලධාරීන් සහභාගි විය. මෙහිදී දේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය අරුණ ඉන්දික මහතා විසින් බෝ නොවන රෝග නිවාරණය පිළිබඳව රණවිරු ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පවත්වන ලදී.

එමෙන්ම මෙම වැඩසටහනට සමගාමීව ආබාධිත රණවිරුවන් සඳහා කෘතිම පාද බෙදා දීම රණවිරු සේවා අධිකාරියේ උතුරු මැද පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ තුෂාර ජයසිංහ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදි. මෙම වැඩසටහන සඳහා අමාත්‍යාංශය විසින් රුපියල් මිලියන 1.8 ක ඖෂධ උතුරු මැද පළාත සඳහා බෙදා දෙනු ලැබීය.





7.4.1.5. “හෙළවිරු සුව ධරණී" සුව සායන වැඩසටහන - ගම්පහ උඩුපිල රණවිරු ගම්මානය

හෙළ විරු සුව ධරණී සුව සේවා ආයුර්වේද සායන වැඩසටහන් මාලාවේ ගම්පහ දිස්ත්‍රික්කයේ දෙවන වැඩසටහන දෙසැම්බර් මස 04 වන දින උඩුපිල රණවිරු ගම්මානයේ විහාරස්ථානයේ දී පවත්වන ලදී.

හෙළ විරු සුව ධරණි" සුව සායන දෙවන අදියර ගම්පහ දිස්ත්‍රික්කයේ කැරගල රණවිරු ගම්මානයේ දී 2022.12.11 වන දින සාර්ථකව පැවත්විණි. ගම්පහ වික්‍රමාරච්චි ආයුර්වේද රෝහලේ වෛද්‍යවරුන් විසින් මෙම වැඩසටහන සාර්ථකව මෙහෙයවන ලදී.





7.4.1.6. “හෙළවිරු සුව ධරණි" සුව සායන වැඩසටහන - ගාල්ල මාපලගම

හෙළවිරු සුව ධරණි දින 2022.12.08 ඵම වැඩසටහනක් ප්‍රසුව සායන වැඩසටහනෙහි ගාල්ල දිස්ත්‍රි " මාපලගම රණවිරු ගම්මානයේදී පවත්වන ලදී. මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ දකුණු පළාත් ආයුර්වේද කොමසාරිස් කරුණා හේවගේ මැතිනිය, ගාල්ල ප්‍රජා සෞඛ්‍ය අධ්‍යක්ෂ වෛද්‍ය ගයානි මංජුලා මනතුංග මැතිනිය, ඇතුලු වෛද්‍ය නිලධාරීන් සහභාගි විය .මෙහි දී දේශීය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී වෛද්‍ය ජගත් විජිතමුල්ල හා ජීද සිල්වා යන මහත්වරුන් විසින් කායික පොෂණය හා .සි.වි. මානසික පොෂණය සම්බන්ධව රණවිරු ප්‍රජාව දැනුවත් කිරීමේ දේශන දෙකක් පවත්වන ලදී.





7.4.1.7. “හෙළවිරු සුව ධරණි" සුව සායන වැඩසටහන - මාතලේ

"හෙළවිරු සුව ධරණි" සුව සායන වැඩසටහනෙහි මාතලේ දිස්ත්‍රික් ප්‍රථම වැඩසටහන සංසද සාමාජිකයන් 130 දෙනෙකුගේ සහභාගීත්වයෙන් 2022.12.14 දින අලුවිහාරය රණවිරු ගම්මානයේ දී හා මාතලේ අලුවිහාරයේ දී පවත්වන ලදී.

රණවිරු සේවා අධිකාරියේ මාතලේ දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරිනි තනූජා දර්ශණී මහත්මියගේ සංවිධානත්වයෙන් පැවති මෙම වැඩසටහන සඳහා මාතලේ ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි නයෝමි සේනානායක මහත්මිය ඇතුලු වෛද්‍යවරුන් තිදෙනෙකුගේ සම්බන්ධ විය.





7.4.1.8. “හෙළවිරු සුව ධරණී" සුව සායන වැඩසටහන - අම්පාර

හෙළවිරු සුව ධරණී සුව සායන වැඩසටහනෙහි අම්පාර දිස්ත්‍රික් වැඩසටහන 2022.12.21 යන දින නවගම්පුර රණවිරු ගම්මානයෙහි ප්‍රජා ශාලාවේදී පවත්වන ලදී.

මේ සඳහා දමන ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි දුල්කා මහත්මිය හා වෛද්‍ය දර්ශිලා මෙනවිය ඇතුලුව කායී මණ්ඩලයෙහි නිලධාරීන් සම්බන්ධ විය.මෙහිදී දේශීය කායික පොෂණය හා මානසික පොෂණය සම්බන්ධව රණවිරු ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පැවැත්විණි.

තව ද මෙයට සමගාමීව පැමිණ සිටි රණවිරු ප්‍රජාව ආයුර්වේද වෛද්‍යවරුන් විසින් පරීක්ෂා කර බලා ප්‍රතිකාර ලබා දුන් අතර මෙම වැඩසටහන සාර්ථක කරගැනීම සඳහා දමන, අම්පාර රණවිරු සංසදයන්හි සාමාජිකයන් 80 කට ආසන්න පිරිසක් සහභාගී වන ලදී.





7.4.1.9. “හෙළවිරු සුව ධරණී” සුව සායන වැඩසටහන - මාතර

"හෙළ විරු සුව ධරණී " මාතර දිස්ත්‍රික්ක වැඩසටහන මාතර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී එච්.එල්.සී ශිරාන් මහතාගේ සංවිධානයෙන් මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී 2022.12.20 දින පවත්වන ලදී.

මේ සඳහා මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහකාර ප්‍රාදේශීය ලේකම් ඩබ්.ජේ.පී අනුර මහතා, මාතර ආයුර්වේද ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී නිශානි හෙන්ද්‍රිවිතාරන මහත්මිය, වෛද්‍ය එන්.ඒ සේනාධීර මහතා, වෛද්‍ය සුජානි කෝදාගොඩ මහත්මිය, වෛද්‍ය බුද්ධිකා ලියනගේ මහත්මිය සහ ආයුර්වේද සංවර්ධන නිලධාරී පි.වී රේණුකා මහත්මිය සම්බන්ධ විය.




7.4.1.10. “හෙළවිරු සුව ධරණී” සුව සායන වැඩසටහන - පුත්තලම

හෙළවිරු සුව ධරණී සුව සායන වැඩසටහනෙහි පුත්තලම දිස්ත්‍රික් වැඩසටහන 2022.12.28 වන දින හලාවත විජයාරාම විහාරස්ථානයේ දී පවත්වන ලදී.

මේ සඳහා ප්‍රජා සෞඛ්‍ය අධීක්ෂණ වෛද්‍ය නිලධාරී නර්මදා දිසානායක, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කුමාරි රාජපක්ෂ මහත්මිය ඇතුලු වෛද්‍යවරුන් කිහිපදෙනෙකු සම්බන්ධ විය. මෙහිදී දේශීය කායික පෝෂණය හා මානසික පෝෂණය සම්බන්ධව රණවිරු ප්‍රජාව දැනුවත් කිරීමේ දේශනයක් පවත්වන ලද අතර මාසිකව මෙම වැඩසටහන් ප්‍රාදේශීය මට්ටමින් සිදු කිරීමට ද සාකච්ඡා විය.




08

රණවිරු අනුස්මරණ වැඩසටහන

8.1. හැඳින්වීම

1999 අංක 54 දරන පාර්ලිමේන්තු පනත මගින් පවරා ඇති රණවිරු සේවා අධිකාරියේ කර්තව්‍ය සාක්ෂාත් කර ගැනීම හා හිතකර සියලු ක්‍රියා හා දේ සිදු කිරීම යටතේ රණවිරුවාගේ නාමය අඛණ්ඩව සුරක්ෂිත කිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. යුද නාවික හා ගුවන් හමුදාවේ මෙන් ම පොලිසියේ සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සේවය කොට රට වෙනුවෙන් දිවිපිදූ දේශප්‍රේමී විරෝදාර රණවිරුවන් හා මාතෘභූමියේ චිරස්ථිතිය උදෙසා තම ශරීරාංග කැප කළ වීර වික්‍රමාන්විත රණවිරුවන් අනුස්මරණය කරමින් ජාතියේ උපහාරය පුදු දීම රණවිරුවාගේ නාමය අඛණ්ඩව සුරක්ෂිත කිරීම මෙන් ම ඔවුන්ගේ සුභසාධන අවශ්‍යතා සපුරාලීම මෙම ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

8.2. ජාතික රණවිරු සැමරුම් මාසය ප්‍රකාශයට පත් කිරීම

රණවිරු සැමරුම් මාසය ප්‍රකාශයට පත් කරමින් ජාතික රණවිරු සැමරුම් කොඩිය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ හත්වන විධායක ජනාධිපති, සේනාධිනායක ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා වෙත පැළඳවීම 2022.05.06 වන දින ජනාධිපති මන්දිරයේ දී සිදු කරන ලදී. රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) විසින් ප්‍රථම රණවිරු සැමරුම් කොඩිය අතිගරු ජනාධිපතිතුමන් වෙත පළඳවනු ලැබීමත් සමඟ රණවිරු සැමරුම් මාසයේ ඇරඹුම සනිටුහන් කරන ලදී.

දශක තුනකට අධික කාලයක් පැවති ත්‍රස්තවාදය නිමාකර නිදහස්, නිවහල් දේශයක් වෙනුවෙන් කැපවූ අභීත රණවිරුවන් අනුස්මරණය කරමින් රණවිරු මාසය සැමරේ. ශ්‍රී ලාංකීය දේශයේ සැබෑ නිදහසේ හිමිකරුවන් අනුස්මරණය කරනු වස් ශ්‍රී ලාංකික පුරවැසියන් වෙත රණවිරු සැමරුම් කොඩිය පිළිගැන්වීම මෙම ව්‍යාපෘතියේ අරමුණයි. එමගින් දේශයේ උත්තරීතර රණවිරුවන් විසින් තම මව්බිමේ භෞමික අඛණ්ඩතාවයත්, ඒකීයභාවයත් සුරැකීම උදෙසා තම ජීවිත පරිත්‍යාගයෙන් සිදු කරන ලද උත්තරීතර කැප කිරීම අනුස්මරණය කරමින් ඔවුන් හට ගෞරව දැක්වීම මෙහි ප්‍රධාන අපේක්ෂාවයි.









2022 වර්ෂයේ රණවිරු කොඩි දිනය සඳහා ත්‍රිවිධ හමුදාව, පොලිසිය සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව විසින් දායකත්වය ලබා දෙන ලදී. සියලුම පළාත් ආණ්ඩුකාරවරුන් ප්‍රමුඛ පළාතේ රාජ්‍ය ආයතනයන් සහ රණවිරු සේවා අධිකාරියේ රණවිරු සංසද සාමාජිකයන්, මහජන බැංකුව, ලංකා බැංකුව, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ සණසු සංවර්ධන බැංකුව මෙම කොඩි සඳහා සම්මාදම් විය.

ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයට අයත් හොරණ, අවිස්සාවේල්ල සීතාවක, මල්වත්ත තිහාරිය, නිට්ටඹුව, වතුපිටිවල සහ කොග්ගල අපනයන සැකසුම් කලාපයන්හි පිහිටා ඇති කර්මාන්ත ශාලාවල අධ්‍යක්ෂවරුන් ඇතුලු කාර්ය මණ්ඩලයේ සාමාජිකයන් සහ කර්මාන්තපුරයේ රැකියාවේ නිරත සේවක සේවිකාවන් විසින් රණවිරු දිනය වෙනුවෙන් රණවිරු කොඩි සඳහා මූල්‍යමය සම්මාදමක් ලබාදෙන ලදී.













8.3. රණවිරු දින සැමරුම් උත්සවය

"13 වන රණවිරු සැමරුම" ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විධායක ජනාධිපති, සේනාධිනායක අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් බත්තරමුල්ල, පාර්ලිමේන්තු සංකීර්ණය අසල රණවිරු ස්මාරකය අභියස දී 2022 මැයි මස 19 වන දින චාම් සහ අභිමානවත් අයුරින් පැවැත්විණ.

දශක තුනක කාලයක් පැවති එල්.ටී.ටී.ඊ ත්‍රස්තවාදය පරාජය කර වීරෝදාර රණවිරුවන් අත්කරගත් යුද විජයග්‍රහණයට 2022 වසරේ දී වසර 13 ක් සපිරේ. එහිදී යුද, නාවික, ගුවන්, පොලිස් සහ සිවිල් ආරක්ෂක බලකායේ වීරෝදාර රණවිරුවන් විසි අට දහසකට (28000) ආසන්න ප්‍රමාණයක් මව්බිමේ නිදහස වෙනුවෙන් දිවි පිදූ අතර රණවිරුවන් විසි හත් දහසකට (27000) අධික පිරිසක් සටනේ දී ආබාධිත තත්ත්වයට පත් විය. ත්‍රිවිධ හමුදා, පොලිස් සහ සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන්ගේ සහභාගිත්වයෙන් මව්බිමේ රණවිරුවන් වෙත ගෞරවය පුදු කිරීම මෙම සැමරුම් උත්සවයේදී සිදු කරන ලදී.

රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) මහතා විසින් අතිගරු ජනාධිපතිතුමන් උත්සව භූමිය වෙත පිළිගනු ලැබීය. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්, ජෙනරල් කමල් ගුණරත්න (විශ්‍රාමික), නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශයේ ලේකම්, මේජර් ජෙනරල් ජගත් අල්විස් (විශ්‍රාමික), ආරක්ෂක මාණ්ඩලික ප්‍රධානී සහ යුද්ධ හමුදාධිපති ජෙනරල් ශවේන්ද්‍ර සිල්වා, නාවික හමුදාපති වයිස් අද්මිරාල් නිශාන්ත උලුගේතැන්න, ගුවන් හමුදාපති එයාර් මාර්ෂල් සුදර්ශන පතිරණ, පොලිස්පති සී.ඩී වික්‍රමරත්න, සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරල් මේජර් ජෙනරල් රන්ජන් ළමාහේවාගේ (විශ්‍රාමික) සහ රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර (විශ්‍රාමික) විසින් රණවිරු ස්මාරකය පාමුල මල්කළඹ තබා මියගිය රණවිරුවන් වෙනුවෙන් උත්තමාචාරය පුදු කළහ.

























8.4. මයිලපිටිය රණවිරු අනුස්මරණ උද්‍යානයේ නඩත්තු හා සංවර්ධන කටයුතු

ශ්‍රී ලංකා භූමිය ත්‍රස්තවාදයෙන් මුදවා ගැනීමේ දී දිවි පිදූ රණවිරුවන් සිහි කරලීම සඳහා ඉදි වූ ශ්‍රී ලංකාවේ පළමු රණවිරු අනුස්මරණ උද්‍යානය මෙය වේ. ආකර්ෂණීය භූමි භාගයක පවත්වා ගෙන යනු ලබන මයිලපිටිය රණවිරු සැමරුම් උද්‍යානය තුළ, දිවි පිදූ සියලුම රණවිරුවන්ගේ නාමයන් ශෛලමය පුවරු මත ප්‍රතිෂ්ඨාපනය කර, රණවිරුවන් අනුස්මරණය කිරීම සඳහා ස්මාරකයක් සහිතව රණවිරු අනුස්මරණ උද්‍යානයක් ඉදි කර ඇත. 2003 වර්ෂයේ දී රණවිරු අනුස්මරණ ජාතික උත්සවය මෙම ස්ථානයේ දී පවත්වන ලදී.

මෙම උද්‍යානයේ ජලය, විදුලිය හා නඩත්තු සඳහා වැය දැරීම් රණවිරු සේවා අධිකාරිය විසින් සිදු කරනු ලබන අතර ආරක්ෂාව හා නඩත්තු කටයුතු සඳහා ශ්‍රී ලංකා යුද හමුදාවේ සහයෝගය ලබා දීම සිදු කරනු ලැබේ.

8.4.1. 2022 වර්ෂය තුළ මයිලපිටිය උද්‍යානයේ නඩත්තු කටයුතු

මයිලපිටිය උද්‍යානයේ ආරක්ෂාව සඳහා ඇති විදුලි ආලෝක පද්ධතිය අලුත් වැඩියාකිරීම.









උද්‍යාන භූමියේ සුරක්ෂිතතාවය සඳහා යුධ හමුදා ශ්‍රම දායකත්වයෙන් ආරක්ෂිතට වැට නවීකරණය කිරීම

09

විශ්‍රාමික රණවිරු සුභසාධක අංශය

9.1. හැඳින්වීම

රට වෙනුවෙන් තම තරුණ ජීවිතය කැප කරමින් විශ්‍රාම යන රණවිරුවන් ඔවුන් ප්‍රගුණ කළ කුසලතාවයන් උපයෝගී කර ගනිමින් රැකියා අවස්ථා සඳහා යොමු කිරීම උදෙසා කෘෂිකාර්මික හා කාර්මික ව්‍යවසායකයින් බවට පත් කිරීම අරමුණු කර ගනිමින් වැඩමුළු, උපදේශන සේවා, පුහුණු සැසි ක්‍රියාත්මක කිරීම මෙම අංශය මගින් සිදු කරයි. දිස්ත්‍රික්ක මට්ටමින් පිහිටුවා ඇති රණවිරු සංසදයන්හි සාමාජිකයන් සහභාගී කරවා ගනිමින් ඔවුන් ව්‍යවසායකයින් ලෙස බල ගැන්වීමට අවැසි මග පෙන්වීම සහ දැනුම ලබා දීම මෙහි මූලික අරමුණ වේ. මේ සඳහා රණවිරු සේවා අධිකාරිය සමග ආරක්ෂක අමාත්‍යාංශය, ත්‍රිවිධ හමුදාව, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව හා ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය අත්වැල් බැඳගෙන ඇත.

9.2. 2022 වසර තුළ කාර්ය සාධනය

අ.අ	දිනය	විස්තරය	දිස්ත්‍රික්කය
1	2022.02.07	පොල් පැළ 7000ක් රණවිරුවන් වෙත බෙදාදීම	සියළුම දිස්ත්‍රික්ක සඳහා
2	2022.02.17	මී මැසි පාලන පුහුණු වැඩසටහන	මාතලේ
3	2022.02.23	කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන	පොළොන්නරුව
4	2022.03.24		අම්පාර
5	2022.03.31		නුවරඑළිය
6	2022.04 26		කොළඹ
7	2022.04.27		කෑගල්ල
8	2022.09.06		කුරුණෑගල
9	2022.10.05		අනුරාධපුර
10	2022.10.14		රත්නපුර
11	2022.11.03		රත්නපුර
12	2022.11.04		රත්නපුර
13	2022.11.30		රත්නපුර
14	2022.12.16		පොළොන්නරුව
15	2022.12.29		කුරුණෑගල
16	2022.03.11	කාබනික වී වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන	රත්නපුර
17	2022.03.25	කිරි ගව පාලනය	අම්පාර

9.2.1. 2022 වර්ෂය තුළ මී මැසි පෙට්ටි බෙදා දීම

අ.අ.	දිනය	දිස්ත්‍රික්කය	රණවිරුවාගේ නම	මී මැසි පෙට්ටි ප්‍රමාණය
1	2022.11.17	කෑගල්ල	ඩී එස් එන් සමන් වත්තගේ	පෙට්ටි 10
2	2022.11.17	ගම්පහ	ඩී ආර් අරුණ කුමාර ජයවර්ධන	පෙට්ටි 15
3	2022.12.14	රත්නපුර	එම් නිමල් රංජිත්	පෙට්ටි 15

9.3. 2022 වර්ෂයේ පවත්වන ලද වැඩසටහන්

9.3.1. මී මැසි පාලන පුහුණු වැඩසටහන - මාතලේ

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සංවිධානත්වයෙන් මාතලේ දිස්ත්‍රික්කය කේන්ද්‍රගත කරමින් සංවිධානය කරන ලද මී මැසි පාලනය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2022 පෙබරවාරි මස 17 වන දින මාතලේ නාලන්දා ගොවිපළේ දී පවත්වන ලදී.

මී මැසි පාලනය සහ ඒ ආශ්‍රිත ව්‍යාපාර අවස්ථාවන් පිළිබඳව දැනුවත් කිරීමේ මෙම විශේෂ වැඩසටහන සඳහා මාතලේ දිස්ත්‍රික්කය නියෝජනය කරමින් රණවිරු සංසදවල සාමාජිකයන් 30ක් පමණ සහභාගී විය. මෙම ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය දේශන සහාය ලබා දීම බිහු සම්පත් සුරකීමේ ආයතනය විසින් සිදු කරන ලදී. ප්‍රායෝගික පුහුණුවකින් අනතුරුව මී මැසි පාලනය සඳහා අවශ්‍ය උපකරණ රණවිරුවන් අතර බෙදා දෙනු ලැබීය. එම අවස්ථාව සඳහා රණවිරු සේවා අධිකාරිය නියෝජනය කරමින් ව්‍යවසාය සංවර්ධන අංශයෙහි ව්‍යාපෘති භාර නිලධාරී ස්කොඩ්‍රන් ලීඩර් පියුමාල් රණසිංහ මහතා සහභාගී විය.





9.3.2. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන පොළොන්නරුව

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සංවිධානයෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ රණක්ෂිතයට පත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල ළඟම ඥාතීන් සඳහා කාබනික වී වගාව තුළින් වැඩි අස්වැන්නක් ලබාගත හැකි සරල තාක්ෂණික ක්‍රම ඇතුළත් ප්‍රායෝගික පුහුණු වැඩසටහන් මාලාවේ පළමු වැඩසටහන මැදිරිගිරිය, බිසෝපුර ගම්මානයේදී 2022.02.23 වන දින පවත්වන ලදී.

කාබනික වී වගාව තුළින් වැඩි අස්වැන්නක් ලබා ගත හැකි සරල තාක්ෂණික ක්‍රම භාවිතා කරමින් කෘෂි කර්මාන්තයේ නියැලී සිටින රණක්ෂිතයට පත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල සාමාජිකයන් දැනුවත් කිරීමේ මෙම වැඩසටහන රණවිරු සේවා අධිකාරියේ සභාපති මේජර් ජෙනරල් නන්දන සේනාධීර මහතාගේ උපදෙස් මත සංවිධානය කරනු ලැබීය.

වස විසෙන් තොර කාබනික ගොවිතැන සඳහා සමාජයට පූර්වාදර්ශයක් ලබාදිය හැකි ව්‍යාපෘතියක් ලෙස ද මෙය ක්‍රියාවට නැංවෙයිදිවයින පුරා විසිරී සිටින යුද්ධයෙන් තුවාල ලැබූ විවිධ වූ අපහසුතාවයන් මත සිටින රණවිරුවන් සමාජ ආදර්ශයක් කොටගෙන අනෙකුත් ගොවි ජනතාවට ද මේ සඳහා සම්බන්ධ වීමේ දිරි ගැන්වීමක් ලෙස මෙම කටයුතු සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන සඳහා අවශ්‍ය සම්පත් දායකත්වය මහවැලි සංවර්ධන අධිකාරිය විසින් ලබා දෙන ලදී. මෙම වැඩසටහන සිදු කිරීම රණවිරු සේවා අධිකාරියේ, ව්‍යවසාය සංවර්ධන අංශයේ, විශේෂ පුහුණු නිලධාරී කෝප්‍රල් සුමිත් කුමාර විසින් මෙහෙයවනු ලබන අතර පළාත් සහ දිස්ත්‍රික් නිලධාරීන්ගේ සහයෝගය ඇතිව රණවිරු සංසද සාමාජිකයන්ගේ සහභාගිත්වයෙන් මෙම වැඩසටහන සිදුකරනු ලබයි.





9.3.3. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - පොළොන්නරුව දිස්ත්‍රික්කය (දියබෙදුම)





9.3.4. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - ඇඹිලිපිටිය

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ සංවිධානයෙන් රත්නපුර දිස්ත්‍රික්කයේ රණක්ෂිතයට පත් රණවිරුවන් සහ ඔවුන්ගේ පවුල්වල ළඟම ඥාතීන් සඳහා සෞභාග්‍යයේ දැක්ම වැඩපිළිවෙළට සමගාමීව කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව හා වී ගොවිතැන නගා සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ දෙවන වැඩසටහන ඇඹිලිපිටිය රණවිරු සංසද ලේකම් එන්.ඩී.එස් සුදර්ශනී මහත්මියගේ නිවසේ දී 2022.10.14 වන දින පැවැත්විණි.

කාබනික පොහොර භාවිතය සහ ගෙවතු වගාව තුළින් වැඩි අස්වැන්නක් ලබාගත හැකි සරල තාක්ෂණික ක්‍රම ඇතුළත් ප්‍රායෝගික පුහුණුවක් ලබාදීම මෙම වැඩසටහන තුළින් සිදු කරන ලදී. වස විසෙන් තොර කාබනික ගොවිතැන සඳහා සමාජයට පූර්වාදර්ශයක් ලබාදිය හැකි ව්‍යාපෘතියක් ලෙස මෙම වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි.

දිවයින පුරා විසිරී සිටින යුද්ධයෙන් තුවාල ලැබූ විවිධ වූ අපහසුතාවයන් මත සිටින රණවිරුවන් සමාජ ආදර්ශයක් කොටගෙන අනෙකුත් ගොවි ජනතාවට ද මේ සඳහා සම්බන්ධ කරවීමේ දිරි ගැන්වීමක් ලෙස මෙම කටයුතු සංවිධානය කරනු ලැබේ.

මෙම වැඩසටහන රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන අංශයේ විශේෂ පුහුණු නිලධාරී කෝප්‍රල් සුමිත් කුමාර විසින් මෙහෙයවනු ලබන අතර අවශ්‍ය සම්පත් දායකත්වය මහවැලි සංවර්ධන අධිකාරිය විසින් ද ලබා දෙයි.

සබරගමුව පළාත් නියෝජ්‍ය අධ්‍යක්ෂ රෝහණ විජේරත්න, රත්නපුර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී, ගයාන් විජේවික්‍රම සහ ඇඹිලිපිටිය, කොළොන්න හා ගොඩකවෙල රණවිරු සංසද සාමාජිකයන් මෙම වැඩසටහන සඳහා සහභාගි විය.





9.3.5. කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - ඇහැලියගොඩ

රණවිරු සේවා අධිකාරියේ ව්‍යවසාය සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ දායකත්වයෙන් ක්‍රියාන්විත රාජකාරියේ දී රණකෂ්ඨිතයට පත් රණවිරුවන් හා සංසද සාමාජිකයන් යොදවා ගනිමින් කාබනික පොහොර භාවිතය,ගෙවතු වගාව හා වී ගොවිතැන නගා සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ තවත් එක් වැඩසටහනක් ඇහැළියගොඩ රණවිරු සංසදයේ ලේකම් ඩබ්. එල්. ඒ සුසන්ත කුමාර මහතාගේ පූර්ණ සංවිධානයෙන් 2022.11.03 වන දින ඇහැලියගොඩ සුමනතිස්සාරාමයේ දී පැවැත්විණි.

මෙම වැඩසටහන සඳහා ඇහැලියගොඩ රණවිරු සංසද සාමාජිකයන් 20 දෙනෙකු පමණ සහභාගි විය. රණවිරු සේවා අධිකාරියේ විශේෂ කෘෂි පුහුණු උපදේශක කෝප්‍රල් සුමිත් කුමාර මහතා හා ඇහැලියගොඩ කලාප කෘෂි නිලධාරී මොහාන් සමරසිරි මහත්මයාගේ සම්පත් දායකත්වයෙන් මෙම වැඩසටහන සාර්ථකව පැවැත්විණි.





9.3.6..කාබනික පොහොර, ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කය (කහවත්ත , නිවිතිගල)





9.3.7. 2022.03.11 වන දින කාබනික වී වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන රත්නපුර දිස්ත්‍රික්කය - ඇඹිලිපිටිය සංසදය





9.3.8. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - අනුරාධපුරය





9.3.9. කාබනික පොහොර හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන අම්පාර දිස්ත්‍රික්කය

රණවිරු සේවා අධිකාරියේ විශ්‍රාමික රණවිරු ව්‍යවසාය සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ දායකත්වයෙන් ක්‍රියාන්විත රාජකාරියේ දී රණක්ෂිතයට පත් රණවිරුවන් හා ඔවුන් ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධ කර ගනිමින් කාබනික පොහොර භාවිතය මගින් ගෙවතු වගාව සහ වී ගොවිතැන නගා සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ සිව්වන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්ක

භාර නිලධාරිනී තරණි නිවර්තිකාගේ සංවිධානයෙන් මහඔය සංසද සාමාජික රණවිරු ඒ.එම් සුමතිපාල මහතාගේ නිවසේ දී 2022.03.24 වන දින පවත්වන ලදී.

රණවිරු සේවා අධිකාරියේ කොප්‍රල් සුමිත් කුමාර සහ මහවැලි අධිකාරියේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය රණවිරු සංසද සාමාජිකයන් 25 දෙනෙකු සහභාගී විය.

රණවිරු සේවා අධිකාරියේ සභාපති විශ්‍රාමික මේජර් ජෙනරල් නන්දන සේනාධීර මහතාගේ සංකල්පයක් මත සිදු කරනු ලබන මෙම වැඩසටහන මගින් විශ්‍රාමික රණක්ෂිතයට පත් රණවිරු ප්‍රජාව දැයේ සංවර්ධනයට දායක කරගනිමින් සමාජයට පූර්වාදර්ශයක් ලබාදීම අපේක්ෂා කෙරේ.





9.3.10. උහන රණවිරු සංසද සාමාජිකයන් සඳහා කාබනික වී ගොවිතැන පිළිබඳ විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහන

රණවිරු සේවා අධිකාරියේ විශ්‍රාමික රණවිරු ව්‍යවසාය සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ දායකත්වයෙන් ක්‍රියාන්විත රාජකාරියේ දී රණක්ෂිතයට පත් රණවිරුවන් හා ඔවුන් ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධ කර ගනිමින් කාබනික පොහොර භාවිතය මගින් ගෙවතු වගාව සහ වී ගොවිතැන නගා සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ තුන්වන වැඩසටහන අම්පාර දිස්ත්‍රික්ක භාර නිලධාරිනී තරණි නිවර්තිකාගේ සංවිධානයෙන් උහන සංසද සාමාජික රණවිරු එල්.සමන් කුමාර මහතාගේ නිවසේ දී 2022 මාර්තු මස 24 වන දින පැවැත්විණි.





රණවිරු සේවා අධිකාරියේ කොප්‍රල් සුමිත් කුමාර සහ මහවැලි අධිකාරියේ නිලධාරීන් ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා අම්පාර දිස්ත්‍රික්කයේ උහන රණවිරු සංසද සාමාජිකයන් 45 දෙනෙකු සහභාගී විය.

9.3.11. කිරි ගව පාලනය පිළිබඳ පුහුණු වැඩමුළුව - අම්පාර දිස්ත්‍රික්කය

අම්පාර දිස්ත්‍රික්කයේ මහඔය රණවිරු සංසදයෙහි සාමාජිකයන්ගේ ඉල්ලීමක් අනුව දැනට කිරිගව පාලනයෙහි නිරත වන රණවිරු සාමාජිකයන් 25 කු සඳහා කිරි ගව පාලනය හා ඒ ආශ්‍රිත තාක්ෂණික දැනුම ලබා දීම පිළිබඳ පුහුණු වැඩසටහනක් 2022 මාර්තු මස 25 වන දින ඒ.එම්. සුමතිපාල මහතාගේ නිවසේදී පැවැත්විණි.

රණවිරු සේවා අධිකාරියේ අම්පාර දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරිනී තරණි නිවර්තිකාගේ සංවිධානයෙන් පැවැත්වූ මෙම වැඩසටහන සඳහා අවශ්‍ය උපදේශාත්මක සහාය මහඔය පශු නිලධාරීතුමිය විසින් ලබා දෙන ලදී.





9.3.12. කාබනික ගොවිතැන පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන - නුවරඑළිය

රණවිරු සේවා අධිකාරියේ විශ්‍රාමික රණවිරු ව්‍යවසාය සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ දායකත්වයෙන් ක්‍රියාන්විත රාජකාරියේ දී රණක්ෂිතයට පත් රණවිරුවන් හා ඔවුන් ගේ පවුල්වල සාමාජිකයන් සම්බන්ධ කර ගනිමින් කාබනික පොහොර භාවිතය, ගෙවතු වගාව සහ වී ගොවිතැන නගා සිටුවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ පස්වන වැඩසටහන නුවරඑළිය දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරිනී අජන්තා හේරත් මෙනවියගේ සංවිධානයෙන් 2022.03.31වන දින නුවරඑළිය දිස්ත්‍රික්කයේ වලපනේ ප්‍රදේශයේ දී පැවැත්විය.

රණවිරු සේවා අධිකාරියේ කොප්‍රල් සුමිත් කුමාර සහ කෘෂිකර්මික දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සම්පත් දායකත්වයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා නුවරඑළිය දිස්ත්‍රික්කයේ රණවිරු සංසද සාමාජිකයන් 30 දෙනෙකු පමණ සහභාගී විය.




9.3.13. කාබනික පොහොර භාවිතය ගෙවතු වගාව සම්බන්ධ පුහුණු වැඩසටහන - කුරුණෑගල දිස්ත්‍රික්කය

රණවිරු සංසද සාමාජිකයන් දිරිගන්වමින් කාබනික පොහොර භාවිතය මගින් ගෙවතු වගාව, වී ගොවිතැන නගා සිටවීමේ දීප ව්‍යාප්ත වැඩසටහන් මාලාවේ තවත් එක් වැඩසටහනක් පන්නල රණවිරු සංසදයේ සභාපතිතුමන්ගේ නිවසේදී 2022.09.26 වන දින පැවැත්විණි.

රණවිරු සේවා අධිකාරියේ විශ්‍රාමික රණවිරු ව්‍යවසාය සංවර්ධන හා විශේෂ ව්‍යාපෘති අංශයේ කොප්‍රල් සුමිත් කුමාර මහතාගේ උපදේශනයෙන් පවත්වන ලද මෙම වැඩසටහන සඳහා පන්නල කලාප කෘෂි නිලධාරීන්ගේ සම්පත් දායකත්වය ලබා දෙන ලදී.

කුරුණෑගල දිස්ත්‍රික් වැඩසටහන් නිලධාරී සත්සර පතිරාජ මහතාගේ සම්බන්ධීකරණයෙන් පැවැත්වූ මෙම වැඩසටහන සඳහා පන්නල සංසද සාමාජිකයන් 20 දෙනෙකු සහභාගි විය.




9.3.14. කාබනික පොහොර භාවිතය හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන - රත්නපුර දිස්ත්‍රික්කය (රත්නපුර නගරය)





9.3.15.කාබනික පොහොර භාවිතය හා ගෙවතු වගාව සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන කුරුණෑගල දිස්ත්‍රික්කය අලව්ව





9.3.16. සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පොල් පැළ 7000ක් රණවිරුවන් වෙත බෙදාදීම





10

මාපිය රැකවරණ ව්‍යාපෘතිය

10.1. හැඳින්වීම

යුද්ධයේ දී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව දිවි පිදූ, අතුරුදහන් හා ආබාධිත තත්ත්වයට පත්ව වෛද්‍ය හේතු මත විශ්‍රාමිකව සිටින රණවිරු සේවා අධිකාරියේ පනත යටතට ගැනෙන රණවිරුවන්ගේ ජීවත්ව සිටින දෙමාපියන් වෙත ගෙවනු ලබන මාපිය රැකවරණ දීමනාව ලෙස රුපියල් 750.00 මසකට වරක් ලබා දීම රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙතින් සිදු කරනු ලබයි. මෙම දීමනාව සඳහා මුදල් බැර කරනු ලබන්නේ ලංකා බැංකුව, මහජන බැංකුව, ජාතික ඉතිරිකිරීමේ බැංකුව සහ ප්‍රාදේශීය සංවර්ධන බැංකුව යන රාජ්‍ය බැංකුවලින් නිකුත් කරනු ලබන මාපිය රැකවරණ ගිණුම් සඳහා පමණි.

පවුලක රණවිරු සාමාජිකයින් කිහිප දෙනෙකු සිටිය ද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රුපියල් 750 ක් බැගිනි. රණවිරු මව හෝ පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වන අතර කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහාම අදාළ බැංකුව වෙත පාස් පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත අදාළ මරණයට පත් අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර මාස 06 කට වරක් දීමනාලාභියා ජීවත්ව සිටින බවට ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කරන ලද ජීවත් වීමේ සහතිකයක් රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ.

10.2. දීමනාව සඳහා සුදුසුකම්

I. යුද්ධයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව මියගිය සහ අතුරුදහන්, ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ දෙමාපියන් වෙත ඉදුරාම ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව වෛද්‍ය හේතූන් මත ආබාධිත විශ්‍රාමික ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන්ගේ දෙමාපියන් වෙත මෙම දීමනාව හිමි ගැන්වේ.

II. රණවිරු දරුවන් කිහිප දෙනෙකු සිටියද ජීවත්වී සිටින රණවිරු මවට සහ පියාට වෙන් වෙන්ව මසකට ලැබෙනුයේ රුපියල් 750.00 ක් බැගිනි.

III. මියගිය රණවිරුවෙකු සහ ජීවත්වන රණවිරු දරුවෙකු සිටි නම්, මියගිය රණවිරුවා වෙනුවෙන් දීමනාව ගෙවනු ලැබේ.

IV. දීමනාලාභියා මාස 06 කට වතාවක් සෑම වසරකම ජුනි 15 සහ දෙසැම්බර් 15 දිනට පෙර ජීවත්ව සිටින බවට සහතිකයක් ග්‍රාම සේවා නිලධාරී විසින් සහතික කිරීමෙන් පසු රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත එවිය යුතු වේ.

IV. මව, පියා ජීවත්වන තුරු පමණක් මෙම දීමනාව හිමි වේ. කිසිවෙකුටත් මෙම දීමනාව පැවරිය නොහැක. මව පියා මියගිය වහා අදාළ බැංකුව වෙත පාස්පොත ආපසු භාරදිය යුතු අතර රණවිරු සේවා අධිකාරියේ මාපිය රැකවරණ අංශය වෙත උක්ත අයගේ මරණ සහතිකයේ පිටපත ලබාදිය යුතුය.

10.2.1. මාපිය රැකවරණ දීමනාව ලබා ගැනීම සඳහා අවශ්‍ය ලියකියවිලි

I. මාපිය රැකවරණ අයදුම්පත් සම්පූර්ණ කිරීම
II. මියගිය රණවිරුවෙකු නම් රණවිරුවාගේ මරණ සහතිකයේ සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඡායා පිටපතක්
III. ඉඳුරාම ත්‍රස්තවාදී ප්‍රහාරයකට ලක්ව වෛද්‍ය හේතූන් මත ආබාධිත විශ්‍රාමික රණවිරුවෙකු නම් රණවිරුවාගේ ආබාධිත ප්‍රතිශත වාර්තාව හෝ සේවය කරන ලද ස්ථානයෙන් ලබාගත් ලිපිය, යු ආ ගි 21 හෝ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද ලිපියේ පිටපතක්)
IV. සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද රණවිරුවාගේ උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක්
V. මව පියාගේ ජාතික හැඳුනුම්පත් පිටපත්
VI. අදාළ බැංකුවෙන් සහතික කරන ලද මාපිය රැකවරණ ගිණුම් පිටපත්

ඉහත සුදුසුකම් සපුරන ලද රණවිරු මව්පියන්ට පහත සඳහන් පිළිවෙලට මාපිය රැකවරණ දීමනාව ගෙවනු ලබයි.

I. රණවිරු දෙමාපියන් විසින් මාසිකව ඉදිරිපත් කරනු ලබන අයදුම්පත් ලිපිකරු විසින් පරීක්ෂා කර රණවිරු සේවා අධිකාරියේ පනතට අයත් ලියකියවිලි සම්පූර්ණ අයදුම්පත පරිගණක ගත කිරීම සඳහා ලබාදෙනු ලබයි.
II. ලියකියවිලි සම්පූර්ණ කරනු ලබන අයදුම්පත් පරිගණක ක්‍රියාකරු විසින් පරිගණක ගත කරනු ලබයි.
III. පරිගණක ගත කරන ලද අයදුම්පත නැවත පරීක්ෂා කිරීම සිදුකරනු ලබයි.
IV. අංශ ප්‍රධානි විසින් දත්ත පද්ධතිය වෙත ඇතුලත් කරන ලද අයදුම්පත හා අදාළ ලියකියවිලි පරීක්ෂා කර සනාථ කරනු ලබයි.
V. අංශ ප්‍රධානි විසින් සභාපතිතුමාගේ අනුමැතිය සඳහා යොමු කරන පරිගණක ගත කරන ලද රණවිරු දත්ත සභාපතිතුමාගේ අනුමැතියෙන් පසු සක්‍රිය ගිණුමක් බවට තහවුරු කරනු ලබයි.

10.2.2. අනුමැතිය ලබා ගන්නා ආකාරය


I. ඉහතින් සඳහන් ආකාරයට රණවිරු දෙමාපිය අයදුම්පත් පරිගණක ගත කිරීමේ ක්‍රියවලියෙන් පසු පහත සඳහන් ආකාරයට මාපිය රැකවරණ ව්‍යාපෘතිය මාසිකව බැරකිරීම සඳහා බැංකු වවුචරය මගින් අනුමැතිය ලබාගනු ලබයි.

II. අංශ ප්‍රධානි විසින් ගෙවීම් සාරාංශය සභාපතිතුමා හෝ අධ්‍යක්ෂකතුමා වෙත ඉදිරිපත් කරනු ලබයි.


III. සභාපතිතුමා හෝ අධ්‍යක්ෂකතුමා විසින් ඒ සඳහා අනුමැතිය ලබා දීම සිදු කරනු ලබයි.

IV. ගෙවීම් තහවුරු කිරීමෙන් පසු සහකාර අධ්‍යක්ෂක (මූල්‍ය) විසින් මාසික මාපිය රැකවරණ දීමනාව බැංකු ගත කිරීමේ කටයුතු සිදුකරනු ලබයි.

10.3. 2022 වර්ෂය තුළ මුදල් බැර කිරීම



10.4. 2022 වර්ෂය තුළ ප්‍රතිලාභීන් සංඛ්‍යාව




11

විරුසර වරප්‍රසාද කාඩ්පත් අංශය

11.1. විරුසර වරප්‍රසාද කාඩ්පත් ව්‍යාපෘතියේ අරමුණ

ශ්‍රී ලංකාවේ ස්වෛරීභාවය සහ භෞමික අඛණ්ඩතාවය ගොඩනැගීම වෙනුවෙන් ක්‍රියාන්විත රාජකාරියේ යෙදී සිටියදී ජීවිත පූජා කළ සහ ආබාධිත වූ ත්‍රිවිධ හමුදාව, පොලිසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රණවිරුවන් සහ ඔවුන්ගේ ළඟම ඥාතීන්ගේ සුභසාධනය ඉහළ නැංවීමේ රාජ්‍ය ප්‍රතිපත්තිය අනුව ආරක්ෂක අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ රණවිරු සේවා අධිකාරිය වෙතින් ඉහත කී රණවිරුවන් වෙනුවෙන් නිසි ගෞරවයක් ලබාදීම හා එම කටයුතු ප්‍රමුඛතාවය මත ඉටු කර ගැනීමේ මෙහෙවරක් වශයෙන් "විරුසර වරප්‍රසාද කාඩ්පත" පිරිනමනු ලබයි.





11.2. විරුසර කාඩ්පත පිරිනැමීමේ අදියර

පළමු අදියර - යුද්මය කාලසීමාව තුළ ත්‍රිවිධ හමුදාව, පොලිස් දෙපාර්තුමේන්තුව ඇතුලු සිවිල් ආරක්ෂක බලකායේ සේවයේ යෙදී සිටියදී ක්‍රියාන්විතයේදී ජීවිත පරිත්‍යාග කළ සහ අතුරුදහන් වූ රණවිරුවන්ගේ ළඟම ඥාතීන් හෝ භාරකරු වෙත හා ක්‍රියාන්විතයේ දී ආබාධිත තත්ත්වයට පත් රණවිරුවන්ගේ සුභසාධනය උදෙසා පළමු අදියර ක්‍රියාත්මක වේ. කාඩ්පත ලබාගැනීමේදී රණවිරු සංසද හරහා දිස්ත්‍රික්ක භාර නිලධාරී මගින් රණවිරු සේවා අධිකාරිය වෙත ඉදිරිපත් කර හෝ රණවිරු සේවා අධිකාරිය වෙත පැමිණ ලබාගත හැක.

දෙවන අදියර - 1983 වර්ෂයේ සිට 2009 වර්ෂය දක්වා ත්‍රිවිධ හමුදාව, ශ්‍රී ලංකා පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව තුළ යහපත් පැවැත්මෙන් යුතුව සේවය කර විශ්‍රාම ගිය හා එම වකවානුව ඇතුළත ත්‍රිවිධ හමුදාවට පොලීසියට හා සිවිල් ආරක්ෂක බලකායට බැඳී තව දුරටත් සේවයේ යෙදී සිටින සියලුම රණවිරුවන්ට හා ඉහත කාල සීමාව තුළ දී ත්‍රිවිධ හමුදාව, පොලීසිය හා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ රාජකාරියේ යෙදී සිටියදී මියගිය, අතුරුදහන් හා ආබාධිත සිවිල් සේවක මහතුන් ඇතුළුව නිලධාරීන් සඳහා නියමිත වසර 20 ක හෝ සෙසු නිලයින් සඳහා නියමිත වසර 22 ක්, කාන්තා අයවලුන් හට වසර 15 ක සේවා කාලය සපුරා දැනට විශ්‍රාම ගොස් සිටින හෝ සේවයේ යෙදී සිටින රණවිරුවන් විරුසර කාඩ්පත පිරිනමනු ලබයි. කාඩ්පත ලබාගැනීමේ දී ඒකක, රෙජිමේන්තු හා අදාළ හමුදාවන්හි සුභසාධන අංශ හරහා රණවිරු සේවා අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතුය.

11.3. 2022 ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති විරුසර වරප්‍රසාද කාඩ්පත් ප්‍රමාණය

අ.අ	අදියර	යුධ හමුදාව	නාවික හමුදාව	ගුවන් හමුදාව	පොලිසිය	එකතුව
1	1 අදියර	202	6	4	6	218
2	2 අදියර	159	468	48	3	678
එකතුව		361	474	52	9	896

11.4. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද පිරිනමන ආයතන

අ.අ.	ක්ෂේත්‍රය	ආයතනය
1	සන්නිවේදන ආයතන	ලංකා බෙල් ආයතනය
		ටෙලිකොම් ආයතනය
2	අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන	ජයසේකර කලමනාකරණ මධ්‍යස්ථානය (JMC)
		ACBT ඕස්ටේලියානු ව්‍යාපාර
		කාර්මික තාක්ෂන ආයතනය (ITI)
3	පාරිභෝගික ආයතන	මල්පියලි පබ්ලිකේෂන් ආයතනය
		අබාන්ස් ආයතනය
		සොනෙම්රෝ ජුවල්ර්ස්
4	සෞඛ්‍ය ආයතන	ආසිරි සර්ජිකල් රෝහල
		නවලෝක රෝහල
		බෝවත්ත බෙහෙත් ශාලාව
		ඒඒ සමරසිංහ ඔප්ටිකල්ස්
		අත්තනායක ඔප්ටිකල්ස්
5	ප්‍රවාහන	ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව
		ශ්‍රී ලංකා ප්‍රවාහන අමාත්‍යාංශය
		ශ්‍රී ලංකන් එයාර් ලයින් ගුවන් සේවය
6	රාජ්‍ය හා පෞද්ගලික බැංකු	මහජන බැංකුව


11.5. විරුසර කාඩ්පත සඳහා වරප්‍රසාද ලබාදෙනු ලබන/ ඉදිරියට පවත්වාගැනීම සඳහා මේ වනවිට ලිපි ඉදිරිපත් කර ඇති ආයතන

අ.අ.	ක්ෂේත්‍රය	ආයතනය
1	මූල්‍ය හා කල්බදු ආයතන	සිඩිබි ෆිනෑන්ස් පුද්ගලික සමාගම (CDB)
		ලංකා රක්ෂණ ආයතනය
		කොන්ටිනේටල් ඉන්ෂුවරන්ස්
	අධ්‍යාපන හා වෘත්තීය පුහුණු ආයතන	CIPM ආයතනය
		කාර්මික අධ්‍යාපන හා පුහුණු කිරීමේ ආයතනය

2		වෘත්තීය පුහුණු අධිකාරිය
		විජය ග්‍රැෆික්ස් පුද්ගලික සමාගම
		ජාතික ව්‍යාපාර හා කළමණාකරන ආය(NIBM)
		ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනය (SLIIT)
		හෙක්ටර් කොබ්බැකඩුව ගොවි කටයුතු පර්යේෂන
3	පාරිභෝගික ආයතන	කැන්ඩි ආයතනය
		කැලණි කේබල්ස් (පීඑල්සී), ආයතනය
		දම්රෝ ආයතනය
		කාගිල්ස් ෆුට්සිටි
		සිංගර් ශ්‍රී ලංකා සමාගම
		ලිට්රෝ ගෑස් ආයතනය
		විජය සමූහ ව්‍යාපාරය (CIB)
		පැෂන් බග්
		ටොයෝටා ආයතනය
		සොෆ්ලොජික් පුද්ගලික සමාගම
		DSI ආයතනය
		රාජ්‍ය දැව සංස්ථාව
		ඩේවිඩ් පිරිස් සමාගම
		යුනියන් හාඩ්වෙයාර්
4	සෞඛ්‍ය ආයතන	ඖෂධ නිතිගත සංස්ථාව
		ඩර්ඩන්ස් රෝහල
		නයින්වෙල්ස්

11.6. 2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා මුද්‍රණය කර ඇති කාඩ්පත් ප්‍රමාණය

අ.අ.	මාසය	යුද හමුදාව	නාවික හමුදාව	පොලිසිය	ගුවන් හමුදාව	එකතුව
1	ජනවාරි	29	1			30
2	පෙබරවාරි	23				23
3	මාර්තු	20	1			21
4	අප්‍රේල්	70	1	2	3	76
5	මැයි	35		1		36
6	ජුනි	14	1	1		19
7	ජුලි	18			6	24
8	අගෝස්තු	18	2			20
9	සැප්තැම්බර්	26	6			32
10	ඔක්තෝබර්	29	209	44	1	283
11	නොවැම්බර්	53	203	3		259
12	දෙසැම්බර්	26	49	1		76
එකතුව		361	473	52	10	896


2022 වර්ෂයේ ජනවාරි මස සිට දෙසැම්බර් මස දක්වා කාඩ්පත් මුද්‍රණය කිරීම
29
1
23
20
1
70
1
3
2
35
1
14
1
1
18
6
18
2
26
6
29
209
1
44
53
203
3
26
49
1
ජනවාරි
පෙබරවාරි
මාර්තු
අප්‍රේල්
මැයි
ජූනි
ජූලි
අගෝස්තු
සැප්තැම්බර්
ඔක්තෝබර්
නොවැම්බර්
දෙසැම්බර්
යුද හමුදාව
නාවික හමුදාව
ගුවන් හමුදාව
පොලිස් දෙපාර්තුමේන්තුව

විගණකාධිපති වාර්තාව

2022

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } ඩී්එන්/ඩී/ආර්එස්ඒ/22/4 ඔබේ අංකය / உமது இல. / Your No. } දිනය / திகதி / Date } 2023 මැයි 19 දින

සභාපති

රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රණවිරු සේවා අධිකාරියේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන තුලින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිලිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

i. 2019 වර්ෂයේදී තහවුරු කිරීම මත ගෙවීමට යටත්ව හඳුනාගත් ගිණුම් 3917කින් ප්‍රවර්ථන වර්ෂය අවසානයට මාපිය රැකවරණ දීමනා ලබන ගිණුම් 1800ක් පැවතුණි. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අංක 1 හි 129(ඇ) (I) අනුව ඒ සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් කර නොතිබුණි.

ii. රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිත අංක 07 හි 13 ඡේදය අනුව දේපල පිරියත හා උපකරණ ඒවායෙහි සමාන ස්වභාවය හෝ ක්‍රියාකාරීත්වය සමාන බව පදනම් කරගෙන කාණ්ඩ කර දැක්විය යුතු වුවද ඉඩම් හා ගොඩනැගිලි දේපල පිරියත වලින් වෙන්ව හඳුනාගෙන නිබුණි.

iii. 2011 වසරේදී රණවිරු සේවා අධිකාරියෙන් ඉල්ලා අස්වන ලද පරිගණක සහකාර නිළධාරිණියකගෙන් අය විය යුතු රු. 530,380 ක මුදල අය කර ගැනීම සඳහා නීතිපති දෙපාර්තමේන්තුව මගින් නඩුවක් ගොනු කර ඇති අතර ඒ පිළිබඳ රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 8 හි පරිශිෂ්ඨ (ආ) අනුව අවශ්‍ය හෙලිදරව් කිරීම් කර නොතිබුණි.

iv. මූල්‍ය ප්‍රකාශන තුල භාණ්ඩාගාර බිල්පත් මත පොලී ආදායම රු.5,372,849 ක් වශයෙන් හඳුනාගෙන ඇතත් භාණ්ඩාගාර බිල්පත් මත සඳහන් පොලී අනුපාතය මත ගණනය කල විට එහි සත්‍ය පොලී වටිනාකම රු.3,770,210 ක් වූයෙන් 2022 වර්ෂයේ භාණ්ඩාගාර බිල්පත් ආයෝජන ආදායම සහ ආයෝජන වත්කම රු. 1,602,639 කින් වැඩියෙන් දක්වා නිබුණි.

v. එකතුව රු.56,255,315 ක්වූ ජර්නල් සටහන්වල නිවැරදිතාවය පිළිබඳව ගණකාධිකාරි විසින් සහතික කර නොතිබූ අතර ජර්නල් වවුචර්ද පිළියෙල කර නොතිබුණි. එසේම GG-1298 දරන කැබ් රථය විකිණීම සඳහා වාහන ගිණුමෙන් රු.300,000 ක වටිනාකම ඉවත් කිරීම සහ සමුච්චිත ක්ෂය වෙන් කිරීමේ ගිණුමෙන් රු. 155,342 ක වටිනාකම වාහන ඉවත්කිරීමේ ගිණුමට මාරු කිරීමට අදාල ජ'නල් සටහන් පිළියෙල කර නොතිබුණි.

vi. අධිකාරිය විසින් 2022 ජුනි මස 29 වන දින සිට අංක 2596001000636707 දරණ ස්ථාවර තැන්පතුවක් මහජන බැංකුවේ ආරම්භ කර පවත්වා ගෙන යනු ලබන අතර එහි තැන්පතු පොළී ආදායම ගණනය කිරීමේදී රු.396,364 ක් අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව ලැබිය යුතු පොලී ජංගම වත්කමද රු.396,364 කින් අඩුවෙන් දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

අධිකාරියේ 2022 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් නවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම් කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට අධිකාරිය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණයන් හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති/විධානයට යොමුව	නිරීක්ෂණය
(අ) රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුවේ අංක PED/12 චක්‍රලේඛයේ 9.12 වගන්තිය	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අනුමැතියක් ලබා නොගෙන අග්‍රහාර රක්ෂණ වාරිකයේ අර්ධයක වැය බර ලෙස රු.131,000 ක් අධිකාරිය විසින් වැය කර තිබුණි.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

i. 2014 වර්ෂයේදී නිළධාරීන් දෙදෙනකු විසින් ලබා ගන්නා ලද රු 1,830,450 ක අත්තිකාරම් මුදල් සමාලෝචිත වර්ෂය අවසන් වන තුරුත් පියවා නොතිබුණි. ඒ සඳහා අදාල නිලධාරීන්ට විරුද්ධව විනය පරීක්ෂණ සිදුකර එම දෙදෙනාම නිවැරදි කරුවන්වීම හේතුවෙන් මෙම ගෙවීම් සම්බන්ධයෙන් වගකිව යුතු අය හඳුනාගෙන නොතිබුණි.

ii. 2001 වර්ෂයේදී අධිකාරිය වෙත නිවාස ඉදිකිරීම සඳහා පරිත්‍යාග වශයෙන් ලැබුණු කිරලමැදකුඹුර යනුවෙන් හඳුන්වන අක්කර 1 රූඩ් 1 පර්චස් 09 ක් රු.1,500,000 කට තක්සේරු කර තිබුණු ඉඩමක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

iii. නිවාස ණය, ස්වයං රැකියා ණය, වෛද්‍ය ණය හා කුසලතා ණය ලබාදීම් පිළිබඳව කේවල ණය ගිණුම් ශේෂ පරීක්ෂා කිරීමේදී ණය වාරික 5 ත් 26 ත් අතර රු.2,527,509 ක් වටිනා හිඟ ණය වාරික මුදල් තිබුණි.

iv. සන්නද්ධ හමුදාවල හා පොලිසියේ යුධමය ක්‍රියාන්විතයේදී ආබාධිත, මියගිය හෝ සොයා ගත නොහැකිව සිටින පුද්ගලයින් හා ඔවුන්ගේ පවුල්වල යැපෙන්නන්ගේ සුභසාධනය ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් අධිකාරිය පිහිටුවා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ආබාධිත,

අතුරුදහන්වූවන් සහ මියගිය හෝ ඔවුන්ගේ යැපෙන්නන් පිළිබඳව විධිමත් හා නිවැරදි තොරතුරු පද්ධතියක් යාවත්කාලීනව පවත්වා ගෙන යාමට අධිකාරිය අපොහොසත් වී තිබුණි.

v. අධිකාරිය මගින් ක්‍රියාත්මක කරන විරුසර කාඩ්පත් සඳහා ආරක්ෂක අංශ, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය හා වෙනත් පෞද්ගලික ආයතන වලින් 2016 වර්ෂයේදී ලද රු.25,366,500 ක මුදලින් රු.3,607,941 ක මුදලක් 2018 දෙසැම්බර් 31 දින සිට උපයෝජනයකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

vi. 2014 වර්ෂයේදී අධිකාරියේ ප්‍රධාන කාර්යාලයෙහි සිදුකරන ලද ක්ලැඩින් සවිකිරීම වෙනුවෙන් ටී.සී.අයි. (T.C.I Enterprises Pvt Ltd) ආයතනයෙන් රදවා ගන්නා ලද රු.224,063 ක මුදල ප්‍රවර්ථන වර්ෂය අවසන් වන තුරුත් නිදහස් කර නොතිබුණු අතර 2014 වසරේ රු.4,481,269 ක් වූ එම ගණුදෙනුව මත තිබූ අක්‍රමිකතා පිළිබඳ විමර්ශනයක් සිදුකර නොතිබුණි.

vii. අධිකාරියෙහි අනුමත සේවක මණ්ඩලය (සභාපති සහ උප සභාපති නොමැතිව) 89 දෙනෙක් වුවද 2022 දෙසැම්බර් 31 දිනට තත්‍ය සේවක මණ්ඩලයේ සිවිල් නිළධාරීන් 64 දෙනෙකු හා ආරක්ෂක අංශ සාමාජිකයන් 56 ක් ලෙස සමස්ථ කාර්ය මණ්ඩලය 120ක් වූයෙන් 31 දෙනෙකුගේ අතිරික්ත කාර්ය මණ්ඩලයක් පැවතුණි.

viii. 194 වන කළමණාකරන රැස්වීමෙහිදී ගන්නා ලද තීරණය අනුව මුදල් ආයෝජනය කිරීමට ප්‍රථම කළමණාකරන මණ්ඩලයෙන් අනුමැතිය ලබාගත යුතු වුවත් 2022 දෙසැම්බර් 22 දින මහජන බැංකුවේ ආරම්භ කරන ලද රු.7,250,000 ක් වටිනා ස්ථාවර තැන්පතුව සඳහා 2023 මාර්තු 15 දින වන විටත් අදාල අනුමැතිය ලබාගෙන නොතිබුණි.

ix. ජාතික ලොතරැයි මණ්ඩලයේ සුපිරි වාසනා සම්පත හා හදහන ලොතරැයි ආදායමෙන් සියයට 10 ක් අධිකාරිය වෙත භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව හරහා සෑම මසකම ලබා දී තිබුණි. එහෙත් 2022 වර්ෂයට අදාළව අධිකාරියේ ලොතරැයි ආදායම රු.129,826,112 ක් වුවත්, අධිකාරිය වෙත 2022 දෙසැම්බර් 31 දිනට ලැබී තිබුණේ රු.10,193,960 ක් පමණි. ඒ අනුව රු.119,632,152 ක් භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්මේන්තුවෙන් ලැබිය යුතුව පැවතුණි.

x. අධිකාරිය විසින් පවත්වාගෙන යනු ලබන පොත්පත් හා ලේඛනවලට අනුව වර්ෂය තුලදී ආබාධිත රණවිරුවන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන් වෙත විවිධ සැත්කම් සඳහා වෛද්‍ය ආධාර ලෙස රු.1,870,770 ක මුදලක් පුද්ගලයන් 18 දෙනෙකු වෙත ගෙවා තිබුණි. මෙම ආධාර මුදල් වෛද්‍ය පහසුකම් සපයන ආයතනයට ගෙවීමේ ක්‍රමවේදයකින් තොරව අදාල පුද්ගලයන් වෙත සෘජුවම ලබාදී තිබුණි. ඒ පිළිබඳ පසු විපරමක් සිදු කර නොතිබුණු බැවින් ගෙවන ලද ආධාර මුදල් අදාල කාරණය සඳහා යොදවා ගෙන තිබුණු බවට විගණනයේදී තහවුරු නොවුණි.

xi. 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලද අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය ඒකාබද්ධව ක්‍රියාත්මක කරන ලද විරුසුමිතුරු නිවාස ව්‍යාපෘතිය යටතේ පූර්ණ නිවාස 1950 ක් සහ අර්ධ නිවාස 1700 ක් වැඩ අවසන් කිරීම වෙනුවෙන් රු.මිලියන 3192 ක් වෙන් කර තිබුණි. මෙම ව්‍යාපෘතිය 2019 වර්ෂයේ වැඩ අවසන් කිරීමට නියමිත වුවත් එය 2022 දක්වා දීර්ඝ කර තිබුණි . ඒ අනුව 2022 දෙසැම්බර් 31 වන විට මුළු ව්‍යාපෘති මුදලින් රු.මිලියන 2156.9 ක් ඉතිරිව තිබුණි. ව්‍යාපෘතියේ එක් වාරිකයක් හෝ ගෙවීම ආරම්භ කර ඇති සම්පූර්ණ නිවාස ගණන 1496 ක් විය. ඒ අනුව 2022 වර්ෂය අවසන් වන විටත් අපේක්ෂිත නිවාස ඉලක්කයෙන් සියයට 40 කට පමණ අර්ධ වශයෙන් හා සම්පූර්ණ වශයෙන් ආධාර ලබාදී ඇති ප්‍රතිලාභීන් ගණන 550 ක් වූයෙන් එය සම්පූර්ණ ව්‍යාපෘතියෙන් සියයට 15 ක් විය. තවද 2019 වර්ෂයේ ව්‍යාපෘතිය ආරම්භයේදී ආධාරලාභීන් 6 දෙනෙකුට ලබාදුන් රු.865,000 ක මුදලක් විවිධ ගැටළුකාරී තත්ත්වයන් නිසා නැවත එය අය කර ගත යුතු වුවත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගෙන නොතිබුණි.

xii. 2011 වර්ෂයේදී ඉන්දියානු ණය යෝජනා ක්‍රමයක් යටතේ ලැබී තිබුණු අංක PR-0612 දරන සිංගල් කැබ් රථය ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් නමින් ලියාපදිංචිය සිදුකර අධිකාරිය වෙත ලබා දී තිබුණි. නමුත් 2022 දෙසැම්බර් 31 දින වන විටත් මෙම කැබ්රථයේ අයිතිය අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.

xiii. අධිකාරියේ ප්‍රධාන වියදම් අයිතමය ලෙස නිරීක්ෂණය වන ව්‍යාපෘති වියදම තුල ඇතුලත් විවිධ වූ උප ව්‍යාපෘති සඳහා වැය කරන වියදම් ඇස්තමේන්තුවක් සකස් කර නොතිබුණි. එම තත්ත්වය වියදම් කලමනාකරණයට බාධාවක් විය.

ඩබ්ලිව්. පි. සී. වික්‍රමරත්න
විගණකාධිපති

අවසන් මූල්‍ය ප්‍රකාශනය

2022

රණවිරු සේවා අධිකාරිය
2022-12- 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

	සටහන්	2022		2021	
		රු.ශත	රු.ශත	රු.ශත	රු.ශත
වත්කම්					
ජංගම වත්කම්					
මුදල් හා මුදල් සමාන දෑ	1		204,336,322.46		399,031,893.73
තැන්පතු	2		595,788.13		360,141.38
කලින් ගෙවීම්	3		423,291.76		245,588.64
ලැබිය යුතු ණය හා පොළී අඩුකලා	4	468,304,556.56		375,923,932.48	
අඩමාණ ණය වෙන් කිරීම		3,295,210.90	465,009,345.66	3,453,523.50	372,470,409.97
ලිපි ද්‍රව්‍ය තොග	5		1,525,891.90		1,105,305.40
එකතුව	01		**671,890,639.91**		**773,213,339.12**
ජංගම නොවන වත්කම්					
ස්ථාවර තැන්පතු	6		100,250,000.00		28,000,000.00
දේපල පිරියත හා උපකරණ	7		43,627,769.17		52,447,090.82
ඉඩම් හා ගොඩනැගිලි	8		270,350,780.60		288,891,836.33
එකතුව	02		414,228,549.77		369,338,927.14
මුළු වත්කම් (03=01+02)			**1,086,119,189.68**		**1,142,552,266.26**
බැරකම්					
ජංගම බැරකම්	9		9,696,959.29		148,918,190.50
එකතුව	04		9,696,959.29		148,918,190.50
ජංගම නොවන බැරකම්	10		302,338,443.27		318,854,777.00
එකතුව	05		302,338,443.27		318,854,777.00
මුළු බැරකම් (06=04+05)			312,035,402.56		467,772,967.50
ශුද්ධ වත්කම් (03-06)			**774,083,787.12**		**674,779,298.76**
ශුද්ධ වත්කම් / ස්කන්ධය(03-06)					
රණවිරු දුදරු සුවසෙත අරමුදල			61,960.00		61,960.00
සේවක ණය චක්‍රීය අරමුදල			12,117,951.20		11,634,909.42
ප්‍රත්‍යාගණන සංචිතය			119,887,134.74		119,887,134.74
සමුච්චිත අතිරික්තය/(ඌනතාවය)			642,016,741.18		543,195,294.59
මුළු ශුද්ධ වත්කම් / ස්කන්ධය(01+02-06)			774,083,787.12		674,779,298.75

ඉහත මූල්‍ය තත්ව ප්‍රකාශනය අංක 02 සිට 29 දක්වා පිටුවල සඳහන් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් වල ගැලපීම් සමග කියවිය යුතුය.

කළමනාකරණ මණ්ඩලයේ උපදෙස් පරිදි පිළියෙල කරන ලද මෙම මූල්‍ය ප්‍රකාශනය ඉදිරිපත් කිරීමේ වගකීම කළමනාකරණ මණ්ඩලය විසින් භාරගන්නා ලදී. කළමනාකරණ මණ්ඩලය වෙනුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන අත්සන් කිරීමේ හා නිකුත් කිරීමේ අධිකාරී බලය සභාපතිතුමා, උප සභාපතිතුමිය හා සහකාර අධ්‍යක්ෂ මූල්‍ය වෙත 2023.02.23 දින ලබාදෙන ලදී.

හර්ෂි ද සිල්වා
සහකාර අධ්‍යක්ෂ මූල්‍ය
රණවිරු සේවා අධිකාරිය

මේජර් ජේනරාල් නන්දන සේනාධීර (විශ්‍රාමික)
ඩබ්ඩබ්වී ආර්ඩබ්පී ආර්එස්පී විඑස්වී යූඑස්පී එන්ඩියු
සභාපති
රණවිරු සේවා අධිකාරිය

එස්.එල්.කෝවටෙගොඩ
උප සභාපතිනිය
රණවිරු සේවා අධිකාරිය

රණවිරු සේවා අධිකාරිය
20212.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

	සටහන්	2022 රු.ශත	2021 රු.ශත
ආදායම්			
රජයේ දායකය (පුනරාවර්ථන)	11	390,270,533.32	597,146,017.40
සුපිරි වාසනා සම්පත ලොතරැයි ආදායම් *		129,826,112.00	20,114,780.00
පොළී ආදායම්	12	39,373,156.19	9,597,390.52
සේවක ණය පොළී ආදායම්		483,313.98	446,571.69
සේවා ගාස්තු	13	13,557,958.24	7,709,826.11
රණවිරු කොඩි අලෙවි ආදායම්	14	10,608,326.09	833,110.00
පරිත්‍යාග	15	1,944,000.00	5,448,395.00
වෙනත් ලැබීම්	16	316,126.24	351,507.11
මුළු ආදායම් **(01)**		**586,379,526.06**	**641,647,597.83**
වියදම්			
පුද්ගල පඩිනඩි	17	59,133,275.16	54,385,152.13
ගමන් වියදම්	18	722,736.90	270,422.08
සැපයීම්	19	9,686,994.84	3,826,009.00
නඩත්තු වියදම්	20	5,324,609.63	5,961,877.49
ගිවිසුම්ගත සේවා	21	8,937,032.28	8,433,742.88
වෙනත් පුනරාවර්ථන වියදම්	22	3,632,481.15	2,094,807.23
ව්‍යාපෘති මෙහෙයුම්	23	362,121,089.46	533,408,587.61
ක්ෂය කිරීම්		14,843,661.56	11,079,733.44
මූල්‍ය වියදම්	24	4,950.00	2,340,967.87
මුළු වියදම් **(02)**		464,406,830.98	621,801,299.73
කාලපරිච්ඡේදයේ මුළු අතිරික්තය/(ඌනතාවය) (01-02)		**121,972,695.08**	**19,846,298.10**

* 2022 වර්ෂයේ ලොතරැයි ආදායම් හේතුවෙන් මූල්‍ය කාර්ය සාධන වාර්තාවෙහි අතිරික්තය ඉහළ අගයක් ගෙන ඇති අතර මෙම වර්ෂයට අදාළව ලැබිය යුතු ලොතරැයි ආදායම් රු: 119,632,152.00 වේ.

රණවිරු සේවා අධිකාරිය
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන්	2022 රු.ශත	2021 රු.ශත
